# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# අටවැනි පාර්ලිමේන්තුවේ
# (පළමුවැනි සැසිවාරය)

## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 99

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ

පළමු වාර්තාව
(2016.01.01 සිට 2016.04.07 දක්වා)

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති
**ගරු ලසන්ත අලගියවන්න මහතා**
විසින්
2016 ක් වූ සැප්තැම්බර් මස 22 වැනි දින
ඉදිරිපත් කරන ලදි.

*මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් 2016 සැප්තැම්බර් මස 22 වැනි දින නියම කරන ලදි.*

අටවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය

## **රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය**

ගරු ලසන්ත අලගියවන්න මහතා (සභාපති)
ගරු එස්.බී. දිසානායක මහතා
ගරු මහින්ද සමරසිංහ මහතා
ගරු පී. හැරිසන් මහතා
ගරු ෆයිසර් මුස්තාපා මහතා
ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු සුජීව සේනසිංහ මහතා
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු බන්දුල ගුණවර්ධන මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු බිමල් රත්නායක මහතා
ගරු සෙයිඩ් අලි සහීර් මවුලානා මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු සීනිතම්බි යෝගේෂ්වරන් මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා
ගරු චන්දිම ගමගේ මහතා
ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා
ගරු වෛද්‍ය කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු අයි. චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
ගරු ප්‍රසන්න රණතුංග මහතා
ගරු එස්.වියාලේන්ද්‍රන් මහතා

# පටුන

**පිටු අංකය**


- ❖ සභාපතිවරයාගේ සටහන 01
- ❖ හැඳින්වීම 03
- ❖ වාර්තාවේ සංයුතිය 05
- ❖ කාරක සභාවේ විෂය පථයට අයත් ආයතන 06
- ❖ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා අනෙකුත් රාජ්‍ය ආයතන අතර අන්තර් සබඳතාව 07
- ❖ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්ය භාරය හා නව දැක්ම 10
- ❖ විමර්ශනය කරන ලද ආයතන 13
- ❖ පොදු නිරීක්ෂණ, නිගමන සහ නිර්දේශ 16
- ❖ විශේෂිත නිරීක්ෂණ 21
- ❖ විමර්ශනය කරන ලද ආයතනයන්හි පැවති හඳුනාගත් ප්‍රධාන ගැටලු සහ ලබා දෙන ලද නිර්දේශ 24

ඇමුණුම් :

1. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා යොමු කරන ලද ප්‍රශ්නාවලිය 102
2. පළාත් පාලන ආයතන සඳහා යොමු කරන ලද ප්‍රශ්නාවලිය 118
3. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලිපිගොනු පිළිබඳ වාර්තාව 126
4. රාජ්‍ය ආදායම කෙරෙහි රජයේ ආයතන වල දායකත්වය 127
5. පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා නිකුත් වූ විගණන මතය 128

- ❖ පාර්ලිමේන්තුවට ඉදිරිපත්කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා වාර්තා පිළිබඳ සංක්ෂිප්ත සටහන 131
- ❖ සූචිය 133

## සභාපතිවරයාගේ සටහන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පාර්ලිමේන්තුව වෙත පවරා ඇති රාජ්‍ය මූල්‍ය පාලනය ක්‍රියාත්මක කිරීමට සහාය වන අධීක්ෂණ කාරක සභාවක් වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, මූල්‍ය අධීක්ෂණය සඳහා සෘජුවම දායක වේ. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව, රාජ්‍ය විගණන ක්‍රියාවලියට ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇති අවස්ථාවක රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ධූරය හෙබවීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම බෙහෙවින් සතුටු වෙමි.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත පැවරී ඇති බලතල කාලීන වෙනස්කම් අනුව සංශෝධනය විය යුතු බව අදහස් කරන බැවින්, අදාළ ස්ථාවර නියෝග සංශෝධනය කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම මගින්, කාරක සභාව වඩාත් බලාත්මක කර ගැනීමට පියවර ගත යුතු වන අතර වර්තමානයේ එයට හිමි බලතල උපරිමයෙන් ක්‍රියාත්මක කරමින් ස්ථාපිත අරමුණු කරා යොමු වීමට කාරක සභාව කටයුතු කරමින් පවතී.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පාර්ලිමේන්තුවට තේරී පත්ව ඇති සියලුම පක්ෂ නියෝජනය වන ආකාරයෙන් සැදුම් ලද්දකි. ආණ්ඩුවේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකෙහි එකඟතාවයෙන් ඔබ්බට ගමන් කරමින් , සාමූහික වගකීමෙන් බැඳෙමින්, පවරා ඇති මූල්‍ය වගකීම එක් සිත්ව ඉටු කිරීමට කාරක සභාවට හැකියාව ලැබී තිබෙනුයේ සියලු දෙනාගේ සහයෝගය සහ කැපවීම හේතුවෙන් බව අවධාරණය කරමි.

ආයතන පරීක්ෂාවට ලක් කිරීමේ දී, හඳුනාගත් අඩුපාඩු නිවැරදි කරමින්, පවතින ධනාත්මක ලක්ෂණ සහ ප්‍රවණතා වඩාත් ඉස්මතු කරමින්, රාජ්‍ය නිලධාරින්ගේ ගෞරවය ආරක්ෂා කරමින්, ඔවුනට මග පෙන්වීම සිදු කළ යුතු බව, කාරක සභාවලින් ලත් දීර්ඝ අත්දැකීම් තුලින් පසක් වේ. විගණන ක්‍රියාවලියේ දී වාර්තාවන, ආයතන දුර්වලතා හඳුනාගෙන තීරණ ලබා දීමට වඩා, එවැනි අකාර්යක්ෂමතා ඇති වීම වැලැක්වීම වඩාත් ඵලදායී වන බැවින් ඉදිරි කාල සීමාව තුල, පසුගිය අඩුපාඩු නැවත ඇතිවීම වැලැක්වීම සඳහා ආයතනවලට මග පෙන්වීම කාරක සභාව මගින් සිදු කරනු ඇත.

මූල්‍ය සහ කළමනාකරණ නව ප්‍රවණතා හමුවේ කාරක සභාව ඵලදායී දිශානතියකට යොමුකිරීමේ කාලීන අවශ්‍යතාව හඳුනාගෙන, එම අරමුණ සඵලදායී කර ගැනීම සඳහා විශේෂිත ක්‍රමවේදයන් වෙත අනුගත වන ලදී.

- තෝරාගත් නිර්ණායකයන් මත, ආයතන මූලික ඇගයීමකට ලක් කිරීම
- ආයතන කැඳවීමේ නව ක්‍රමවේදයක් සැකසීම
- පළාත් සභා සහ පළාත් පාලන ආයතන කැඳවීම සක්‍රීය කිරීම
- පරිගනක මෘදුකාංග වැඩසටහන් භාවිතය ප්‍රවර්ධනය කිරීම

පසුගිය වකවානුවේ පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා අඩු ප්‍රමුඛතාවයක් ලබා දී, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හමුවට කැඳවා නොතිබුණ අතර නැවත එම ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට කාරක සභාව විසින් තීරණය කරන ලදි. එම අරමුණින් අදාළ ආයතන වල නිලධාරින් කැඳවා, පවත්වන ලද වැඩමුළුවේ දී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නව වැඩපිළිවෙල ඔවුනට පැහැදිළි කරන ලදි. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය පාලනය කෙරෙහි ද කමිටුවේ දැඩි අවධානයක් යොමු වන බැවින්, ඉදිරියේ දී පළාත් සභා සහ

පළාත් පාලන ආයතන, කාරක සභාව හමුවට කැඳවීමට කටයුතු කරන බව අවධාරණය කරන ලදී.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, අවශ්‍යතා අනුව අනු කාරක සභා පිහිටුවීම කෙරෙහි ද සිය අවධානය යොමුකර ඇත. මේ වන විට රජයේ ආදායම සඳහා වැඩි දායකත්වයක් දක්වන, ප්‍රධාන ආයතනවල පරිගනක යෙදුම් භාවිතය සම්බන්ධව ඇති ගැටලු හඳුනාගැනීම, ඒවායේ තත්වය වැඩිදියුණු කිරීම හා ආයතන අතර අන්තර් පරිගණක ජාලගත කිරීමේ ක්‍රියා පිළිවෙලක් සැකසීම, අක්‍රමිකතා අවම කිරීමට මෙන්ම රජයේ ආදායම වැඩි කිරීමේ හැකියාව සලකා බැලීම සඳහා සුදුසු යෝජනා ඉදිරිපත්කිරීමට, අනු කාරක සභාවක් පත් කර ඇත.

කාරක සභාවේ සභාපති වන මා හටත්, එහි සියලුම සාමාජිකයින්ටත්, ස්වාධීනව සහ අපක්ෂපාතීව ඵලදායී අරමුණු කරා කාරක සභාව මෙහෙය වීමට සහයෝගය ලබා දෙන අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාට සහ ගරු කථානායකතුමාටත් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සියලුම සාමාජිකයින් වෙනුවෙන් මගේ කෘතඥතාවය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාර්ථකත්වය යනු එයට දායක වන සියලුම පාර්ශවයන්ගේ සහයෝගයේ ප්‍රතිඵලයයි. විවිධ අභියෝගයන් මධ්‍යයේ වුව, සෑම විටම මා අපේක්ෂා කරන එම සහයෝගය නොපිරිහෙලා ලබා දෙන, පාර්ලිමේන්තුවේ මහ ලේකම්, නියෝජ්‍ය මහලේකම් සහ සහකාර මහලේකම්වරු ඇතුළු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා කාර්යාංශයේ නිලධාරි මණ්ඩලය ද විගණකාධිපතිවරයා ඇතුළු කාර්ය මණ්ඩලය ද මහා භාණ්ඩාගාරයේ නිලධාරීන් ද, දක්වන දායකත්වය මම මහත් සේ අගය කරමි.

ඉදිරි වර්ෂයේ දී සිදු කිරීමට සැලසුම් කර ඇති කාර්යයන් තුලින්, රාජ්‍ය සේවය වඩාත් ඵලදායීව පවත්වාගෙන යාම සඳහා දායකත්වය ලබා දීමට මෙන්ම, එමගින් යහ පාලනයේ සැබෑ අර්ථය මුදුන්පත් කිරීම සඳහා කාරක සභාවේ උපරිම ශක්තිය යොදවා කටයුතු කරන බව මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි.

# හැඳින්වීම

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දීර්ඝතම කාරක සභා ඉතිහාසයට හිමිකම් කියනු ලබන්නේ මූල්‍ය අධීක්ෂණය සඳහා ස්ථාපිත කරනු ලැබූ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවයි. මෙම කාරක සභාව 1923 සැප්තැම්බර් මස 05 වන දින ස්ථාපිත කරන ලදුව, එහි පළමු රැස්වීම 1923 ඔක්තෝබර් මස 17 වන දින පවත්වා ඇත.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 125 යටතේ බලාත්මක කර ඇති අතර, එහි කාර්ය භාරය මෙසේ සඳහන් කර ඇත.

> ***"125(2) මෙම කාරක සභාවේ කාර්යය වනුයේ පොදු වියහියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් දෙන ලද මුදල් ඒ ඒ කටයුතුවලට යෙදූ පිළිවෙළ දැක්වෙන ගිණුම් ද පාර්ලිමේන්තුව ඉදිරියේ තබන ලද අනිකුත් ගිණුම් වලින් කාරක සභාව සුදුසු යැයි සලකන ගිණුම් ද ඒ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා ද පළාත් පාලන ආයතන පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තා ද පරීක්ෂා කිරීමයි.***
>
> ***කවර හෝ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක හෝ පරීක්ෂාවට භාජනය කරන ලද ගිණුම්, මුදල් තත්ත්වය, මුදල් කටයුතු පිළිබඳ කාර්යය පටිපාටි හා සාමාන්‍ය කළමණාකාරීත්වය ගැන ද ඒ අනුව පැන නගින කවර හෝ කරුණක් ගැන ද මෙම කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.***
>
> ***කාරක සභාව විසින් නියම කරනු ලබන කවර හෝ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක සියලුම ගිණුම්, මුදල් තත්ත්වය හා කළමණාකාරිත්වය පරීක්ෂා කර කාරක සභාවට වාර්තා කිරීම පිණිස කාරක සභාවට අවශ්‍ය යැයි හැඟීගිය විටක කාරක සභාවේම සාමාජිකයන්ගෙන් සමන්විත අනු කාරක සභා පත් කිරීම කාරක සභාවට කළ හැකිය.***
>
> ***කාරක සභාවට හෝ එහි කිසියම් අනුකාරක සභාවකට ඊට අයත් කාර්යය ඉටු කිරීම පිණිස කවර හෝ පුද්ගලයෙකු කැඳවා ප්‍රශ්න කිරීමේ බලයත් කවර හෝ ලිපියක්, පොතක් , ලේඛනයක් හෝ වෙනයම් ලියවිල්ලක් ගෙන්වා පරීක්ෂා කිරීමේ බලයත් ගබඩාවලට සහ වෙනත් දේපලවලට පිවිසීමේ බලයත් කාරක සභාවටත් එහි අනු කාරක සභාවලටත් තිබිය යුතුය."***

පාර්ලිමේන්තුව වෙනුවෙන්, විගණකාධිපතිවරයා විසින් රාජ්‍ය ආයතනයන්හි විගණන කටයුතු සිදු කරනු ලබන අතර මූල්‍ය වගවීම සහතික කිරීම සඳහා විගණනයේ ප්‍රතිඵල සලකා බැලීමේ කාර්යය පැවරී ඇත්තේ පාර්ලිමේන්තුව වෙතය. එම කාර්යය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුවට සහාය වීමේ අරමුණින්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පත් කර ඇති අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි වගන්තිය අනුව පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති රාජ්‍ය මූල්‍ය පාලන බලය අධීක්ෂණ කමිටුවක් මගින් ක්‍රියාත්මක කරවන වැදගත්ම ව්‍යුහය වන්නේ මෙම කාරක සභාවයි.

යම් රාජ්‍ය ආයතනයක මූල්‍ය හා භෞතික කාර්යය සාධනය, කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව සම්බන්ධව විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති

වාර්තාවල ඇතුලත් විගණන විමසුම් පිළිබඳව අදාළ ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි / ගණන් දීමේ නිලධාරි කාරක සභාව ඉදිරියට කැඳවා විමර්ශන කරනු ලැබේ.

මූල්‍ය කළමනාකරණය සහ පරිපාලන කටයුතු සමබර ආකාරයෙන් පවත්වාගෙන යමින් රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුගතව, තම කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සෑම ආයතන ප්‍රධානියකුගේම වගකීම වන බව කාරක සභාව දැඩිව අවධාරණය කරනු ලබන අතර, විගණකාධිපතිවරයාගේ වාර්තාවෙන් අනාවරණය වන කරුණු වලට අමතරව ආයතනයන්හි වත්මන් කාර්ය සාධනය පිළිබඳව ද සිය අවධානය යොමු කිරීමට කාරක සභාව කටයුතු කර ඇත.

රාජ්‍ය ආයතන හා ඊට අනුෂංගික ප්‍රධාන අනු ආයතන 842 ක ප්‍රමාණයක් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ විෂය පථයට අයත් වේ. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පවතින සමහර ආයතන, කිසිදු අමාත්‍යාංශයක් යටතට නොගැනෙන ස්වාධීන ආයතන, කොමිෂන් සභා, අරමුදල් මෙන්ම විදේශීය මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ද මෙයට ඇතුලත් වේ.

විමර්ශනය කරනු ලබන ආයතනයන්හි කළමනාකරණ සහ මූල්‍ය දුර්වලතා, අක්‍රමිකතා සහ අකාර්යක්ෂමතා හඳුනාගනිමින්, ඒවා වැලැක්වීම සහ නිරාකරණය සඳහා කාරක සභාව විසින් ලබා දෙන්නා වූ නිර්දේශ, එම ආයතනවල ක්‍රියාත්මක කරවීම තුලින් පාර්ලිමේන්තුවේ අයවැය මඟින් වාර්ෂිකව එක් එක් වැය ශීර්ෂයන් යටතේ වෙන් කරනු ලබන ප්‍රතිපාදන සීමාවන් තුල, එකී ප්‍රතිපාදන වෙන් කරනු ලබන පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම හා එමඟින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම, කාරක සභාව සෑම විටම අපේක්ෂා කරයි.

## වාර්තාවේ සංයුතිය

අටවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, සිය පළමු වාර්තාව අද දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 125 ප්‍රකාරව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලැබූ මන්ත්‍රීන් 12 දෙනෙකුගෙන් සමන්විතවූ, අටවැනි පාර්ලිමේන්තුවේ පළමුවන සැසිවාරය සඳහා වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, ගරු කථානායකතුමා විසින් 2015 ඔක්තෝබර් මස 23 වන දින පාර්ලිමේන්තුව හමුවේ නිවේදනය කරන ලද අතර, පසුව අවස්ථා තුනකදී තේරීම් කාරක සභාව විසින් ගනු ලැබූ තීරණ අනුව, වර්තමාන පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයින් සංඛ්‍යාව 26 දක්වා පුළුල් කරන ලදි.

2015 නොවැම්බර් මස 26 වැනි දින ප්‍රථම වරට කාරක සභාව රැස් වූ අතර, ගරු ලසන්ත අලගියවන්න මහතා නිතරඟයෙන් සභාපති ධූරයට පත් විය. එතැන් සිට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව, රාජ්‍ය ආයතනවල ගිණුම් කටයුතු හා කාර්ය සාධනය විමර්ශනය කිරීම සඳහා කාරක සභාව නිතිපතා රැස්විය.

2016 ජනවාරි මස 09 වන දින සිට 2016 අප්‍රේල් මස 07 වැනි දින දක්වා වන මාස තුනක කාලය තුල , 2005 – 2013 වර්ෂ වලට අදාළව විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණකාධිපති වාර්තා පදනම් කොටගෙන, කාරක සභාව හමුවට කැඳවන ලද රාජ්‍ය ආයතන 38 පිළිබඳ විමර්ශන 41ක් පවත්වන ලද අතර, එහිදී කාරක සභාව විසින් අනාවරණය කර ගන්නා ලද කරුණු මෙම වාර්තාවේ ඇතුලත් කරනු ලැබ ඇත.

කාරක සභාව විසින් ලබා දෙන ලද නිර්දේශ වලට අනුව, සීමිත කාල රාමුවක් තුල, 842ක් පමණ වන රාජ්‍ය ආයතන හා ප්‍රධාන අනු ආයතන සියල්ල විමර්ශනයට ලක් කිරීමේ අභියෝගය ජයගත හැකි මාර්ග සහ නව වැඩපිළිවෙලක් ඔස්සේ වඩා කාර්යක්ෂම සහ ඵලදායී ලෙස කටයුතු ඉටු කිරීම සඳහා යෝජිත වෙනස්කම් සහිත නව ක්‍රියාමාර්ග මෙම වාර්තාවේ අඩංගු වේ.

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ විෂය පථයට අයත් වන ආයතන**

| **ආයතනය** | **සංඛ්‍යාව** |
|---|---|
| **ප්‍රධාන ආයතන** | |
| විශේෂිත වියදම් ඒකක | 19 |
| අමාත්‍යාංශ | 51 |
| දෙපාර්තමේන්තු | 89 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 25 |
| පළාත් පාලන ආයතන | 335 |
| **එකතුව** | **519** |
| **ප්‍රධාන අනු ආයතන** | |
| පළාත් සභා | 09 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 314 |
| **එකතුව** | **323** |
| **මුළු ආයතන සංඛ්‍යාව** | **842** |

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා අනෙකුත් රාජ්‍ය ආයතන අතර අන්තර් සබඳතාව**




1. පාර්ලිමේන්තුව විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පත් කරනු ලබන අතර පාර්ලිමේන්තුව සතු අධීක්ෂණ කාර්යයන්ගෙන් කොටසක් ක්‍රියාත්මක කිරීමට එය බලගන්වා ඇත.

2. අරමුදල් එකතු කිරීමට හා ඒකාබද්ධ අරමුදලින් හා රජයට අයත් වෙනත් අරමුදල්වලින් මුදල් වැය කිරීමට පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන වාර්ෂික විසර්ජන පනතින් හා වෙනත් විශේෂිත නීතීන්ගෙන් මුදල් අමාත්‍යාංශයට හා මහා භාණ්ඩාගාරයට බලතල ලැබේ.

3. සියලුම රාජ්‍ය ආයතනවල විගණන කටයුතු සිදු කිරීමට හා විගණකාධිපතිවරයාගේ මතය අනුව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි හැඟෙන රාජ්‍ය ආයතන විසින් සිදු කරනු ලබන මූල්‍ය අක්‍රමිකතා, අනුගත නොවීම්, වංචා හෝ කාර්යයන් නිසි පරිදි ඉටු නොකිරීම පිළිබඳව නැවත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමේ අධිකාරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයාට පවරා ඇත.

4. පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන මූලික ව්‍යවස්ථාවන් මගින් බදු හා අනෙකුත් අය කිරීම් එකතු කිරීමට පළාත් පාලන ආයතනවලට බලතල ඇත.

5. පාර්ලිමේන්තුව විසින් වාර්ෂික ප්‍රතිපාදන ලෙස සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, විශේෂිත වියදම් ඒකක සඳහා වාර්ෂික වියදම් ඇස්තමේන්තු ද පළාත් සභාවල වියදම්වලින් කොටසක් ද අනුමත කරනු ලැබේ. ආදායම් ගිණුම් නිලධාරින් සඳහා ආදායම් ඇස්තමේන්තු කිරීමට ද රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල අත්තිකාරම් ගිණුම් සඳහා වියදම් හා ලැබීම් සමග තීරණය කිරීම ද පාර්ලිමේන්තුව විසින් කරනු ලැබේ.

6. මුදල් අමාත්‍යාංශය/ මහා භාණ්ඩාගාරය විසින් සෑම ආදායම් හා වියදම් ශීර්ෂයකටම ගණන් දීමේ නිලධාරීන් හා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් පත් කරනු ලැබේ. එමෙන්ම, වියදම් ඒකක සඳහා අග්‍රිම සීමාවන් (මුදල් ලබා ගැනීමේ සීමාවන්) නිශ්චය කරනු ලබන අතර අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිශ්චිත උපදෙස් ලබා දීමද, අවශ්‍යතා අනුව මුදල් නිකුත් කිරීමද සිදු කරනු ලැබේ. එමෙන්ම, මූල්‍ය කළමනාකරණය පිළිබඳ කටයුතු අධීක්ෂණය ද, රජයට අයත් මුදල්වල භාරකරු හා මූල්‍ය රෙගුලාසිවල භාරකරු ලෙස පාලනය කිරීම ද සිදු කරනු ලැබේ.

7. විගණකාධිපතිවරයා විසින් අඛණ්ඩ විගණන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම විසර්ජන ගිණුම්, අවසාන ගිණුම් හා අනෙකුත් ගිණුම් පරීක්ෂාව/ විගණනය ඇතුළු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා හා පළාත්පාලන ආයතනවල ක්‍රියාකාරකම් පිළිබඳ විගණන පරීක්ෂාවන් සිදු කරනු ලැබේ. තොරතුරු කැඳවීමට, විමසීමට, විගණන විමසුම් ආරම්භ කිරීමට මෙන්ම, පිළිතුරු ඇගයීමටද විගණකාධිපතිවරයාට බලය ඇත. එම පිළිතුරුවලින් සෑහීමකට පත් නොවන්නේ නම් එම කරුණු පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුද නැත්ද යන්න සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම සඳහා යෝජිත ජේද, ගණන් දීමේ නිලධාරීන්ට මෙන්ම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ට යවා අදහස් විමසනු ලැබේ.

8. මහා භාණ්ඩාගාරය, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂිත වියදම් ඒකක, පළාත් සභා හා පළාත් පාලන ආයතන විසින් ඔවුන්ගේ වාර්ෂික ගිණුම් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන අතර, ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා දීම ද, විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම ද, යෝජිත විගණන ඡේද පිළිබඳ තම අදහස් පළ කිරීම ද සිදු කරනු ලැබේ.

9. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් තම අනු කාර්යාල සඳහා තම කාර්යයන් ඉටු කිරීමට බලතල බෙදා හැරීම ද, අයවැය ප්‍රතිපාදන හා මුදල් වෙන් කිරීම ද, අධීක්ෂණය ද සිදු කරනු ලැබේ.

10. නියෝජිතායතන හා උප කාර්යාල, අදාළ ප්‍රධාන කාර්යාලවලට නැවත වාර්තා කරනු ලැබේ.

11. විගණකාධිපතිවරයා විසින් තම වාර්ෂික වාර්තා මෙන්ම විශේෂ වාර්තා පාර්ලිමේන්තුවට මෙන්ම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත ද ඉදිරිපත් කරනු ලැබේ.

12. විගණකාධිපතිවරයාගේ වාර්තා සමාලෝචනය කිරීමෙන් පසු කාරක සභා ඉදිරියට ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව කැඳවිය යුත්තේ කුමන ආයතන ද යන්න රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරනු ලබන අතර, ඒ සඳහා අදාළ නිලධාරීන්

සමඟ ආයතනයේ ගණන් දීමේ නිලධාරි/ප්‍රධාන ගණන් දීමේ නිලධාරි කැඳවනු ලැබේ. එමෙන්ම, ආයතනයේ කාර්ය සාධනයට අදාළ වෙනත් තොරතුරු ද, විගණකාධිපතිවරයා විසින් මතු කරනු ලබන කරුණු වල යථාවත් කරන ලද තත්ත්වය ද විමසනු ලැබේ.

13. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත්පාලන ආයතන හා ඒ යටතට ගැනෙන අනෙකුත් නියෝජිතායතන නියෝගවලට ප්‍රතිචාර දක්වමින් ඉල්ලා සිටිනු ලබන අතිරේක තොරතුරු සමග කාරක සභාව ඉදිරියට පැමිණෙති.

14. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ඉදිරියට කැඳවනු ලබන නිලධාරීන් හා ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන ලිඛිත පැහැදිලි කිරීම් කාරක සභාව විසින් පරීක්ෂාවට ලක් කරනු ලබන අතර, අදාළ නිලධාරීන් විසින් ලබා දෙනු ලබන පැහැදිලි කිරීම්වලින් සෑහීමකට පත් නොවේ නම් ගත යුතු ඉදිරි පියවර පිළිබඳ තීරණය කරනු ලැබේ. ඒ අනුව, කාරක සභාව විසින් විශේෂ නිර්දේශයන් නිකුත් කරනු ලබන අතර කාරක සභාවේ නිර්දේශ සහිත තම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.

15. කාරක සභාවේ නිර්දේශ මත පදනම්ව මහා භාණ්ඩාගාරය විසින් මහා භාණ්ඩාගාර කාර්ය සටහන් පිළියෙල කරනු ලබන අතර පවත්නා මූල්‍ය රෙගුලාසිවලට අවශ්‍ය වන සංශෝධන ඇතුලත් මෙන්ම අදාළ ගැටළුවලට පිළියම් යෙදීමට අවශ්‍ය වන භාණ්ඩාගාර චක්‍රලේඛ සෑම රජයේ ආයතනයකටම නිකුත් කරනු ලැබේ.

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය හා නව දැක්ම

### 01. මූල්‍ය වාර්තා ඉදිරිපත්කිරීම හා කාර්ය සාධනය අනුව රාජ්‍ය ආයතන ඇගයීම් කිරීම හා වර්ගීකරණය කිරීම.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ විෂය පථයට ගැනෙන 842 ක් වූ රාජ්‍ය ආයතන සියල්ල කාරක සභාව ඉදිරියට කැඳවා විමර්ශනය කිරීම ප්‍රායෝගිකව අපහසු කාර්යයක් වන බැවින්, ඒ සඳහා නව ක්‍රමවේදයක්, වර්තමාන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ආරම්භ කර ඇත.

ඒ අනුව, සියළුම රාජ්‍ය ආයතන පිළිගත හැකි නිශ්චිත ක්‍රමවේදයක් තුලින් ශ්‍රේණිගත කිරීමටත්, එමගින් ලබා ගන්නා ලද ඇගයීමේ ප්‍රතිඵල මත අදාළ ආයතන කාරක සභාව ඉදිරියට කැඳවීමටත් තීරණය කරන ලදී. මේ සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හා ඵලදායීතා ලේකම් කාර්යාලය යන ආයතන ත්‍රිත්වයෙහි නිලධාරින්ගේ විශේෂඥ දැනුම ලබාගෙන සකස් කරන ලද ප්‍රශ්නාවලි දෙකක් (ඇමුණුම අංක 1 සහ 2) උපයෝගී කරගෙන (අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ දිස්ත්‍රික් ලේකම් කාර්යාල/පළාත් සභා සඳහා එක් ප්‍රශනාවලියක් සහ පළාත් පාලන ආයතනයන් සඳහා එක් ප්‍රශ්නාවලියක් ) ආයතන ඇගයීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරන ලදි.

රාජ්‍ය ආයතනවල මානව , මූල්‍ය හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ කාර්ය සාධනය ඇගයීම කළ හැකි වන පරිදි මෙම ප්‍රශ්නාවලීන් සැලසුම් කර ඇත.

ආයතන ශ්‍රේණි ගත කිරීමේ නියමු ව්‍යාපෘතියක් ලෙස දැනට මෙය ක්‍රියාත්මක වන අතර, එම ප්‍රශ්නාවලි රාජ්‍ය ආයතන වෙත යොමු කිරීමෙන් අනතුරුව අදාළ පිළිතුරු මේ වන විට ද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා ලේකම් කාර්යාලය වෙත ලැබී ඇත. ඒ අනුව, ආයතන සියල්ල ඇගයුමට ලක්කර ශ්‍රේණි ගත කොට, කාරක සභාවේ මීළඟ වාර්තාවට එම ශ්‍රේණි ගත කිරීම් අන්තර් ගත කෙරෙනු ඇත. (අදාළ ශ්‍රේණිගත කිරීමෙන් අනතුරුව, එම ප්‍රශ්නාවලි සඳහා ලබා දුන් පිළිතුරුවල නිවැරදිභාවය තහවුරුකරගැනීම සඳහා විගණකාධිපති වෙත යොමු කරනු ලැබේ.) ඒ අනුව, ඒ ඒ ආයතන ලබා ගත් ඇගයීම් ශ්‍රේණිය පිළිබඳව අදාළ අමාත්‍යවරයා දැනුවත් කරන අතර, සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් කාරක සභාව වෙත කැඳවා, ඇගයීමේ ක්‍රියාවලිය පිළිබඳ පූර්ණ දැනුවත් කිරීමක් සිදු කිරීමට කාරක සභාව අදහස් කරයි.

මෙම ඇගයීම පාදක කොට ගෙන, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හමුවට අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු කැඳවීමේ ප්‍රමුඛතාවය තීරණය කිරීම ආරම්භ කර ඇත.

### 02. පළාත් පාලන ආයතන පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හමුවට කැඳවීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

2016 මාර්තු මස 31 වන දින ගරු කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල වැදගත්කම සහ එහි මූල්‍ය කටයුතු පිළිබඳ ඇති වගකීම අවධාරණය කරමින් හා එම ආයතනවල පවත්නා ගැටළු සහ දුර්වලතා පිළිබඳ අදහස් ලබා ගැනීම මෙන්ම පළාත් පාලන ආයතන පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

ඉදිරියට කැඳවීම සම්බන්ධව දැනුවත් කිරීමට සියලුම පළාත් ආණ්ඩුකාර ලේකම්වරු, පළාත් සභා ප්‍රධාන ලේකම්වරු, පළාත් සභා නියෝජ්‍ය ලේකම්වරු (මුදල්), පළාත් සභා ලේකම්වරු, පළාත් පාලන ලේකම්වරු, මහනගර සභා කොමසාරිස්වරු, නගර සභා ලේකම්වරු සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්, පාර්ලිමේන්තුව වෙත කැඳවා දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් පවත්වන ලදි.

ඉදිරියේ දී පළාත් සභා සහ පළාත් පාලන ආයතන කැඳවීමේ දී එම ආයතන වල මූල්‍ය තත්ත්වය පිළිබඳව විගණකාධිපතිවරයාගේ මතය ද (ඇමුණුම අංක 5) එක් දර්ශකයක් සේ පදනම් කර ගැනීමට නියමිතය.

## 03. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා මහජන සම්බන්ධතා.

මහජනතාවට කාරක සභාව පිළිබඳ තොරතුරු දැන ගැනීමට හැකියාව ලැබෙන පරිදි සහ මහජන අදහස් හා යෝජනා කාරක සභාව වෙත සෘජුවම ලබාගත හැකි වන පරිදි, පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගනිමින් නව පරිගනක වැඩසටහනක් සකස් කර ඇත. මෙමගින් කාරක සභාවේ විමර්ශන කටයුතු ඵලදායි අන්දමින් ක්‍රියාත්මක කිරීමට හැකිවන අතර, ඉදිරියේ දී හැකිතාක් දුරට කාරක සභාවේ කටයුතු කඩදාසි භාවිතයෙන් තොර පරිසරයක් තුල ක්‍රියාත්මක කිරීම මෙහි අවසාන අරමුණ වේ.

## 04. රාජ්‍ය අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු එකවර රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත කැඳවීම.

මෙමගින් එකම ක්ෂේත්‍රයක එකිනෙකට සම්බන්ධ ගැටලු, ප්‍රශ්න සාකච්ඡා කර නිරාකරණය කිරීම වඩාත් ඵලදායී ලෙස ඉටු කර ගත හැකි වූ අතර, කාරක සභාවට වඩා ඵලදායී නිර්දේශ ඉදිරිපත් කිරීමේ හැකියාව ද ලැබිණ.

## 05. රාජ්‍ය ආයතනවල පරිගනක යෙදුම් භාවිතය වැඩි දියුණු කිරීම.

ආදායම් ලබන රජයේ ප්‍රධාන ආයතන වල පරිගනක යෙදුම් භාවිතය සම්බන්ධව ඇති ගැටලු නිරාකරණය කිරීම, වැඩිදියුණු කිරීම හා එම ආයතන අතර පරිගනක ජාල සම්බන්ධිත ක්‍රියා පිළිවෙලක් සැකසීම මගින්, ආයතන තුළ සිදුවන දෝෂ, වැරදි, අක්‍රමිකතා අවම කිරීමත්, රජයට ලැබිය යුතු ආදායම වැඩි කිරීමේ හැකියාව සලකා බැලීමත් සඳහා සාකච්ඡාවක් 2016 මාර්තු 24 වන දින පවත්වන ලදි.

රාජ්‍ය ආදායමට වැඩිම දායකත්වයක් සපයන ප්‍රධාන ආයතන (ඇමුණුම - අංක 04) අතර, මේ වන විට ඒකාබද්ධ පරිගණක තොරතුරු තාක්ෂණික දත්ත හුවමාරු වැඩසටහනක් ක්‍රියාත්මක නොවන බැවින්, මෙම ආයතන කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් බව කාරක සභාව නිර්දේශ කරයි.

මේ සඳහා පරිගණක යෙදුම් භාවිතය සම්බන්ධයෙන් ප්‍රමුඛව කටයුතු කරන ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවත්, මෙම අංශයේ නියැලී සිටින ලංකා ක්ලියර් සහ ICTA (Information and Communication Technology Agency) යන

ආයතනයන් කැඳවා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමට කාරක සභාව විසින් කටයුතු කරන ලදි.

## 06. තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතය සම්බන්ධව අනුකාරක සභාවක් පත් කිරීම.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින්, රාජ්‍ය ආයතනවල තොරතුරු තාක්ෂණය භාවිතය සම්බන්ධව පරීක්ෂා කර බලා ඉහත අංක 05 හි සඳහන් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, ගරු ඉරාන් වික්‍රමරත්න මහතාගේ සභාපතිත්වයෙන් යුත් සාමාජික මන්ත්‍රීවරුන් හතර දෙනෙකුගෙන් සැදුම් ලත් අනු කාරක සභාවක් 2016 මාර්තු මස 23 වන දින පත් කරන ලදී.

<u>**අනු කාරක සභාව**</u>

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින්, රාජ්‍ය ආදායම කෙරෙහි වැඩි දායකත්වයක් ලබා දෙනු ලබන ආයතන කිහිපයෙහි පරිගණක තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ කටයුතු වැඩි දියුණු කිරීම හා සම්බන්ධීකරණය කඩිනම් කිරීම මගින් එම ආයතනවල අඩු පාඩු අවම කිරීමට මෙන්ම, ආදායම වැඩි කිරීමට ඇති හැකියාව පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත්කරන ලද අනු කාරක සභාවේ සංයුතිය

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (සභාපති)
ගරු බන්දුල ගුණවර්ධන මහතා
ගරු සෙයිඩ් අලි සහීර් මවුලානා මහතා
ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා
ගරු වෛද්‍ය කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා

## 07. පසු විපරම් කටයුතු ශක්තිමත් කිරීම

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත අවුරුද්දකට එක් වතාවක් හෝ සෑම ආයතනයක්ම කැඳවිය යුතුය යන පදනම මත කටයුතු සිදු වුව ද, සමහර ආයතන කාරක සභාව හමුවට කැඳවා පරීක්ෂා කිරීමේ දී එම ආයතන තුල දෝෂ හා අකාර්යක්ෂමතා බහුලව පවතින බව නිරීක්ෂණය වූයෙන් , එම ආයතන නැවත නැවතත් ගිණුම් කාරක සභාව වෙත කැඳවා ලබා දෙන ලද නියෝග ක්‍රියාත්මක කිරීමේ කටයුතු වල ප්‍රගතිය විමර්ශනය කිරීමේ අවශ්‍යතාව හඳුනා ගන්නා ලදී. එබැවින් එම ආයතන සෑම මාස 03 කට වරක් කාරක සභාව වෙත කැඳවා පරීක්ෂා කළ යුතු බවට තීරණය කොට ඇත. මේ පදනම මත රේගු දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන අමාත්‍යාංශය මේ වන විට දෙවරක් කාරක සභාව වෙත කැඳවා ඇත.

## 08. ස්ථානීය පරීක්ෂණ සිදු කිරීම

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත ලබා දී ඇති බල තල ප්‍රකාරව, කිසියම් ආයතනයක් ඉදිරිපත් කරන තොරතුරු පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි නම් හෝ එම ආයතනය ප්‍රායෝගිකව පරීක්ෂාවට ලක් කළ යුතු යැයි හැඟී යන අවස්ථාවක, ස්ථානීය පරීක්ෂණ සිදු කිරීමට කාරක සභාව අදහස් කරයි.

# විමර්ශනය කරන ලද ආයතන

| අංකය | ආයතනයේ නම | රේඛීය අමාත්‍යාංශය | විමර්ශනය කළ දිනය | පිටු අංකය |
|---|---|---|---|---|
| **1** | ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව | මුදල් | 09.01.2016 | 24 |
| **2** | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා | 09.01.2016 | 25 |
| **3** | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | මුදල් | 26.01.2016 | 27 |
| **4** | සුරාබදු දෙපාර්තමේන්තුව | මුදල් | 26.01.2016 | 29 |
| **5** | නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | **-** | 26.01.2016 | 31 |
| **6** | අධ්‍යාපන අමාත්‍යාංශය | **-** | 27.01.2016 | 33 |
| **7** | ඉඩම් අමාත්‍යාංශය | **-** | 27.01.2016 | 36 |
| **8** | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු | 28.01.2016 | 37 |
| **9** | විභාග දෙපාර්තමේන්තුව | අධ්‍යාපන | 28.01.2016 | 39 |
| **10** | තක්සේරු දෙපාර්තමේන්තුව | මුදල් | 09.02.2016 | 41 |
| **11** | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ | 10.02.2016 | 42 |
| **12** | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | සමාජ සවිබල ගැන්වීම සහ සුභසාධන | 11.02.2016 | 45 |
| **13** | අධ්‍යාපන අමාත්‍යාංශය | **-** | 12.02.2016 | 51 |
| **14** | කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ස්වදේශ කටයුතු | 12.02.2016 | 52 |
| **15** | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ස්වදේශ කටයුතු | 23.02.2016 | 54 |
| **16** | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම් හා හින්දු ආගමික කටයුතු | 24.02.2016 | 56 |

| අංකය | ආයතනයේ නම | රේඛීය අමාත්‍යාංශය | විමර්ශනය කළ දිනය | පිටු අංකය |
|---|---|---|---|---|
| **17** | දුම්රිය දෙපාර්තමේන්තුව | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා | 25.02.2016 | 58 |
| **18** | සේවක අර්ථසාධක අරමුදල | කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා / ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු | 26.02.2016 | 61 |
| **19** | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | - | 08.03.2016 | 63 |
| **20** | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | තිරසර සංවර්ධන හා වනජීවී | 08.03.2016 | 63 |
| **21** | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | තිරසර සංවර්ධන හා වනජීවී | 08.03.2016 | 66 |
| **22** | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | තිරසර සංවර්ධන හා වනජීවී | 08.03.2016 | 70 |
| **23** | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | අධ්‍යාපන | 10.03.2016 | 71 |
| **24** | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | අධ්‍යාපන | 10.03.2016 | 75 |
| **25** | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | ඉඩම් | 10.03.2016 | 74 |
| **26** | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | ඉඩම් | 10.03.2016 | 74 |
| **27** | ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | - | 10.03.2016 | 77 |
| **28** | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා | 10.03.2016 | 78 |
| **29** | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | - | 11.03.2016 | 79 |
| **30** | වාණිජ දෙපාර්තමේන්තුව | කර්මාන්ත හා වාණිජ කටයුතු | 11.03.2016 | 81 |
| **31** | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | කර්මාන්ත හා වාණිජ කටයුතු | 11.03.2016 | 83 |
| **32** | මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | කර්මාන්ත හා වාණිජ කටයුතු | 11.03.2016 | 84 |
| **33** | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ප්‍රාථමික කර්මාන්ත | 11.03.2016 | 85 |

| අංකය | ආයතනයේ නම | රේඛීය අමාත්‍යාංශය | විමර්ශනය කළ දිනය | පිටු අංකය |
|---|---|---|---|---|
| **34** | ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව | මුදල් | 23.03.2016 | 87 |
| **35** | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා | 24.03.2016 | 89 |
| **36** | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | - | 07.04.2016 | 92 |
| **37** | කම්කරු දෙපාර්තමේන්තුව | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා | 07.04.2016 | 94 |
| **38** | මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා | 07.04.2016 | 94 |
| **39** | කෘෂිකර්ම අමාත්‍යාංශය | - | 07.04.2016 | 96 |
| **40** | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | කෘෂිකර්ම | 07.04.2016 | 99 |
| **41** | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | කෘෂිකර්ම | 07.04.2016 | 100 |

## පොදු නිරීක්ෂණ, නිගමන සහ නිර්දේශ

### 01. අනු ආයතනවල විගණනය ප්‍රමාණවත් නොවීම.

විගණකාධිපතිවරයා විසින් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විගණනය කිරීමේ දී ඒවා යටතේ පවතින අනු ආයතන සියල්ල ගැඹුරින් විගණනයට ලක් කිරීමේ ප්‍රායෝගික අපහසුතාවයක් පවතින බව කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

මීට නිදසුනක් ලෙස සෞඛ්‍ය ආමාත්‍යාංශය විගණනය කිරීමේ දී, ඒ යටතේ පවතින ප්‍රධාන රෝහල් සියල්ල වෙන් වශයෙන් ගැඹුරින් විගණනය කිරීමට අපහසු වීම හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ සියල්ල සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳව නිකුත් කරනු ලබන විගණකාධිපති වාර්තාවලින් ඉදිරිපත් නොවීම වැනි කරුණු කෙරෙහි ද කාරක සභාවේ අවධානය යොමු විය.

ඒ අනුව පවතින සියලුම අනු ආයතන ගැඹුරින් හා විස්තරාත්මකව විගණනය කිරීම සඳහා විගණකාධිපතිවරයා සතු සම්පත් ප්‍රමාණවත් නොවන බව අනාවරණය වූ හෙයින් එම දෙපාර්තමේන්තුව භෞතික හා මානව සම්පත් වලින් ශක්තිමත් කළ යුතු බවට කාරක සභාව නිර්දේශ කරයි.

අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල අභ්‍යන්තර විගණන අංශ කාර්යක්ෂම හා බලාත්මක කිරීම තුලින්, මෙම අනු ආයතන විගණනය කිරීමට යොමු කිරීම ඉහත ගැටලුවට යම් ආකාරයක විසඳුමක් වන බව කාරක සභාව නිර්දේශ කරයි.

### 02. රාජ්‍ය ආයතනවල පරිගනක තොරතුරු තාක්ෂණය භාවිතය දුර්වල මට්ටමක පැවතීම.

රාජ්‍ය ආයතනයන්හි පරිගනක තොරතුරු තාක්ෂණ වැඩසටහන් වෙනුවෙන් අධික මුදල් ප්‍රමාණයක් වැය කළ ද එම වැඩසටහන් අවසන් කර නොමැති අවස්ථා වැඩි වශයෙන් පවතින බවත්, රාජ්‍ය ආයතන විසින් තොරතුරු තාක්ෂණය උපයෝගී කරගෙන ඇති ආකාරය පිළිබඳව සෑහීමකට පත් විය නොහැකි බවත් අනාවරණය විය.

මෘදුකාංග දත්ත පද්ධතියක් ආයතනයක් සතුව නොමැති වීම හේතුවෙන්, එම දත්ත පවත්වාගෙන යාම සිදු කෙරෙන්නේ ලිපි ගොනු මගිනි. ලිපිගොනු අස්ථාන ගත වීම, අක්‍රමවත් ලෙස ලිපි ගොනු පවත්වාගෙන යාම ආයතනවල දක්නට ලැබුණු සුලභ තත්ත්වයන් විය. පරිගනක මෘදුකාංග දත්ත පද්ධතියක් ආයතන සතුව පවතී නම් මෙම අකාර්යක්ෂමතා වලක්වා ගත හැකි වේ.

ඉදිරි අවුරුදු 02 ක් හෝ නිශ්චිත ඉලක්ක ගත කාලයක් තුල ඵලදායී හා කාර්යක්ෂම අයුරින් රාජ්‍ය ආයතනවල තොරතුරු තාක්ෂණය භාවිතය අනිවාර්ය කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම යෝග්‍ය වේ.

ආයතනවල තොරතුරු තාක්ෂණය හා සම්බන්ධව කටයුතු කිරීම සඳහා එම ආයතනවල ඒ පිළිබඳ වෘත්තීය දැනුම සහිත පුද්ගලයන් නොමැති වීම ද මේ තත්ත්වයට හේතු වී ඇති බැවින්, සෑම ආයතනයකටම තොරතුරු තාක්ෂණය සම්බන්ධ දැනුම ඇති අය බඳවා ගැනීම ද වැදගත් වේ.

## 03. ආයතනික /කාර්ය මණ්ඩල කාර්ය සාධනය ඇගයීම ප්‍රමාණවත් නොවීම.

ඇතැම් රාජ්‍ය ආයතනයන්හි ආයතනික හා කාර්ය මණ්ඩල කාර්ය සාධන ඇගයීමක් නිසියාකාරව සිදු නොවන බව කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදි.

සෑම ආයතනයක්ම තම කාර්යය මණ්ඩලයේ කාර්ය සාධන ඇගයීමක් වාර්ෂිකව සිදු කිරීම මගින් සේවක අභිප්‍රේරණය ඇතිවීමෙන් වඩා ඵලදායී සේවාවක් ලබා ගත හැකි වනු ඇත.

ආයතනික කාර්ය සාධන ඇගයීමක් වාර්ෂිකව සිදු කිරීම මගින් ආයතනයේ පවතින හැකියාවන් සහ දුර්වලතා හඳුනාගෙන, ආයතනයේ ඉලක්ක කරා ළඟා වීම පහසු වනු ඇත.

## 04. කාරක සභාව විසින් ලබා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම දුර්වල මට්ටමක පැවතීම .

කාරක සභාව විසින් දෙනු ලැබූ නිර්දේශ, සමහර ආයතන නැවත කාරක සභාව ඉදිරියට කැඳවනු ලබන අවස්ථාව වන විට ද ක්‍රියාත්මක නොවී තිබීම නිරීක්ෂණය විය. එවැනි අවස්ථාවලදී අදාළ ආයතන, සීමිත කාල පරාසයක් තුල නැවත නැවතත් කාරක සභාව හමුවට කැඳවා විමර්ශනය කරනු ලබන අතර, එමගින් ද විසඳුම් නොලැබෙන්නේ නම්, ඒ පිළිබඳ තොරතුරු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාවට ඇතුලත් කොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.

කාරක සභාව විසින් ලබා දෙන ලද නිර්දේශ කෙරෙහි ප්‍ර.ග.නි/ග.නි. විසින් වඩා වැඩි අවධානයක් යොමු කර එම නිර්දේශ ක්‍රියාත්මක කළයුතු වන අතර, ඒ පිළිබඳ පසු විපරම් කිරීම තුලින් ආයතනවල කාර්යක්ෂමතාව වර්ධනය කළ හැකි වේ.

## 05. පනත් කාලානුරූපීව සංශෝධනය නොවීම සහ ඒවාට අනුගත නොවීම.

ඇතැම් ආයතනයන්හි ස්ථාපිත අරමුණු, අපේක්ෂිත කාර්යයන් හා එම ආයතන විසින් කරනු ලබන ඇතැම් කාර්යයන් අතර නොගැලපීමේ අවස්ථා පැවති බව අනාවරණය විය.

නිදසුන් ලෙස රේගු දෙපාර්තමේන්තුව මගින් 1989 අංක 13 දරන නිෂ්පාදන බදු ( විශේෂ විධි විධාන) පනත පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු සලසාගෙන නොතිබූ බැවින්, රටට ලැබිය යුතු විශාල බදු ආදායමක් අහිමි වන අතර, සුරාබදු දෙපාර්තමේන්තුව මගින් දුම්කොළ බදු පනතේ ඇතැම් බලතල ක්‍රියාත්මක කිරීම ද සිදු කර නැත.

පවතින අණ පනත් වලට ආයතනය අනුගත වීම අත්‍යවශ්‍ය කරුණක් වන අතර යම් පනත් සංශෝධනයක් අවශ්‍යවන්නේ නම් ඒ සඳහා කඩිනම් පියවර ගතයුතු වේ.

## 06. රාජකාරිමය වගකීම් සහ ලිපි ලේඛන භාර දීම නිසියාකාරව සිදු නොවීම.

රාජ්‍ය නිලධාරීන්ගේ සේවා ස්ථාන මාරුවීම් සිදු කිරීමේ දී, යම් ආයතනයකට අනුයුක්ත වන නව නිලධාරීන්ට අදාළ රාජකාරිමය වගකීම් සහ ලිපි ලේඛන භාර දීම නිසියාකාරව සිදු නොවන බවත්, ඒ හේතුවෙන් කාරක සභාව ඉදිරියට නව නිලධාරීන් කැඳවීමේ දි අදාල විගණන විමසුම් සඳහා පිළිතුරු දීමේ නොහැකියාව සහ ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව දැනුම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වූ අතර, ඒ හේතුවෙන් ආයතනය තුල සිදුවන්නා වූ යම් අක්‍රමිකතා නිවැරදි කර ගැනීම සඳහා අවබෝධයෙන් යුතුව කටයුතු කිරීමේ අපහසුතාවයන් පවතින බව නිරීක්ෂණය විය.

මේ සඳහා ලිපි ලේඛන හා වගකීම් භාරදීමේදී, ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ලිඛිතව මෙම කටයුතු සිදුවිය යුතු අතර, ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ නව නිලධාරියාට නිසි අවබෝධයක් ලබාදීම වැදගත් වේ.

## 07. අභ්‍යන්තර පරීක්ෂණ සිදුකිරීමේ ක්‍රියාවලිය දුර්වල වීම.

ආයතන තුල සිදුවන දූෂණ, අක්‍රමිකතා, රාජ්‍ය මුදල් අවභාවිතය මෙන්ම දුර්වල කළමනාකරණ සහ පරිපාලන කටයුතු පිළිබඳ බාහිර ආයතන මගින් ( උදා: පොලිසිය මගින්) පරීක්ෂණ සිදු කරන අවස්ථා තිබුණ ද , ආයතනික අභ්‍යන්තර පරීක්ෂණ සිදු නොවන හෝ ඒවා නිසියාකාරව සිදු නොවන අවස්ථා කාරක සභාවට නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ආයතනික වශයෙන් සිදුවන වැරදි හා දුර්වලතා වලට බලපා ඇති ව්‍යුහාත්මක හා ඓන්ද්‍රිය අඩුපාඩු හඳුනාගෙන ඒවා නිවැරදි කරගැනීමට පවතින අවස්ථා නොලැබී යනු ඇත. මෙම තත්වයන් නිරාකරණය කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඍජු මැදිහත්වීම මගින් වඩාත් නිවැරදි සහ විධිමත් ආකාරයෙන් අභ්‍යන්තර පරීක්ෂණ කඩිනම්ව සිදුකිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සැකසිය යුතු බව කාරක සභාව අවධාරණය කරයි.

## 08. රාජ්‍ය නිලධාරීන්ගේ රැකියා සුරක්ෂිතභාවය

රාජ්‍ය නිලධාරීන්ට එල්ල වන දේශපාලන හෝ වෙනත් බලපෑම් හේතුවෙන් රාජ්‍ය මුදල් අවභාවිතයේ යෙදවීමට සිදුවූ අවස්ථාවල දී එම නිලධාරීන් විසින් තම රාජකාරිය නිසියාකාරව ඉටු නොකිරීම පිළිබඳ කාරක සභාවට නිරීක්ෂණය විය. එමෙන්ම තම වගකීම් ඉටුකිරීමේ දී රාජ්‍ය නිලධාරීන්ට ලැබිය යුතු නීතිමය හා පරිපාලනමය ආරක්ෂාව සහතික කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම වැදගත් වන බව කාරක සභාව අදහස් කරයි.

## 09. සේවය අත්හැර යාමේදී මුදල් /උපකරණ/ වත්කම් අයකර ගැනීමේ දුර්වලතා.

රාජ්‍ය සේවකයන් සේවයෙන් විශ්‍රාම ගැනීම, සේවයෙන් පහ කිරීම , මරණයට පත්වීම සහ සේවය අතහැර යන අවස්ථාවල දී රජයට අයවිය යුතු මුදල් / උපකරණ / වත්කම් අයකර ගැනීම නිසියාකාරව ඉටු නොවන බව නිරීක්ෂණය විය.

මේ සම්බන්ධව පොදු වැඩපිළිවෙලක් හා නීති පද්ධතියක් සම්පාදනය කිරීම මෙන්ම නීතිය දැඩිව ක්‍රියාත්මක කිරීම ද කළ යුතුවේ.

## 10. මුදල් අමාත්‍යාංශය (මහා භාණ්ඩාගාරය) මඟින් සිදු කරන පසු විපරම් ක්‍රියාමාර්ග.

ඇතැම් අවස්ථාවල දී යම් නිශ්චිත කාර්යයක් සඳහා ආයතනයකට වෙන් කරනු ලබන ප්‍රතිපාදන වෙනත් කාර්යයන් සඳහා යොදා ගන්නා අවස්ථා නිරීක්ෂණය විය.

රාජ්‍ය ආයතන සඳහා මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන වෙන් කිරීමෙන් අනතුරුව, ඒ පිළිබඳ පසු විපරම් කිරීම අත්‍යාවශ්‍ය කරුණක් බව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව අවධාරණය කරයි. මෙමඟින් මුදල් අවභාවිතය වැළැක්වීම මෙන්ම, නිසි ආකාරයෙන් අවශ්‍ය කාර්යයන් අදාළ කාලවකවානුවේ දී නියමිත පරිදි ඉටු කර ගැනීමට හැකි වනු ඇත.

## 11. සේවක පුරප්පාඩු පිරවීම ප්‍රමාද වීම.

ආයතනවල පුරප්පාඩු දිගු කාලීනව පැවතීම හේතුවෙන්, එම ආයතනවල කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා බාධා ඇති කරන බවත්, ඇතැම් අවස්ථා වලදි කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවාගෙන දීර්ඝ කාලීනව විශාල වියදමක් දරා කටයුතු කර ඇති බවත් නිරීක්ෂණය විය.

ආයතන වල පුරප්පාඩු පිරවීමේදී, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ අදාළ ආයතන ඒකාබද්ධව කඩිනම් සහ ක්‍රමානුකූල වැඩපිළිවෙලක් ආරම්භ කිරීම අත්‍යවශ්‍ය වේ. එසේම වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේ දී ආයතනයේ අපේක්ෂිත ඉලක්ක සහ අරමුණු කෙරෙහි අවධානය යොමු කරන්නා සේම අපේක්ෂිත මානව සම්පත කෙරෙහි ද අවධානය යොමු කිරීම වැදගත් වේ.

## 12. ප්‍රතිපාදන/සම්පත් ඌන උපයෝජනය

බොහෝ ආයතනවල වාර්ෂික ප්‍රතිපාදන /සම්පත් ඌණ උපයෝජනයක් පවතින බව දක්නට ලැබුණු අතර, මෙමගින් රටේ සංවර්ධන ක්‍රියාදාමයට සෘණාත්මක බලපෑම් ඇති වන බව නිරීක්ෂණය විය.

මෙම තත්වය වලක්වා ගැනීම සඳහා ආයතනයේ අරමුණු සහ ඉලක්ක මුල් කරගනිමින්, විශේෂඥ දැනුම ද උපයෝගී කර ගෙන, කෙටි කාලීන හා දිගු කාලීන ක්‍රියාකාරී සැලසුම් සකස් කළ යුතුවේ.

එසේම, අනපේක්ෂිත සිදුවීම් හේතුවෙන් ප්‍රතිපාදන ඌන උපයෝජනයක් ඇතිවේ නම්, ඒ පිළිබඳව මහා භාණ්ඩාගාරය දැනුවත් කර අවශ්‍ය පියවර ගත යුතු වන අතර, වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී අදාළ රාජ්‍ය මුදල් චක්‍රලේඛ වලට අනුගත වෙමින්, ක්‍රියාකාරී සැලසුම් කෙරෙහි ද අවධානය යොමු කිරීම වැදගත් වේ .

## 13. රඳවා ගත් මුදල් බේරුම් කිරීමේදී ගැටලු ඇතිවීම. (Retention Balances)

කොන්ත්‍රාත් පදනම මත කටයුතු ඉටුකර ගනු ලබන අවස්ථාවලදී, ආයතන විසින් රඳවා ගනු ලබන මුදල් බේරුම් කිරීමේදී කොන්ත්‍රාත් කටයුතු අතරමග නවතා යාම සහ අදාළ කාලපරිච්ඡේදය තුළ දී අවසන් නොකිරීම වැනි හේතූන් නිසා නොයෙකුත් ගැටළුකාරී තත්ත්වයන් උද්ගත වන බව නිරීක්ෂණය විය.

කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමේ දී ඔවුන්ගේ වෘත්තීමය පළපුරුද්ද, කාර්යමය ධාරිතාවය සහ විශ්වාසනීයභාවය කෙරෙහි සැලකිලිමත් විය යුතු අතර ගිවිසුම් වලට එළඹීමේ දී එහි ඇතුලත් කරනු ලබන කරුණු වල නීත්‍යානුකූලභාවය සහ එහි අඩංගු කොන්දේසි කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු මෙන්ම මේ පිළිබඳව පොදු ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු වේ.

## 14. විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම ප්‍රමාණවත් නොවීම.

විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයිම නියමිත කාල පරාසයක් තුල සිදු නොකරන බවත්, ඇතැම් විගණන විමසුම් සඳහා පිළිතුරු නොලැබෙන බවත්,බොහෝ විමසුම් සඳහා විගණකාධිපති සෑහීමකට පත්වන ආකාරයෙන් හෝ පිළිතුරු නොලැබෙන බවත් නිරීක්ෂණය විය.

නියමිත කාල සීමාව තුල දී අදාළ විගණන විමසුම් පිළිබඳව නිසියාකාරව අවධානය යොමු කොට, නිවැරදි පිළිතුරු විගණකාධිපතිවරයා වෙත යැවීමට ආයතන ප්‍රධානින් වග බලා ගත යුතු අතර ආයතන වල අභ්‍යන්තර විගණන අංශයක් තිබීම ද මේ සඳහා වැදගත් වේ.

## 15. ප්‍රමාණවත් විගණන කමිටු රැස්වීම් නොපැවැත්වීම.

අංක DMA/2009 (1) හා 09/06/2006 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අනුව වාර්ෂික රැස්වීම් වාර 4 ක් අනිවාර්යයෙන් පැවැත්විය යුතු වුවත් බොහෝ ආයතන වල එසේ සිදු නොවන බව නිරික්ෂණය විය.

කළමනාකරණ විගණන කමිටු වාර්තා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කිරීම අනිවාර්යය බැවින්, මෙන්ම එමගින් ආයතනයන් හි අඩුපාඩු දුර්වලතා වටහා ගෙන ඒ සඳහා නොපමාව අවශ්‍ය පියවර ගැනීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට හැකි වන බැවින් වාර්ෂිකව අවම වශයෙන් රැස්වීම් 4 ක් පැවැත්වීම අවශ්‍ය වේ.

## 16. පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සතු බලතල ප්‍රමාණවත් නොවීම.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125 අනුව කාරක සභාවට දැඩි නියෝග දීමේ හැකියාවක් නොමැති බැවින්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් දෙනු ලබන නිර්දේශ එතරම් ඵලදායී ලෙස ක්‍රියාත්මක නොවන ඇතැම් අවස්ථා නිරීක්ෂණය විය. එබැවින්, කාරක සභාව වෙත පවතින බලතල වැඩි කිරීම සඳහා ස්ථාවර නියෝග සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය බව කාරක සභාව නිර්දේශ කරයි.

# විශේෂිත නිරීක්ෂණ

## සේවක අර්ථ සාධක අරමුදල.

සමහර අවස්ථාවල දී සේවක අර්ථ සාධක අරමුදල සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුව හා මහ බැංකුව අතර පවතින අන්තර් සම්බන්ධතාවය, අවබෝධය සහ සහයෝගය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

කම්කරු දෙපාර්තමේන්තුව හා මහ බැංකුව ඒකාබද්ධ කමිටුවක් මඟින් අන්තර් සම්බන්ධතාවයන් වැඩි දියුණු කර ගැනිම අවශ්‍ය වේ.

කම්කරු දෙපාර්තමේන්තුව විසින් අදාල ආයතනයන්හි තොරතුරු ලබා ගන්නා ක්‍රමවේදය වන කම්කරු නිලධාරීන් විසින් සිදු කරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂණ මඟින් තොරතුරු ලබා ගැනීමට අමතරව ආයතන හා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල අතර එකිනෙකට සම්බන්ධ පරිගනක ජාලයක් මගින් තොරතුරු එක්රැස් කිරීම වැදගත් වේ.

සේවක අර්ථ සාධක අරමුදල වඩා ඵලදායී අන්දමින් ආයෝජනය කිරීමට හැකිවන පරිදි වැඩ පිළිවෙලක් සැකසීම ප්‍රයෝජනවත්වේ.

## කම්කරු  දෙපාර්තමේන්තුව.

සේවකයින්ට අනතුරක් සිදුවූ අවස්ථාවක වන්දි ගෙවීම පිළිබඳ පැහැදිළි ක්‍රමවේදයක් අදාළ පනතේ සඳහන් නොවන බවත්, අනතුර සිදුවූ අවස්ථාව අනුව වන්දි ලබා දීම / ලබා නොදීම සිදුවන බවත් අනාවරණය විය.

සේවා ලාභීන්ට වඩාත් ප්‍රතිලාභ ලැබෙන පරිදි, අදාළ පනත් සංශෝධනය විය යුතු බව කාරක සභාවට නිරීක්ෂණය විය.

සේවකයෙකුට යම් අනතුරක් සිදු වූ අවස්ථාවකදී ඔහුගේ /ඇයගේ යැපෙන්නන්ට වන්දි මුදලක් ලබා ගතහැකි බවට වන දැනුවත් භාවය මඳ බව අනාවරණය වූ අතර, රාජ්‍ය ආයතනවල ක්‍රියාත්මක වන මෙවැනි කාර්යයන් පිළිබඳ උපදෙස් පත්‍රිකා මඟින් හෝ විකල්ප ක්‍රමවේදයන් මඟින් ජනතාව දැනුවත් කළ යුතුවේ.

## ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව.

නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) පනත වැනි පවතින පනත් සහ රෙගුලාසි කාලානුරූපීව වෙනස් නොවීම හේතුවෙන්, රජයට අය විය යුතු ආදායම් අහිමි වන අවස්ථා නිරීක්ෂණය විය. එබැවින් පවතින අඩුපාඩු වලක්වා ගැනීම සඳහා අදාළ පනත් සංශෝධනය කළ යුතු අතර, රේගු දෙපාර්තමේන්තුව මෙන්ම ඒ හා සම්බන්ධ අනෙකුත් ආයතනද ඒකාබද්ධ වන පරිදි පරිගණක තොරතුරු දත්ත පද්ධති ජාලයක් ඇති කිරීම මඟින් පවතින අඩුපාඩු අවම කර ගැනීමට හා ඒ තුළින් රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමටද අවස්ථාව සැලසේ.

### රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

භාෂා පරිවර්තක සේවය පවතින තත්ත්වයට වඩා ඇගයීමට ලක් කළ යුතු අංශයක් බව හඳුනාගත් කාරක සභාව ඒ කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් බවත්, ජාතික භාෂා පරිවර්තක සේවයක් ඇති කිරීම කාලීන අවශ්‍යතාවයක් වන බවත් නිරීක්ෂණයට ලක් කරන ලදි.

**ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව.**

2010 සිට 2016 මාර්තු දක්වා පැවති සහකාර අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු පුරවා නොමැති බවත් දිගු කාලීනව පවතින (53% පමණ වූ) කාර්ය මණ්ඩල පුරප්පාඩු හේතුවෙන් ආයතනයේ කටයුතුවලට බාධා සිදු වී ඇති බවත් නිරීක්ෂණය විය.

මෙවැනි අවස්ථාවල දී ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් , වැටුප් කොමිසම ඇතුළු අදාළ සියළුම අංශ ඒකාබද්ධව කඩිනම් පියවර ගත යුතු අතර අදාළ විෂය භාර අමාත්‍යවරයා දැනුවත් කිරීම ද වැදගත් වේ.

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.**

විදේශයන්හි පවතින ඉල්ලුම කෙරෙහි අවධානය යොමු කර සාම්ප්‍රදායික අපනයනයන්ට අමතරව අපනයන කෘෂි කාර්මාන්තය විවිධාංගීකරණය මඟින් විදේශ විනිමය වර්ධනය කර ගත හැකි වන බැවින්, ඒ පිළිබඳ රජයේ අවධානය යොමු විය යුතු අතර, ඒ සඳහා කටයුතු කිරීමේ දී, පවතින නීතිවලට පටහැනි නොවන පරිදි හෝ නොඑසේනම්, නව නීති සම්පාදනය කිරීම හෝ කළ යුතුවේ. උදාහරණයක් ලෙස වල්ලපට්ටා වැනි වගාවන් ප්‍රවර්ධනය කෙරෙහි ද අවධානය යොමු කිරීම වැදගත් වේ.

**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

ලිපිගොනු නඩත්තුව, පවත්වාගෙන යාම , ගබඩා කිරීම ඉතාමත් අවිධිමත් සහ වගකීම් විරහිත ආකාරයෙන් සිදු කිරීමත්, විගණකාධිපතිවරයාගේ විගණන කටයුතු සඳහා අවශ්‍ය ලිපිගොනු ඉදිරිපත් නොකිරිමත්, ලිපිගොනු අස්ථාන ගතවීමත් නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳව කමිටුවේ බලවත් අප්‍රසාදය පළ විය. මේ හේතුවෙන් විගණන ක්‍රියාවලියට බාධා ඇතිවීම සමඟ වංචා, දූෂණ හා අක්‍රමිකතා ඇති විමට ඉඩ ප්‍රස්ථා නිර්මාණය වන බව කමිටුව අවධාරණය කරයි. විගණන විමර්ශන කටයුතු සඳහා විගණකාධිපතිවරයා විසින් ලිපිගොනු 597 ක් ඉල්ලුම් කර තිබුණ ද එම ප්‍රමාණයෙන් විගණනය සඳහා ලබා දී තිබුණේ ලිපිගොනු 33 ක් පමණි. (ඇමුණුම අංක 3)

විශාල පිරිවැයක් යොදවා ආරම්භ කර තිබූ ඊ- මෝටරින් ව්‍යාපෘතිය කඩිනම් නොකිරීමෙන් ශ්‍රී ලංකා රේගුව වැනි ආයතනවල පරිගනකගත ලේඛන, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ක්ෂණිකව ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් වාහන ලියාපදිංචි කිරීමේ දී ව්‍යාජ ලේඛන භාවිතා කොට වංචනික කටයුතු සිදු කර ඇති බව කාරක සභාවට නිරීක්ෂණය විය.

**විභාග දෙපාර්තමේන්තුව**

මෙම දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය සාධන ක්‍රියාවලිය සතුටුදායක මට්ටමක පවතී. පරිගනක දත්ත වැඩසටහන, ඉදිරි විභාග සැලසුම්, නවීන තාක්ෂණ ක්‍රම උපයෝගී කරගැනිම සහ විශ්වසනීය ආකාරයෙන් විභාග පැවැත්වීම යන කරුණු ධනාත්මක වර්ධනයක් පෙන්වයි. මේ පිළිබඳව එම දෙපාර්තමේන්තුවට කාරක සභාවේ ප්‍රශංසාව හිමි වේ.

**තක්සේරු දෙපාර්තමේන්තුව**

තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 87 ක් අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 34 ක් පුරප්පාඩුව පැවතීම දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තා ප්‍රමාද වීමට හා වන්දි ලබා දීමේ කටයුතු වල ප්‍රමාදයට හේතු වී ඇත. මෙමගින් ජාතික සංවර්ධන වැඩ කටයුතු වලට සිදුවන ප්‍රමාදයන් පිළිබඳව කාරක සභාව විසින් අවධානය යොමු කරන ලදි. එනමුත් පවතින සේවක පුරප්පාඩු හමුවේ වුව ද සමස්ත කාර්යය සාධනය ධනාත්මක තත්වයේ පවත්වාගෙන යාමට දෙපාර්තමේන්තුව සමත් වී ඇත.

**2016 වර්ෂය තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම් වලදී විමර්ශනය කරන ලද ප්‍රධාන ගැටලු සහ නිරීක්ෂණ**

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| **ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව**<br>**2016 ජනවාරි 09** | | |
| 1 | 2015 ජුලි 30 දිනට රාජ්‍ය ආයතන වලින් දෙපාර්තමේන්තුවට ලැබිය යුතු රු.18,865,901,197/-ක හිඟ බදු ආදායම අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග | මෙම හිඟ මුදල් අයකරගැනිම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ආරම්භකර ඇති බවත්, නව අයවැය යෝජනා ක්‍රියාත්මක කිරිමත් සමග ඉදිරියේදි එවැනි ගැටලු ඇති නොවන බවත් ප්‍ර.ග.නි. සඳහන් කළේය. |
| 2 | මෝටර් රථ අමතර කොටස් එකලස් කරන සමාගමකින් 2003-2006 කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු.4,362,899/- ක මුළු බදු මුදලින් රු.2,181,449/- පමණක් ගෙවා තිබියදීත් අදාල සමාගමට සම්පුර්ණ මුදල සඳහාම බදු සහන ලබා දී තිබිම. | අයවිය යුතුව තිබූ සම්පූර්ණ මුදල දැනට අයකරගෙන ඇති බව ග.නි. සඳහන් කළේය. එම අයකරගැනිම් සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ග.නි. හට නියෝග කරන ලදී. |
| 3 | බැංකු ඇපකරයක් මත වාහන වැසි 269 ක් ආනයනය කර තිබූ සමාගමකින් නිෂ්පාදන බදු වශයෙන් ගෙවීමට ඇති රු. මිලියන 9.02 මුදල අයකර නොගැනීම. | වාහන විකිණීමේ දී අදාල බදු මුදල රේගු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය වන ආකාරයට අය කර ගැනීමට කටයුතු කර ඇති අතර, එම වාහන ලියාපදිංචි කිරිම සම්බන්ධයෙන් දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු කටයුත්තක් ද පවතින බව ග.නි. ප්‍රකාශ කරන ලදි. |
| 4 | මාණ්ඩලික නිලධාරින් 210 ක් විසින් නියමිත දිනයට වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොමැත. | එම නිලධාරීන්ගේ නාම ලේඛනයක් කාරක සභාවට සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමට ලබා දෙන ලෙස ග.නි.ට නියෝග කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව<br>2016 ජනවාරි 09** | | |
| 1. | 2013 පෙබරවාරි සහ 2015 ඔක්තෝම්බර් කාල පරිච්ඡේදය තුල විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදිමේ සිදුව ඇති ප්‍රමාදය. | ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිකම හේතුවෙන්, ලිපිගොනු ක්‍රමවත්ව ගබඩා කිරීම සහ නඩත්තු කිරීම සිදුවී නොමැති බැවින් අවශ්‍ය තොරතුරු සපයා ගැනීමේ ප්‍රායෝගික අපහසුතාවය මත මෙම තත්ත්වය ඇති වූ බව ප්‍ර.ග.නි. පැවසීය.<br>මෙම පිළිතුර පිළිබඳව කාරක සභාව විසින් දැඩි අප්‍රසාදය පළ කරන ලදි. |
| 2 | වාහන 597 ක තොරතුරු ඇතුලත් ලිපිගොනු අස්ථාන ගතවීම. | මේ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරින්ට එරෙහිව අමාත්‍යාංශ මට්ටමේ පරික්ෂණයක් පැවැත්විය යුතු බවත්, ඒ පිළිබඳ වාර්තාවක් 2016 ජනවාරි 31 දිනට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසත්, අදාල වාහන තොරතුරු සහිත ගොනු වහාම විගණකාධිපතිවරයාට ලබාදීමට කටයුතු කරන ලෙසත්, කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. |
| 3. | ඊ-මෝටරින් ව්‍යාපෘතියේ වර්තමාන තත්වය සහ එය ක්‍රියාවට නැංවීම ප්‍රමාද වීම. | තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ ප්‍රමාදයත් ප්‍රසම්පාදන කමිටුවේ යම් හේතු නිසාත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වූ බවත් 2009-2015 කාල සීමාවේ ඒ සඳහා රු.මිලියන 740 වෙන් කරනු ලැබුවත්, වැය විෂය මාරුකොට, ඒ මුදල් දෙපාර්තමේන්තුවේ වෙනත් කාර්යයන් සඳහා යොදාගත් බවත් ප්‍ර.ග.නි.පැවසීය.<br>දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාවය පිළිබඳව කාරක සභාවේ අප්‍රසාදය පළ වූ අතර, එම වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව කාල වකවානු සහිත සවිස්තරාත්මක වාර්තාවක් 2016 |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ජනවාරි 31 දිනට පෙර ලබාදෙන ලෙස ප්‍ර.ග.නි.ට නියෝග කළේය. |
| 4. | වාහන 5494 ක් ලියාපදිංචි කිරීමේදී සිදුව ඇති විවිධ අක්‍රමිකතා, දූෂණ, වංචා සහ ඊට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියා මාර්ග . | මෙයට වගකිව යුතු නිලධාරීන් සේවා ස්ථාන මාරුවීම්වලට ලක්කර ඇති අතර, ඔවුනට එරෙහිව පරීක්ෂණ ක්‍රියාවලිය සිදුවෙමින් පවතින බව ප්‍ර.ග.නි./ග.නි.පැවසීය.<br><br>අදාල වාහන 5494 ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් 2016 ජනවාරි 31 දිනට පෙර කාරක සභාව වෙත ලබාදෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි.හට නියෝග කරන ලදි. |
| 5. | ස්මාට් කාඩ් නව රියදුරු බලපත්‍ර සඳහා සැපයුම්කරු වෙත වැඩිපුර ගෙවා ඇති රු.37,303,979/-ක මුදල යළි අයකරගැනීමට දෙපාර්තමේන්තුව ගෙන ඇති ක්‍රියාමාර්ග. | එම කරුණ සඳහා නීතිපති උපදෙස් ලබාගැනීමට කටයුතු කර ඇති බව ප්‍ර.ග.නි. පැවසීය. ඒ පිළිබඳව යළි විමර්ශනයක් සිදුකර කාරක සභාවට වාර්තා කරන ලෙස විගණකාධිපතිට දන්වන ලදි. |
| 6. | තීරු බදු අඩුවෙන් ගෙවා ලියාපදිංචි කර ඇති ප්‍රාඩෝ වර්ගයේ මෝටර් රථ 5 ක් සම්බන්ධයෙන් ගෙන ඇති පියවර. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් අදාල ලිපිගොනු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් නොකිරීම නිසා පරීක්ෂණ කටයුතු අත්හිටුවීමට සිදුව ඇති බව එම දෙපාර්තමේන්තුව විසින්, 2016.01.02 දිනැති ලිපියෙන් දැනුම් දී ඇති බව විගණකාධිපතිවරයා කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදි.<br><br>අදාල වාහන අසාධු ලේඛන ගත කිරීමට කටයුතු කර ඇති අතර එම වාහනවල අයිතිය නැවත පැවරීමේ ක්‍රියාවලිය අත්හිටුවා ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 7. | වගකිවයුතු නිලධාරින්ගේ නොසැලකිල්ල සහ අකාර්යක්ෂමතාව හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු | නවීන තාක්ෂණික උපකරණ භාවිතය අවම වීම, මානව සම්පත් හිඟ කම සහ අකාර්යක්ෂමතා වැනි කරුණු සඳහා දැඩි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | අසතුටුදායක තත්ත්වයක පවතින බව කාරක සභාවට අනාවරණය විය. | අවධානය යොමු කළ යුතු බව කාරක සභාව අවධාරණය කළේය.<br><br>විගණකාධිපතිවරයා සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් දෙපාර්තමේන්තුවේ කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාමට විශේෂ අවධානය යොමු කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි ට නියෝග කරන ලදි. |
| 8. | 1. මෝටර් රථවාහන වර්ගීකරණයේදි භාවිතාවන නිර්ණායක<br><br>2. 2010-2015 කාලය තුල එම වර්ගීකරණය මත ලියාපදිංචි කරන ලද වාහන සංඛ්‍යාව<br><br>3. 2010-2015 කාලය තුල නිකුත් කරන ලද රියැදුරු බලපත්‍ර සංඛ්‍යාව<br><br>4. 2010-2015 කාලය තුල දෙපාර්තමේන්තුවේ ආදායම් හා වියදම් | මේ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් 2016 ජනවාරි 31 දිනට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. හට නියෝග කරන ලදි. |
| | **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**<br><br>**2016 ජනවාරි 26** | |
| 1 | 2010-2014 කාල පරිච්චේදය තුල ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් අතර වෙනස අවුරුදු 5 ක කාලයක් තුළ අසාමාන්‍ය ලෙස වැඩිවීමක් නිරික්ෂණය විය. | ඒ සම්බන්ධයෙන් ප්‍ර.ග.නි./ග.නි.ඉදිරිපත් කළ කරුණු පිළිබඳව සෑහීමට පත් නොවූ කාරක සභාව, අදාල වෙනස සිදු වී ඇති ආකාරය සවිස්තරාත්මකව කාරක සභාවට වාර්තා කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. |
| 2 | දෙපාර්තමේන්තුව සමග අනෙකුත් ආයතන සම්බන්ධ වන ඒකාබද්ධ පරිගනක තොරතුරු ජාලය. | පරිගනක ජාලයට ඇතුලත් කිරිම සඳහා දෙපාර්තමේන්තු හා ආයතන 23 ක් හඳුනාගෙන ඇති බවත්, දැනට එම කටයුතු සිදුකෙරෙමින් පවතින බවත් ඇතැම් ආයතන වෙතින් ඒ සඳහා ප්‍රමාණවත් සහයක් නොලැබෙන බවත් ප්‍ර.ග.නි. /ග.නි. සඳහන් කළේය. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | | අනෙකුත් ආයතන මේ සඳහා දක්වන ප්‍රතිචාර සහ එම ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය පිළිබඳව වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. |
| 3 | වාර්ෂිකව හිඟ බදු වැඩිවීමේ ප්‍රවණතාවයක් පෙන්වමින් 2014 දි එය රු.බිලියන 210 දක්වා වර්ධනය වීම සහ එම බදු අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියා මාර්ග | මෙම බදු අයකර ගැනීමට, කපාහැරීමට, හෝ පවතින නීති රාමුව තුළ ඒවා නිරවුල් කිරීමට, කමිටුවක් පත් කර නිසි අධ්‍යයනයකින් පසු සුදුසු පියවර ගන්නා ලෙස ප්‍ර.ග.නි./ග.නි හට නියෝග කරන ලදි. |
| 4 | දෙපාර්තමේන්තු පරිගනක පද්ධතිය ව්‍යාජ ලෙස වෙනස් කර බදු ලිපිගොනු 8 ක් මගින් රු.203,908,352/- ක මුදල් අක්‍රමිකතාවයක් සිදුකර චෝදනා ලැබ වැඩ තහනමට ලක් වූ නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවීම. | එම නිලධාරියා රාජ්‍ය සේවා කොමිසමේ නිර්දේශ මත නැවත සේවයේ පිහිටුවා ඇති බව ග.නි. සඳහන් කළ අතර, ඊට අදාළ පරිගනක වාර්තාවක් ලබා ගැනිමට කොළඹ විශ්ව විද්‍යාලයට අත්තිකාරම් ගෙවා ඇතත් නියමිත දිනට එම වාර්තාව ලැබී නොතිබිණි.<br><br>ඒ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් පෙබරවාරි 15 දිනට පෙර ලබා දෙන ලෙස නියෝග කරන ලදි. |
| 5 | 2009.12.31 ට පෙර බදු කරුවෙකුගෙන් අය විය යුතු, එකතු කල අගය මත හිඟ බදු රු.741,604,539/- ක මුදලක් 2015.12.04 දින වන විටත් අයකර නොතිබුණි. එක් ආයතනයකින් රු.99,990,865/- ක් හිඟ බදු තිබිය දී ඒවා හිලව් කිරීමකින් තොරව 2014/2015 වර්ෂයන් හි රු.125,449,380/- ක අගය මත එකතු කළ බදු ආපසු ගෙවීමක් සිදුකර තිබුණි. | මෙම ගනු දෙනු සම්බන්ධයෙන් විගණන විමසුම් නොලැබුණු බවත්, මේ පිළිබඳව වාර්තා දෙකක් කාරක සභාව වෙත එවීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි./ග.නි.සඳහන් කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **සුරාබදු දෙපාර්තමේන්තුව**<br>**2016 ජනවාරි 26** | | |
| 1 | 2015 ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රකාශිත ඉලක්ක ගත වැටලීම් ප්‍රමාණයට ළඟාවිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වීම. | 2016 මාර්තු මස අවසානය වන විට සේවක සංඛ්‍යාව සම්පූර්ණ කරගැනීමෙන් පසු එම ඉලක්ක වෙත ළඟාවීමට හැකිවෙතැයි ග.නි. ප්‍රකාශ කරන ලදි. |
| 2. | අනුමත කාර්ය මණ්ඩලයෙන් 416 ක් එනම් 28% ක් පුරප්පාඩුව පැවතීම. | පවතින පුරප්පාඩු වහාම සම්පූර්ණ කර කාරක සභාවට වාර්තා කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි.හට නියෝග කරන ලදි. |
| 3 | 2012, 2013 සහ 2014 යන වර්ෂවල සැර මද්‍යසාර නිෂ්පාදනය සහ සුරාබදු ආදායම් අඩුවීම. | අදාල වර්ෂවල මධ්‍යසාර නිෂ්පාදනය සහ දෙපාර්තමේන්තුවේ ආදායම් පිළිබඳව විශ්ලේෂණාත්මක වාර්තාවක් මසක කාලයක් තුල කාරක සභාවට ලබාදෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි හට නියෝග කරන ලදි. |
| 4 | 2015 ජූනි 30 දිනට හිඟව පැවති රු.1,451,468,886/= ක සුරා බදු 3% ක ප්‍රමාද ගාස්තුව සමග අයකර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය. | අදාල සමාගම් තුනට එරෙහිව අධිකරණය ඉදිරියේ නඩුවක් පවතින අතර, එක් සමාගමකින් අයවීම් සිදුකෙරෙමින් පවතින බවත් අනෙක් සමාගම් දෙක සමථයකට පැමිණීමට එකඟ වි ඇති බවත්, ග.නි.ප්‍රකාශ කළේය. |
| 5 | වාහන අනතුරු නිසා සිදු වී ඇති පාඩුව | අදාළ පාර්ශ්වයන් වෙතින් සිදුව ඇති පාඩු අයකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තාවක් කාරක සභාවට ලබාදෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි හට නියෝග කරන ලදි. |
| 6 | දුම්කොල බදු පනතේ ඇතැම් බලතල ක්‍රියාත්මක කිරිමට දෙපාර්තමේන්තුව අසමත් වීම. | අදාළ පනතේ බලතල විමර්ශනය කර ඒ පිළිබඳව වාර්තාවක් මසක් ඇතුලත ලබාදෙන ලෙස ප්‍ර.ග.නි/ග.නි හට නියෝග කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 7. | දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සලකා බැලීමේදී පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කර නොමැති බව නිරික්ෂණය විය.<br>- සියළුම සුරාබදු මධ්‍යස්ථාන සහ දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශය අතර ස්වයංක්‍රීය සම්බන්ධතාවයක් ඇතිකිරිම.<br>- ස්වයංක්‍රීයව බලපත්‍ර නිකුත්කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.<br>- ස්වයංක්‍රීයව සුරාබදු ආදායම් එකතු කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.<br>- බලපත්‍ර අංශය හා සුරාබදු මධ්‍යස්ථාන වෙතින් යථාවත් කරන ලද තොරතුරු ලබා ගැනිමේ ක්‍රමවේදයක් ඇතිකිරීම. | මෙම කරුණු සලකා බැලීම සඳහා කමිටුවක් පත් කර ඇති බව ග.නි. පැවසීය. |
| 8. | සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අනුමත හෝටල් පරික්ෂා කිරීම දුර්වල මට්ටමක පැවතීම. | මාණ්ඩලික මට්ටමේ නිලධාරීන් ප්‍රමාණවත් පිරිසක් නොසිටීම නිසා මෙම කාර්යය ක්‍රමවත්ව සිදුකිරීමට නොහැකි වූ බව ප්‍ර.ග.නි/ග.නි පැවසිය. |
| 9. | දෙපාර්තමේන්තුවේ කටයුතු නිසි පරිදි ඉටු කිරිම සඳහා පරිගනක දත්ත පද්ධතිය නවීකරණය කිරිම සහ ශ්‍රී ලංකා රේගුව, දේශිය ආදායම් වැනි දෙපාර්තමේන්තු අතර අන්තර් සම්බන්ධතාවයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවය කාරක සභාවේ අවධානයට ලක් විය. | පරිගනක දත්ත පද්ධති නවීකරණය විය යුතු බව සහ එම පද්ධතිය දේශීය ආදයම් දෙපාර්තමේන්තුව සහ රේගු දෙපාර්තමේන්තුවල පරිගනක දත්ත පද්ධති සමඟ සම්බන්ධ කිරීමෙන් කාර්යක්ෂමව හා නිවැරදිව කටයුතු කළ හැකි බව කාරක සභාව විසින් පෙන්වා දෙන ලදි.<br>පරිගනක ජාල පද්ධතිය වැඩි දියුණු කිරීමේ වැඩසටහන පිළිබඳ කාල වකවානු සහිත වාර්තාවක් මාසයක් ඇතුලත කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි හට නියෝග කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | **නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**<br>**2016 ජනවාරි 26** | |
| 1. | යොවුන් සේනාංක මධ්‍යස්ථාන 37 ක් සඳහා ආහාර සැපයීමේ ප්‍රසම්පාදන කටයුතුවලදී, අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් වෙත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9.1. ඡේදයට පටහැනිව රු.510,000/= වැඩිපුර ගෙවීම. | ඒ සම්බන්ධයෙන් වාර්තාවක් 2016 පෙබරවාරි 15 දිනට පෙර කාරක සභාවට ලබාදෙන ලෙස නියෝග කරන ලදි. |
| 2. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධි විධානයන්ට පටහැනිව ජාතික යොවුන් සේනාංකය වෙත කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබූ රජයේ විශ්‍රාමික නිලධාරින් 05 දෙනෙකුට ජීවන වියදම් දීමනා ලෙස ගෙවා තිබූ රු.516,500/= ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. | මේ සම්බන්ධයෙන් කාරක සභාවට වාර්තාවක් ලබාදෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි ට නියෝග කළේය. |
| 3. | 2010 නොවැම්බර් 22 දිනැති අංක 1681/03 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් තරුණ රැකියා ජාලය* අමාත්‍යාංශය යටතේ වෙනම ආයතනයක් ලෙස ස්ථාපිත කර නොමැතිව තිබියදී 2010-2013 කාලය සඳහා එය ක්‍රියාත්මක කිරීම පිණිස රු.3,550,000 /=ක ප්‍රතිපාදන වෙන් කර ඇත. | ඒ පිළිබඳ වාර්තාවක් කඩිනමින් කාරක සභාවට ලබාදෙන ලෙස ප්‍ර.ග.නි.ට නියෝග කරන ලදි. |
| 4. | 2014 මැයි මස පැවැත්වූ ජාත්‍යන්තර තරුණ සමුළුවට අමාත්‍යාංශය විසින් රු.647,197,048/= ක් සහ ජාතික තරුණ සේවා සභාවේ* 2015 වර්ෂයේ ප්‍රතිපාදන මගින් රු. 2,484,303/= ක් වැය කර ඇති අතර එහි ප්‍රධාන කාර්යයක් ලෙස එළි දැක්වූ තරුණයා පිළිබඳ කොළඹ | මේ පිළිබඳව සවිස්තර වාර්තාවක් මාසයක් ඇතුලත කාරක සභාවට ලබාදෙන ලෙස ප්‍ර.ග.නි.ට නියෝග කළ අතර කොළඹ ප්‍රකාශනයෙහි ඇතුලත් මූලික අරමුණු සහ ජාතික තරුණ සේවා සභාවේ අරමුණු ඒකාබද්ධ කරන ආකාරය පැහැදිලි කර වාර්තාවක් |

* වර්තමානයේ ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ පවතී.

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | ප්‍රකාශයෙහි ඇතුලත් මූලික අරමුණු අමාත්‍යාංශයේ තරුණ සංවර්ධන අංශයේ හෝ අනුබද්ධිත ආයතනවල ක්‍රියාකාරී සැලසුම්වල ඇතුලත් නොකිරීම සහ අරමුණු ඉටුවූවා ද යන්න පිළිබඳව පසුවිපරම් වැඩ පිළිවෙලක් නොතිබීම. | ලබාදෙන ලෙස තරුණ සේවා සභාවේ සභාපතිට දන්වන ලෙස නියෝග කරන ලදි. |
| 5. | 1994 මහජන ආරක්ෂක පනත මගින් තරුණ සුභ සාධන අරමුදල* නිෂ්ප්‍රභා වී දැනට අක්‍රිය තත්ත්වයේ පවතින අතර එම ආයතනයේ පහත අක්‍රමිකතා නිරීක්ෂණය විය.<br><br>1997-2012 කාල පරිච්ඡේදයේ ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොමැත.<br><br>රු.8,715,000/= ක වටිනාකමක් ඇති ඉඩම් ජාතික තරුණ සේවා සභාවට අත්පත් කරගෙන නැත.<br><br>1996 වර්ෂය වන විට මහ බැංකුව භාරයේ තිබූ වටිනාකම රු.27,502,301/= ක තක්සේරු කළ සහ නොකළ රන් ආභරණ ඒකක 877 ක් පරීක්ෂාවට ලක් කරන ලද අවස්ථාවේ දී භෞතිකව නොපැවතීම. | මෙම කරුණු සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි.ට නියෝග කරන ලදි. |
| 6. | ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ඇඹිලිපිටියේ පිහිටා ඇති නායකත්ව සංවර්ධනය පිළිබඳ ජාතික ආයතනය* පිහිටි ඉඩම සහ ගොඩනැගිල්ල පවරා ගැනීමට කටයුතු නොකිරීම පිළිබඳව කරුණු විමසන ලදි. | ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවීමට කාරක සභාව තීරණය කළේය. |
| 7. | රජයේ පාසල්වල උසස් පෙළ ට හඳුන්වා දුන් තාක්ෂණික විෂය ධාරාව මේ දක්වා අත්කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳව විමසන ලදි. | ඒ සඳහා දායක කරගත හැකි ආයතන, සුදුසුකම් සහිත ගුරුවරුන් සපයා ගැනීම ආදි කරුණු ඇතුලත් වාර්තාවක් කාරක සභාවට ලබා දෙන ලෙස ප්‍ර.ග.නි. ට නියෝග කරන ලදි. |

* වර්තමානයේ ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ පවතී

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 8. | නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහ යටතේ ඉදිකිරීමට යෝජිතව තිබූ විශ්ව විද්‍යාලායතනය සඳහා උපකරණ මිල දී ගැනීමට රු මිලියන 1,579ක කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණ ද රු. මිලියන 98.57 ක් වටිනා භාණ්ඩ පමණක් ලැබී තිබූ අතර, අමාත්‍යාංශය ඒ සඳහා ජාත්‍යන්තර තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමය වෙනුවට ජාතික තරඟකාරී මිල ගණන් කැඳවීමේ ක්‍රමය අනුගමනය කිරීම. | යෝජිත විශ්ව විද්‍යාලායතනයේ ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. ට නියෝග කරන ලදි. |
| | **අධ්‍යාපන අමාත්‍යාංශය**<br>**2016 ජනවාරි 27** | |
| 1. | විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ගේ ස්ථාන මාරු | විශේෂ අධ්‍යාපන ඒකක සඳහා ප්‍රාථමික ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කර ඇති බැවින් 2016 අවසාන වන විට එම ගැටලුව නිරාකරණය වන බව ප්‍ර.ග.නි. දැන්වීය.<br>ඒ අනුව කාරක සභාව පහත ක්‍රියා මාර්ග ගන්නා ලෙස නියෝග කරන ලදි.<br>i. ස්වේච්ඡා ගුරුවරුන් ස්ථිර කිරීමේ හැකියාව පිළිබඳව සොයා බැලීම.<br>ii. දෙමළ මාධ්‍ය ගුරු හිඟය විසඳීම.<br>iii. බස්නාහිර පළාතේ ගුරු හිඟය විසඳීම.<br>iv. පාසල් වල ගුරු අවශ්‍යතාවය සලකා බලා ස්ථාන මාරු කිරීම් සිදුකිරීම.<br>v. විෂයයන් අනුව ගුරු අවශ්‍යතාවය පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා දීම. |
| 2. | අමාත්‍යාංශයේ පරිගනක මෘදුකාංග යෙදවුමේ වර්තමාන තත්ත්වය | එහි දෙවන අදියරේ සංවර්ධන කටයුතු මොරටුව විශ්ව විද්‍යාලය වෙත බාර දී ඇති අතර 2016 අවසානය වන විට එම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කටයුතු අවසන් කිරිමට අපේක්ෂා කරන බව ප්‍ර.ග.නි.පැවසීය.<br><br>පරිගනක පද්ධතිය යාවත්කාලීන කර පළාත් කාර්යාලයන්හි දත්ත පද්ධති හා සම්බන්ධ කරන ලෙසත් දත්ත පද්ධතිය වැඩි දියුණු කිරීමේ වැඩසටහන පිළිබඳව පූර්ණ වාර්තාවක් 2016 පෙබරවාරි 12 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙසත් ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදි. |
| 3. | කොළඹ ආනන්ද, මාතර රාහුල සහ පන්නිපිටිය ධර්මපාල යන විද්‍යාලයන්හි විදුහල්පතිවරු සහ අනෙකුත් තැනැත්තන් විසින් සිදුකරන ලද වංචා සහගත කටයුතු සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග. | මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග ප්‍රමාණවත් නොවීම පිළිබඳව කාරක සභාවේ අප්‍රසාදය පළ විය.<br><br>සිද්ධීන් කිහිපයක් සම්බන්ධයෙන් චෝදනා පත්‍ර ගොනු කරමින් විනය ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. සඳහන් කළ අතර, එම වංචා සහගත ගනුදෙනු සම්බන්ධයෙන් විගණකාධිපති විසින් සිදුකරන විමර්ශනය හා එහි වර්තමාන තත්වය පිළිබඳව විගණකාධිපතිවරයාගෙන් සවිස්තරාත්මක වාර්තාවක් කැඳවන ලදි. |
| 4. | පාසැල් උසස් පෙළ විෂය ධාරාවට තාක්ෂණික විෂය හඳුන්වා දීම සහ එම විෂය ධාරව අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. | මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය ද කැඳවීමට තීරණය විය. |
| 5. | i.2005 වර්ෂයේ සිට මේ දක්වා වංචා සහගත ගණුදෙනුවල නියැලි විදුහල්පතිවරුන්ට විරුද්ධව ගෙන ඇති විනයානුකූල සහ නීතිමය ක්‍රියා මාර්ග<br><br>ii.මහින්දෝදය පාසල් 1000 සංවර්ධන වැඩසටහනට අනුමැතිය ලබා දුන් කැබිනට් පත්‍රිකාව, තාක්ෂණික ඇගයීම් | මෙම කරුණු පිළිබඳව මසක කාලයක් ඇතුලත කාරක සභාව වෙත සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. හට නියෝග කරන ලදි. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | කමිටු වාර්තාව සහ එහි සාමාජිකයින්, දින වකවානු සහ වැයකළ මුදල<br><br>iii. විද්‍යාගාර සඳහා මිල දී ගත් පරිගනක වල මිල ගණන්, ප්‍රසම්පාදන කමිටු නිර්දේශය සහ ඊට අදාල ගිවිසුම් හා ලිපිලේඛන<br><br>iv.තාක්ෂණික විෂය ධාරව හඳුන්වා දී ඇති පාසල්, තාක්ෂණික විද්‍යාගාර හා අධ්‍යාපනය ලබන සිසුන් ප්‍රමාණයන් සහ එය ප්‍රවර්ධනය සඳහා අමාත්‍යාංශය ගෙන ඇති සැලසුම්<br><br>v. කොරියානු රජය මගින් ලබා දී ඇති පාසල් ගොඩනැගිලි, ශිෂ්‍යත්ව ප්‍රමාණය, පියානෝ සහ අනෙකුත් උපකරණ ප්‍රමාණයන්<br><br>vi. කැබිනට් අනුමැතියකින් කොයිකා අරමුදල මගින් හෝමාගම ස්ථාපිත තාක්ෂණික අධ්‍යයන ආයතනය පිළිබඳව වර්තමාන තත්වය | |
| 6. | පාසල් පරිගනක විද්‍යාගාර සඳහා E-Wis සමාගමෙන් පරිගනක මිලදි ගැනීම. | මොරටුව විශ්ව විද්‍යාලයේ නිර්දේශය මත තාක්ෂණ ඇගයිම් කමිටුව විසින් අදාළ ආයතනය තෝරා ගත් බවත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය මත භාණ්ඩාගාරය විසින් අදාල ගෙවීම් සිදුකර ඇති බව ප්‍ර.ග.නි.ප්‍රකාශ කරන ලදි.<br><br>දේශිය නිෂ්පාදකයින් දිරිගැන්වීම සඳහා ජාත්‍යන්තර සන්නාම සහිත පරිගනක දේශිය නිෂ්පාදකයින් වෙතින් මිල දී ගන්නා ලෙසට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. |
| 7. | පස්යාල සිරිසඟබෝ විශේෂ අධ්‍යාපන විද්‍යාලය ලියාපදිංචි කිරීම ප්‍රමාද වීම සහ කිසියම් නිලධාරියෙකු ඒ සඳහා රු.ලක්ෂ | අදාළ පාසල ලියාපදිංචිය සඳහා අවශ්‍ය කටයුතු දැනටමත් සිදුකර ඇති බව ප්‍ර.ග.නි. පැවසිය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | 15 ක අල්ලසක් ඉල්ලා ඇති බව අනාවරණය වීම. | එහි වර්තමාන තත්ත්වය පිළිබඳව වාර්තාවක් කමිටුවට ලබා දෙන ලෙස කාරක සභාව විසින් නියෝග කරන ලදි. |
| 8. | රු.57,482,500/- ක මුදලක් 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව ආධාර ලෙස නොගෙවා පැවතීම. | පාසල් වෙතින් නිවැරදි තොරතුරු නොලැබීම මෙම ගෙවීම් නිසි පරිදි සිදු නොවීමට හේතු වී ඇති බව ප්‍ර.ග.නි. පැවසීය.<br><br>එම ගෙවීම් ප්‍රමාදයකින් තොරව සිදු කිරීමට දෙමව්පියන්ට පහසු වන ආකාරයේ වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ප්‍ර.ග.නි.වෙත යෝජනා කරන ලදි. |
| 9. | ජාතික පාසල් වල පවතින ඉංග්‍රීසි මාධ්‍ය ගුරු හිඟය. | ඉදිරි මාස 2 තුල දී අවශ්‍ය බඳවා ගැනීම් සිදුකරන බව ප්‍ර.ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි. |
| | **ඉඩම් අමාත්‍යාංශය**<br><br>**2016 පෙබරවාරි 27** | |
| 1 | රජය සතු සමස්ත ඉඩම් ප්‍රමාණය පිළිබඳ දත්ත | රජයේ ඉඩම් කළමනාකරණය සඳහා තොරතුරු දත්ත පද්ධතියක් සකසා ඇති අතර රජය සතු සමස්ත ඉඩම් ප්‍රමාණය ඉඩම් කට්ටි මිලියන 12 ක් පමණ වන බවත් 2016-2020 වැඩ සටහන යටතේ කැබලි මිලියන 6 ක දත්ත තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීම ඉලක්කය බවත් ප්‍ර.ග.නි. ප්‍රකාශ කරන ලදි.<br><br>රජය සතු සියලුම ඉඩම් පිළිබඳව වාර්තාවක් මාර්තු 31 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදි. |
| 2 | කාර්ය මණ්ඩල පුරප්පාඩු | මේ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. සඳහන් කරන ලදි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 3. | ඉඩම් අත්පත් කර ගැනීම. | මේ පිළිබඳව සංඛ්‍යාත්මක විග්‍රහයක් කිරිම දුෂ්කර බවත්, ඒ සඳහා පවතින අණ පනත් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය දන්වා යෝජනා ඉදිරිපත් කර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි.විසින් ප්‍රකාශ කරන ලදි. |
| 4. | ඉඩම් නොමැති අයට ඉඩම් බෙදා දීම සඳහා අමාත්‍ය මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය. | මේ පිළිබඳව රජය අවසන් එකඟතාවයකට පැමිණ නැති බව ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදි. |
| 5. | 2008-2012 දක්වා බිම් සවිය සඳහා ප්‍රතිපාදන ලෙස රු.මිලියන 3,350 ක් ලැබී තිබුණත් වැය කර ඇත්තේ මිලියන 1,980 පමණි. ඉලක්ක ගත හිමිකම් සහතික ප්‍රමාණය 650,000 වුවත් නිකුත් කර තිබූ ප්‍රමාණය 73,328 කි. | මෙම කාර්යය ඉටු කිරීම ආයතන කිහිපයක සාමූහික කාර්යයක් බවත්, යම් පාර්ශ්වයන්ගෙන් මතුවූ විරෝධතාවයන් නිසා ඉලක්කය සපුරා ගැනිමට නොහැකි වූ බවත්, ප්‍ර.ග.නි/ග.නි.ප්‍රකාශ කරන ලදි. |
| 6. | ගම්පහ රත්නාවලි බාලිකා විද්‍යාලයට ඉඩමක් අත්පත් කර ගැනිම සඳහා 2014 වර්ෂයේ ඇස්තමේන්තු ගත මුදල රු.3,250,000/= වුවත්, ඒ සඳහා රු.9,130,742/= ක අතිරේක මුදලක් වැය කර තිබීම. | මේ පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුව විමසා කාරක සභාව වෙත දන්වන ලෙස ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. |
| **ආගමන විගමන දෙපාර්තමේන්තුව**<br>**2016 ජනවාරි 28** | | |
| 1 | දෙපාර්තමේන්තුව තුළ පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් ලබා නොදීම නිසා කළමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු පවතින බව ප්‍ර.ග.නි/ග.නි පැවසීය. |
| 2 | දෙපාර්තමේන්තුව සඳහා වෙන් කර ඇති ප්‍රාග්ධන ප්‍රතිපාදන ඌන උපයෝජනය | එම මුදල් කාර්ය මණ්ඩලයට යටිතල පහසුකම් සැලසීම සඳහා සම්පූර්ණ වශයෙන් භාවිතා කර ඇති බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කරන ලදි. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| 3. | ද්විත්ව වීසා ගාස්තු ගෙවීම. | නියමිත කාල සීමාව තුල දී වීසා ඉල්ලුම් පත් ETA මගින් ඉදිරිපත් නොකිරීමත් ව්‍යාජ වෙබ් අඩවි හරහා ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමත් නිසා මෙය සිදුව ඇති බව ග.නි පැවසීය. |
| 4. | ඉලෙක්ට්‍රොනික ගමන් අවසර ක්‍රමයේ (Electronic Travel Authorization System) වෙබ් අඩවි නිර්මාණකරු ගිවිසුමට පටහැනි අයුරින් ඔවුන්ගේ නිල ලාංඡනය දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවේ ප්‍රචාරණය කිරීම සහ ගිවිසුම්ගත ගෙවීම් වූ රු.100,000/= ප්‍රමාණවත් නොවීම මෙන්ම එම මුදල අයකර නොගැනීම. | අදාළ ගිවිසුම් යළි සමාලෝචනය කිරීමට කටයුතු කරන ලෙසත් 2016 මාර්තු 01 දිනට පෙර එහි වර්තමාන තත්වය පිළිබඳව කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත් නියෝග කරන ලදි. |
| 5. | වීසා නොමැතිව විදේශිකයින් රට තුල රැඳී සිටීම වැලක්වීම. | ද්විත්ව ගමන් බලපත්‍ර හිමි පුද්ගලයන් පැමිණීම සහ පිටවීම සඳහා එකම ගමන් බලපත්‍රය පාවිච්චි නොකිරීම මෙයට හේතු වී ඇති බවත් නව පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය සහ ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය විසින් හඳුන්වා දී ඇති ප්‍රවර්ධන වැඩ පිලිවෙල ක්‍රියාත්මක කිරීමෙන් පසු මෙම තත්ත්වය වලක්වාගත හැකි බවත් ග.නි. පැවසිය.<br><br>එම වැඩපිළිවෙලේ ප්‍රගතිය පිළිබද වාර්තාවක් 2016.03.01 දිනට පෙර කාරක සභාවට ලබාදෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි.හට නියෝග කරන ලදි. |
| 6. | 2011 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි ද්විත්ව පුරවැසි වීසා සහතික ලබා දීම අත්හිටුවීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබියදීත් ආරක්ෂක ලේකම්වරයාගේ අනුමැතිය යටතේ 2014 වර්ෂය තුල 2,053 ක ද්විත්ව පුරවැසි විසා සහතික නිකුත් කර තිබීම. | 2015 මාර්තු මස සිට ද්විත්ව පුරවැසි වීසා සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 7. | මිනුවන්ගොඩ, ගලගෙදර ප්‍රදේශයේ රුඳවුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.3,927,479/= වැය කර ඉඩම් අත්පත් කර ගෙන තිබුණ ද එහි ඉදිකිරීම කටයුතු අත්හැර දමා තිබීම. | මහජන විරෝධතා නිසා මෙහි ඉදිකිරීම් කටයුතු අතහැර දමා ඇති බවත් ඒ සඳහා සුදුසු ඉඩමක් කටාන ප්‍රදේශයෙන් හඳුනාගෙන ඇති බවත් ග.නි. ප්‍රකාශ කළේය. |
| 8. | සාමාන්‍ය ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම . | ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කරන ලෙසත් මාසයක් තුල ඒ පිළිබඳව වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසත් දැන්වීය. |
| 09. | රු.15,456,000/= ක් වැය කර වීසා නිකුත් කිරීමේ අංශය වෙනුවෙන් රජයේ මුද්‍රණාලයෙන් සකස් කරන ලද ස්ටිකර් මිලියන 1.2 ක ප්‍රමාණයක් මුද්‍රණ යන්ත්‍රයක් නොමැති කම නිසා වසරක පමණ කාලයක් භාවිතයට නොගෙන තිබීම. | ස්ටිකර් මුද්‍රණ කටයුතු ආරම්භ කළ හැකි බව ග.නි.සඳහන් කළේය. |
| | **විභාග දෙපාර්තමේන්තුව**<br>**2016 ජනවාරි 28** | |
| 1. | ගුරුවරුන්ට ගෙවනු ලබන ඇගයීම් දීමනා සෘජුවම බැංකු ගිණුම්වලට බැර කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම පිළිබඳ වත්මන් ප්‍රගතිය.<br><br>2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර නොතිබීම. | එම වැඩපිළිවෙලෙහි යම් යම් අඩුපාඩු පැවති බවත්, ඉදිරියේ එය ක්‍රමානුකූලව ආරම්භ කරන බවත් ග.නි. පැවසීය.<br><br>2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව මසක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි / ග.නි. වෙත දන්වා සිටින ලදි. |
| 2. | OMR (Optical Mark Reader) යන්ත්‍රය භාවිතයෙන් පිළිතුරුපත් ඇගයීම දෝෂ සහගත බව කාරක සභාවට අනාවරණය විය. | අබලන් තත්වයේ පවතින මෙම යන්ත්‍ර 2011 වසරේ සිට භාවිතා නොකරන බවත්, වසර 03 ක වගකීම් කාලය ද ඉක්මවා ගොස් ඇති බවත්, එම යන්ත්‍ර ඉදිරියේදී වෙන්දේසි කර අපහරණය කිරීමට කටයුතු කරන බවත් ග.නි. ප්‍රකාශ කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 3. | බෝලවලාන පුහුණු මධ්‍යස්ථානය නඩත්තුව වෙනුවෙන් මුදල් වැය කොට තිබුණ ද එය කිසිදු කාර්යයක් සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබීම. | එම ගොඩනැගිල්ල පුහුණු වැඩ සටහන් සඳහා යොදාගත් බවත්, එය අබලන් තත්වයේ පවතින බවත්, අධ්‍යාපන අමාත්‍යාංශයට දන්වා ඇති බව ග.නි. සඳහන් කළේය. මෙය ගුරු පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ඉදිරියේ දී යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳව අවධානය යොමුව ඇති බව මෙහිදී ප්‍ර.ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි. |
| 4. | උසස් පෙළ තොරතුරු තාක්ෂණ විභාගය වෙනම පැවැත්වීම හේතුවෙන් අමතර පිරිවැයක් දැරීමට සිදුවීම. | අ.පො.ස.(උසස් පෙළ) විභාගයට සමගාමීව මෙම තොරතුරු තාක්ෂණ විභාගය ද පැවැත්වීම නොයෙකුත් තාක්ෂණික හා පරිපාලනමය හේතූන් මත දුෂ්කර බැවින්, එය වෙනත් දිනයක පැවැත්වීම නිසා සියළු පාර්ශවයන්ට පහසු වී ඇති බව ග.නි. පෙන්වා දුන්නේය. |
| 5. | 2014 දෙසැම්බර් මස 31 දින බැංකු ගිණුම් 03 කට අදාළව නිකුත් කරන ලද මාස 06 ඉක්මවූ චෙක්පත් විශාල සංඛ්‍යාවක් පැවතීම සහ ඒ පිළිබඳ මූල්‍ය රෙගුලාසි අනුව කටයුතු කර නොතිබීම | මේ වන විට මෙම ගැටළුව බොහෝ දුරට විසඳා ඇති බවත්, එක් ගිණුමක පමණක් මෙම ගැටළුව දැනට පවතින බවත්, ප්‍රකාශ කළ ග.නි. ඉදිරියේදී මුදල් ගෙවීම් අදාළ බැංකු ගිණුම් වලට බැර කිරීමට මෙන්ම ගැටළුවක් ඇති නොවන ආකාරයෙන් කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දැන්වීය. |
| 6. | විභාග දෙපාර්තමේන්තුව මගින් ඉදිරි වර්ෂ සඳහා විභාග කාල සටහන් සම්පාදනය කිරීමේ ක්‍රම වේදය . | පාසල් විභාග සඳහා ඉදිරි වර්ෂ පහක් පමණ ඉදිරියට විභාග කාල සටහන් පිළියෙළ කොට ඇති බවත්, අනෙකුත් විභාග පැවැත්වීම සඳහා වන කාල සටහන් සැකසීම අදාළ ආයතන මගින් ලබාදෙන තොරතුරු මත පදනම් වන බවත්, මෙහිදී ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි. |
| 7. | විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන පාසල් විභාග ප්‍රතිඵල විග්‍රහය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිය | විභාග ප්‍රතිඵල පදනම් කරගෙන පළාත්, කොට්ඨාශ හා පාසල් මට්ටමින් ඇගයීම් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | අධ්‍යාපන ක්‍රියාවලිය, විෂයයන් ප්‍රවර්ධනය හා කාර්ය සාධනය සඳහා යොදාගැනීම. | සිදු කිරීමට පියවර ගෙන තිබෙන බව ප්‍ර.ග.නි. සඳහන් කළේය.<br><br>එම කාර්යාවලිය විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශක වරු මගින් ද සිදු කිරීමට පියවර ගන්නා ලෙසත් ඒ අනුව විවිධ මට්ටම් වලින් කාර්ය සාධන වාර්තා ලබාගන්නා ලෙසත් කාරක සභාව විසින් ප්‍ර.ග.නි. හට උපදෙස් දෙන ලදි. |
| **තක්සේරු දෙපාර්තමේන්තුව**<br><br>**2016 පෙබරවාරි 09** | | |
| 1. | කාර්ය මණ්ඩල පුරප්පාඩු 87 ක් අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 34 ක් පැවතීම. | බඳවා ගැනීම් සඳහා රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතියට යොමු කර ඇති බව ග.නි. පැවසීය.<br><br>දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය කඩිනමින් සපයා දීමට කටයුතු කරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි. |
| 2. | ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් අතර වෙනස | ආදායම් එකතු කිරීමේ දී දෙපාර්තමේන්තුවට මුහුණ දීමට සිදුවන ගැටළු සහ ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලා මුල් ඇස්තමේන්තුව සකස් කර ඇති නමුදු මෑත වර්ෂවල දී ආදායම් එකතු කිරීමේ දී අනුගමනය කර ඇති නව ක්‍රමවේදයන් හේතුවෙන් තථ්‍ය ආදායම පූර්වයේ නිගමනය නොකළ අන්දමේ වර්ධනයක් අත් කරගෙන ඇති බව ග.නි පැවසීය. |
| 3. | 2010, 2011 සහ 2012 වර්ෂවලට අදාළ හිඟ ආදායම් අයකරගැනීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් නොමැති වීම. | ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා ගුවන් තොටුපල හා ගුවන්සේවා සමාගම සහ නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු රාජ්‍ය ආයතන කිහිපයකින් හිඟ ආදායම් අයවිය යුතු බව ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | එම ආදායම් අය කර ගැනීම සඳහා කටයුතු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. / ග.නි වෙත දැනුම් දුන් අතර ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ට දැන්වීය. |
| 4. | දෙපාර්තමේන්තුවේ පරිගනක දත්ත පද්ධතිය | සකස් කිරීමට නියමිත පරිගනක දත්ත වැඩ සටහන සඳහා රු. මිලියන 60 ක ඇස්තමේන්තුවක් සකස් කර ඇති බව ග.නි. පැවසීය.<br><br>ආයතනයේ දත්ත පරිගනක ගත කිරීමේ අරමුණු, ඇස්තමේන්තු ගත වියදම, අපේක්ෂිත කාර්යක්ෂමතාව සහ ආදායම් උත්පාදනයට එයින් අපේක්ෂිත දායකත්වය පැහැදිළි කරමින් 2016 මාර්තු මස 08 වෙනි දිනට පෙර කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. / ග.නි වෙත නියෝග කරන ලදි. |
| **ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව**<br><br>**2016 පෙබරවාරි 10** | | |
| 1. | ආනයන අපනයන පාලක තනතුර වැඩබලන තනතුරක් ලෙස පැවතීම. | ස්ථිර තනතුරට පත්කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති හෙයින් මෙම වසරේ පෙබරවාරි මස 15 වන දින සිට නව පාලක ජනරාල්වරයෙක් පත් කරන බව ප්‍ර.ග.නි/ග.නි. විසින් කාරක සභාවට දන්වා සිටින ලදී. |
| 2. | 2015 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම 155% කින් පමණ වැඩි වී තිබීම සහ මූලධන වියදමෙහි ඉතිරිය ප්‍රතිපාදන වලින් 46% ක් ලෙස පැවතීම. | වසර මැද දී සංශෝධිත ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමෙන් මෙවැනි තත්වයන් මඟහරවා ගත හැකි බව කාරක සභාවේ මතය විය. |
| 3. | වාහන කොටස් වශයෙන් ආනයනය කිරීම සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ වත්මන් තත්ත්වය | ආයෝජන මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලද UNIMO සහ MICRO යන වාහන එකලස් කරන ආයතන දෙකට පමණක් බලපත්‍ර නිකුත් කරන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | නිර්දේශිත කාලය ඉක්මවූ වාහන, කොටස් කර ගෙන්වනු ලබන වාහන සහ මත්පැන් නිෂ්පාදනය සඳහා වන ස්ප්‍රීතු ආදිය සඳහා බලපත් ලබාදීමේ ප්‍රතිපත්තිය හා ක්‍රමවේදය. | බව ප්‍ර.ග.නි/ග.නි. විසින් මෙහිදී සඳහන් කරන ලදී.<br><br>මත්පැන් නිෂ්පාදන ද්‍රව්‍ය සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව බලපත් නිකුත් කරන බවත්, වාහන සම්බන්ධයෙන් වන නිර්දේශ ලබාදෙන ආයතනයක් නොමැති හෙයින් ඉදිරිපත් වන විශේෂිත කරුණු සලකා බැලීමෙන් අනතුරුව බලපත් නිකුත් කරන බවත් මෙහිදී ප්‍ර.ග.නි/ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි. එසේ වුවද වාහන සහ එම කොටස් සඳහා බලපත් නිකුත් කිරීම මේ වන විට සම්පූර්ණයෙන්ම අත්හිටුවා ඒ සඳහා වන නිසි ක්‍රමවේදයක් සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බවත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ද සම්බන්ධීකරණයෙන් යුක්තව එම කටයුතු සිදු කිරීමට පියවර ගන්නා බවත් ප්‍ර.ග.නි./ ග.නි. විසින් වැඩි දුරටත් දන්වා සිටියේය. |
| 4. | දෙපාර්තමේන්තුවේ පරිගනක පද්ධතියෙහි කාර්යක්ෂමතාවය. | නව පරිගනක වැඩසටහන යටතේ කාර්යක්ෂමව බලපත්‍ර නිකුත් කිරීමේ හැකියාව පවතින බවත්, එමෙන්ම රේගු දෙපාර්තමේන්තුව සමඟ සෘජුවම සම්බන්ධවීමට හැකි බවත් ප්‍ර.ග.නි./ග.නි විසින් ප්‍රකාශ කරන ලද අතර ඉදිරියේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, විදුලි සංදේශ නියාමන කොමිසම හා සුරාබදු දෙපාර්තමේන්තුව ඇතුලු මූලික වශයෙන් වැදගත්වන ආයතන පහක් සමඟ මෙම පරිගනක පද්ධතිය සම්බන්ධ කොට තොරතුරු හුවමාරු කර ගැනීමට බලාපොරොත්තු වන බවත් සඳහන් කළේය. |
| 5. | ඖෂධ හා විලවුන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය | අධිකාරිය මඟින් ලබාදෙන නිර්දේශ මත ඖෂධ සඳහා බලපත් නිකුත් කරන බවත් නව පනත අනුව විලවුන් සඳහා නිර්දේශ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ලබාගැනීමේ ආයතනය පිලිබඳ ගැටලුවක් පවතින බවත් මෙහිදි ප්‍ර.ග.නි./ග.නි. විසින් සඳහන් කරන ලදි. |
| 6. | ආනයනික පළතුරු වල ගුණාත්මක භාවය, ප්‍රමිතිය හා සෞඛ්‍යාරක්ෂිතභාවය පිළිබඳ විශාල ගැටලු පැවතීම. | මේ සම්බන්ධයෙන් අදාළ වන සියලු ආයතන සමඟ සාකච්ඡා කොට පැහැදිලි වැඩපිළිවෙලක් සකස් කරන ලෙසත්, එහිදී පළතුරු ආනයනය මෙන්ම පැල හා බීජ වර්ග, ජල බෝතල් වැනි ද්‍රව්‍ය ආනයනයේදී බලපත් නිකුත් කිරීම පිළිබඳවත් නැවත සලකා බලන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි වෙත නියෝග කරන ලද අතර මසක් ඇතුළත ඒ පිළිබඳව වාර්තාවක් කාරක සභාව වෙත එවීමට කටයුතු කරන ලෙස ද දන්වා සිටින ලදී. |
| 7. | විදේශීය මත්පැන් අලෙවි කිරීමේ දී රජයට ලැබෙන බදු ආදායම | විදේශීය මත්පැන් පාලනය කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවූව ද ඒ සඳහා පනවනු ලබන බදු මත එය යම්තාක් දුරට පාලනය කළ හැකි බව ප්‍ර.ග.නි./ග.නි. විසින් ප්‍රකාශ කරන ලදී. ඒ සඳහා ඉදිරියේදී සුරා බදු දෙපාර්තමේන්තුව මගින් ස්ටිකර් ක්‍රමයක් යටතේ නව වැඩපිළිවෙලක් සකස් කිරීමට යෝජිත බව ද ප්‍ර.ග.නි/ග.නි විසින් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී. |
| 8. | ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාවට අපනයනය කිරීමේදී බදු ගෙවීමට සිදු නොවන බැවින් ඉන්දුනීසියාවෙන් ගෙන්වන ලද කරුංකා ශ්‍රී ලංකාව හරහා ඉන්දියාවට අපනයනය කිරීම. | ඒ සඳහා බලපත්‍ර නිකුත් කර නොමැති බව ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවේ අරමුණු වලට මෙම කරුණු අනුගත වන බැවින්, සියළුම ආනයන සහ අපනයන සම්බන්ධයෙන් නියාමනයක් සිදු කරන ලෙසත් මේ සම්බන්ධයෙන් සුදුසු වැඩ පිළිවෙලක් සකස් කරන ලෙසත් කාරක සභාව විසින් ප්‍ර.ග.නි/ග.නි වෙත දන්වන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 9. | ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන වාහන විවිධ පාර්ශ්වයන් වෙත පසුව පැවරීම. | මෙම වාහන ආනයනයේ දී බදු වලින් නිදහස් නොවන බැවින් අදාළ පාර්ශවයන් විසින් සිදුකළ ඉල්ලීම් සලකා බලා බැංකුවට උකස් කිරීමට පමණක් අවසර ලබා දී ඇති බව ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. මෙවැනි ක්‍රියාදාමයන් වලදී බලපත්‍ර නිකුත් කිරීමෙන් පසුව පසු විපරමකට ද භාජනය විය යුතු බව කාරක සභාව විසින් යෝජනා කරන ලදි.<br><br>එමෙන්ම මෙම ක්‍රියාවලියට සම්බන්ධ සියළුම ආයතන ඒකාබද්ධ කර ගැලපෙන ප්‍රතිපත්තියක් හා නියාමන ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරන ලෙසත් එම ආයතන පරිගනක ජාල යෙදුමක් මගින් සම්බන්ධ කරන ලෙසත් කාරක සභාව විසින් ප්‍ර.ග.නි/ග.නි වෙත දන්වා සිටින ලදී. |
| **දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව**<br>**2016 පෙබරවාරි 11** | | |
| 1. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම. | සමෘද්ධි කළමනාකරුවන් බඳවා ගැනිමේ පටිපාටිය අනුමත කර ගැනීමට කටයුතු කරන බවත් සමෘද්ධි සංවර්ධන නිලධාරින් බඳවා ගැනීම දැනට අනුමත කර ඇති බැවින් ඉදිරි මාස තුන ඇතුලත එම කටයුතු අවසන් කළ හැකි බව ප්‍ර.ග.නි./ග.නි ප්‍රකාශ කරන ලදි.<br><br>ඒ පිළිබඳව දින වකවානු සහිත වාර්තාවක් මාසයක් ඇතුලත කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි හට නියෝග කරන ලදි. |
| 2. | 2004 වර්ෂයේ ක්‍රියාත්මක කළ හෙට්ටිපොල කොහු මල්බඳුන් ව්‍යාපෘතිය අසාර්ථක වීම සහ වත්කම් අස්ථාන ගත වීම. | එහි පරීක්ෂණ කටයුතු අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරමින් පවතින බවත්, ස්ථානීය පරීක්ෂණයක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ආරම්භ කර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි විසින් ප්‍රකාශ කරන ලදි. |
| 3. | සමෘද්ධි සේවකයන්ට කල්බදු පහසුකම් ලබාදීම සඳහා කල්බදු සමාගමක් වෙත ලබා දී තිබූ රු.මිලියන 230 ක මුදලින් ප්‍රතිපූර්ණය කර ගත යුතු රු. මිලියන 24.3 ක මුදල මාසික වාරිකවලින් අයකර ගැනීම | ඒ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරමින් සිටින බවත් නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගන්නා බවත් ප්‍ර.ග.නි./ග.නි ප්‍රකාශ කරන ලදි. |
| 4. | නුවරඑළිය සමෘද්ධි බැංකු නිලධාරීන් 19 දෙනෙකු විසින් වංචා කළ රු.4,005,000/= ක මුදලින් තවදුරටත් අයකර ගතයුතු රු.2,809,567/= ක මුදල අයකර ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කිරීම. | අදාළ වංචාවට සම්බන්ධ වූ සියළුම නිලධාරීන් සේවයෙන් පහකර ඇති බවත්, එයින් රුපියල් ලක්ෂ 69 ක මුදලක් දැනට අයකර ගෙන ඇති බවත් ඉතිරි මුදල් අය කර ගැනීම සඳහා නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවරා ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. විසින් ප්‍රකාශ කරන ලදී . |
| 5. | පදියපැලැල්ල බැංකු සංගමයේ නිලධාරීන් 23 දෙනෙකු විසින් රු.3,789,500/= ක මුදල් වංචා කිරිමක් සම්බන්ධයෙන් උසාවියේ පවතින නඩුවල ප්‍රගතිය. | මේ සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණයේ නඩු පවරා ඇති අතර,<br>අදාළ මුදල් අයකර ගනිමින් පවතින බවත්, එසේම මෙය නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි ප්‍රකාශ කරන ලදි.<br>ඒ සම්බන්ධයෙන් පසු විපරමක් සිදුකර කාරක සභාවට වාර්තාවක් ලබා දෙන ලෙස ප්‍ර.ග.නි./ග.නි.හට නියෝග කරන ලදි. |
| 6. | වර්ෂ 2004 දි සීගිරි සමෘද්ධි ස්ටීල්ස් පුද්ගලික සමාගමේ සහ ADX සමෘද්ධි පුද්ගලික සමාගමේ ආයෝජනය කර ඇති රු.1,240,000/= ක මුදල සඳහා ප්‍රතිලාභ නොලැබීම. | ADX ආයතනය ක්‍රියාත්මක වන ස්ථානය නිශ්චය කර ගැනීම දුෂ්කර වී ඇති බව ප්‍ර.ග.නි./ග.නි ප්‍රකාශ කළේය. එම සමාගම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනිමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. |
| 7. | හඟුරන්කෙත ඇඟළුම් කම්හලක් ඉදිකිරීම සඳහා සමාද්ධි අරමුදලෙන් | සිවිල් නීතිය යටතේ නඩු පැවරීමේ හැකියාවක් නොමැති බව නීතිපති |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | පෞද්ගලික ආයතනයක් වෙත ලබා දී ඇති රු.මිලියන 28 ක ණය සහ රු.මිලියන 2.5 ක වියදම් අයකර ගැනීමට ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග වල ප්‍රගතිය. | දෙපාර්තමේන්තුව විසින් දන්වා සිටි බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කරන ලදි.<br><br>මේ සම්බන්ධයෙන් නැවත නීතිපති උපදෙස් ලබාගන්නා ලෙසත් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කර කාරක සභාවට වාර්තා කරන ලෙසත් ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදි. |
| 8. | 2004 වසරේ දී රු31,300,000/= කට බදු ගත් ඉඩම පරිහරණය කිරීම. | මෙම ඉඩම දිවිනැගුම පරිපාලන සංකීර්ණයක් ඉදිකිරීමට නාගරික සංවර්ධන අධිකාරිය සමග මූලික කටයුතු සිදුකරමින් පවතින බව ප්‍ර.ග.නි./ග.නි ප්‍රකාශ කරන ලදි. |
| 9. | දිවි නැගුම දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමේදි ඒකාබද්ධ කරන ලද ආයතන 4 හි අවසාන ගිණුම් විගණනයට භාජනය කර නොතිබීම සහ ස්ථාවර වත්කම් නිවැරදිව පවරා ගත් බවට තහවුරු කිරිමක් නොමැති වීම. | සමෘද්ධි අධිකාරිය හැර අනෙක් දෙපාර්තමේන්තු දෙක සහ අධිකාරි දෙක විධිමත් පරිදි නඩත්තු කර නොතිබීම හේතුවෙන් අවසාන ගිණුම්වල දක්වා ඇති උපලේඛන අනුව වෙනත් ලේඛන කිහිපයක් උපයෝගි කර ගනිමින් වත්කම් සමීක්ෂණය කර දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම සිදු වී ඇති බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කරන ලදි. වත්කම් ලේඛන පරීක්ෂාකර කටයුතු කිරිමට වෙනම ගණකාධිකාරිවරයෙක් පත්කර ඇති බව ද ප්‍රකාශ කළේය..<br><br>දිවිනැගුම දෙපාර්තමේන්තුවට පවරා ගත් ආයතනවල වත්කම් සහ වගකීම් පවරා ගැනීමේ සම්පූර්ණ ක්‍රියාවලිය විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කර, ඇවර කිරීමේ ගිණුම් සකස් කර, ඒ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් මාසයක් ඇතුලත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. |
| 10. | දෙපාර්තමේන්තුවේ විෂය පථයට පරිබාහිර කාර්යයක් සඳහා රු. | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | 36,509,127/= ක් වටිනා ගැල්වනයිස් බට 32,976 මිල දී ගැනීම. | ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් අදාළ ගෙවීම් සිදු කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි ප්‍රකාශ කරන ලදි. |
| 11. | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 6 ක දී රුපියල් මිලියන 54.02 ක මුදලක් මුද්‍රණ කටයුතුවල දී මූල්‍ය රෙගුලාසි වලින් බැහැරව සිදුකිරීම. | මේ සම්බන්ධව අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කරන ලෙසත් පරීක්ෂණ කටයුතු සිදු කරන ආයතනවලට සහයෝගය ලබා දී විගණකාධිපතිතුමා සමඟ සාකච්ඡා කර, අමාත්‍යාංශ මට්ටමින් නිරීක්ෂණ ඇතුළත් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසත් ප්‍ර.ග.නි./ග.නි හට නියෝග කරන ලදි. |
| 12. | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ග්‍රාමීය පාලම් 1,210 ක් සංවර්ධනය කිරීමේ වැඩ සටහන සඳහා අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු රූපවාහිනී ප්‍රචාරක වැඩසටහන් දෙකක් සඳහා රුපියල් 5,040,000/= ක මුදලක් ලේකම්වරයාගේ උපදෙස් පරිදි අදාළ මාධ්‍ය ආයතන වෙත ගෙවීමට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබීම. | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ එම කටයුතු සිදුවී ඇති බව ප්‍ර.ග.නි./ග.නි විසින් ප්‍රකාශ කරන ලදි.<br><br>මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා වාර්තා කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි හට නියෝග කරන ලදි. |
| 13. | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ නිසි අනුමැතියකින් තොරව රූපවාහිනී කෙටි දැන්වීම් 03 ක් සඳහා නිෂ්පාදන ආයතනයකට රු.707,625/= ගෙවා තිබුණු අතර එම වැඩසටහන් ප්‍රචාරය කිරීමට කටයුතු කර නොතිබීම. | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් මත එම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ ගෙවීම් සිදුකිරීම සඳහා ඉදිරිපත් කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි ප්‍රකාශ කරන ලදි.<br><br>ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කරන ලෙසට කාරක සභාව ප්‍ර.ග.නි ට නියෝග කළේය. |
| 14. | පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය.<br><br>1. භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.106,873,148/= වටිනා ජල බහාලන | මෙම කරුණු පිළිබඳව විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කර මාසයක් ඇතුලත වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | බදුන් මිල ගණන් කැඳවීමකින් තොරව මිලදී ගැනීම.<br>2. ත්‍රි රෝද රථ රියැදුරන් සඳහා ජීවිත රක්ෂණ ක්‍රමයක් සහ විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමට තොරතුරු රැස් කිරීම සඳහා රු.2,402,400/= මුදලක් වැය කර ආකෘති පත්‍ර මුද්‍රණය කිරීම.<br>3. පනතේ විධිවිධාන උල්ලංඝනය වන පරිදි දිවි නැගුම සම්මේලනය පැවැත්වීම සහ සම්මේලනයේ යටිතල පහසුකම් සඳහා රු.16,629,435/= සහ ප්‍රචාරණය වෙනුවෙන් රු.1,954,300/= වැය කිරීම.<br>4. ලිත් 5,000,000 මුද්‍රණය කිරිමට රු.29,400,000 /= වැය කිරිම සහ බෙදා හැරීම විගණනයට තහවුරු නොවීම.<br>5. සේවයෙන් ඉවත් වූ නිලධාරින් 826 සඳහා වන්දි හා පාරිතෝෂික සඳහා රු.833,237,615/= මුදල දිවි නැගුම ප්‍රජා මුල බැංකු වෙත ප්‍රතිපූර්ණය නොකිරීම.<br>6. ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අඩු ආදායම්ලාභීන්ට ලබා දීම සඳහා රු.976,734/= ක් වැය කර උළු මිල දී ගැනීම.<br>7. "ඉසුරුමත් නිවහනක්" වැඩ සටහන යටතේ දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමාගම්වල අරමුදලින් රු.2,992,777,500/= ක මුදලක් අනුමැතියකින් තොරව සහනාධාර ලෙස පවුල් වෙත ගෙවීම සහ ප්‍රචාරණය වෙනුවෙන් රු.997,476/= ක් ගෙවීම.<br>8. සමාජ ආරක්ෂණ අරමුදල විගණකාධිපතිවරයාගේ විගණනයට යටත්වන ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත් කිරීම සඳහා පියවර නොගැනීම. | |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | 9. දිවිනැගුම පනත ප්‍රකාරව, දිවිනැගුම ප්‍රජා මූල බැංකු මහා සංගමයක් ස්ථාපිත කිරීම සඳහා මෙතෙක් කටයුතු නොකිරීම.<br><br>10. මහා භාණ්ඩාගාරයේ හෝ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලිඛිත එකඟතාවයකින් තොරව, සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් සහ බැංකු මූල්‍ය අංශයේ අරමුදල් හා සංචිත උපයෝගී කරගනිමින් සිදු කර ඇති ආයෝජන<br><br>11. නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අඩු ආදායම්ලාභීන්ට ලබා දීම සඳහා රු.9,769,734/= ක් යොදවා උළු මිල දී ගැනීම.<br><br>12. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කිරීම වෙනුවෙන් ප්‍රසම්පාදන කාර්ය පටිපාටිවලට පටහැනිව ගෙවීම් සිදු කර තිබීම.<br><br>13. දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුමට අදාළ සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර නොතිබීම. | |
| 15. | සමාජ ආරක්ෂණ අරමුදල විගණනයට ලක් නොවීම සහ එය විගණනය කිරීමට ප්‍රමාණවත් නීතිමය ප්‍රතිපාදන නොමැති වීම. | ඒ සම්බන්ධයෙන් පනතේ යම් යම් සංශෝධන සිදු කළ යුතු බව කාරක සභාව විසින් යෝජනා කරන ලදි .<br><br>භාරකාර මණ්ඩලය රැස්වීමෙන් පසු විගණකාධිපතිතුමාගෙන් විමසා විගණන සමාගමක් හඳුනාගෙන ඒ මගින් විගණනය කිරීමට දැනට තීරණය කර ඇති බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **අධ්‍යාපන අමාත්‍යාංශය (යළි කැඳවීම)**<br>**2016 පෙබරවාරි 12** | | |
| 1. | තාක්ෂණ විෂය ධාරාව පාසල්වලට හඳුන්වා දීම පිළිබඳව ප්‍රගතිය | අමාත්‍යාංශ මට්ටමින් ඒකාබද්ධ වැඩ පිළිවෙලක් සකසා මුදල් ප්‍රතිපාදනයන් ද වෙන්කර තිබුණත් අධ්‍යාපන සහ නිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු යන අමාත්‍යාංශ අතර නිසි සම්බන්ධීකරණයක් නොමැතිවීම නිසා ගැටලු මතු වී ඇති බව කාරක සභාවේ අදහස විය. දැනට ජෛව පද්ධති සහ තාක්ෂණවේදය යන විෂය ධාරාවන් සඳහා ප්‍රමාණවත් ගුරුවරුන් සිටින බැවින්, ඉංජිනේරු තාක්ෂණවේදය සඳහා වෘත්තිය පුහුණු අමාත්‍යාංශය සමග සාකච්ඡා කර ක්‍රමවත් සැලැස්මක් සකස් කර ගන්නා ලෙස ප්‍ර.ග.නි.ට උපදෙස් ලබා දෙන ලදි.<br><br>විශ්ව විද්‍යාල ප්‍රවේශය අහිමිවන උසස් පෙළ සමතුන් වෙනුවෙන් නිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු අමාත්‍යාංශය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරක්දැයි කාරක සභාව විමසන ලදි. උසස් පෙළ සමතුන් සඳහා NVQ 5 මට්ටමේ පාඨමාලා ද අනෙක් අය සඳහා NVQ 4 මට්ටමේ පාඨමාලා ද ආරම්භ කර ඇති බව ප්‍ර.ග.නි. සඳහන් කළේය. අමාත්‍යාංශ දෙක ඒකාබද්ධ වී නිසි වැඩපිළිවෙලක් සකස් කර ගන්නා ලෙස කාරක සභාව විසින් දන්වා සිටින ලදි. |
| 2. | අධ්‍යාපන අමාත්‍යාංශයේ කටයුතු පරිගනක ගත කිරීම. | පරිගනක ගත කිරීමේ දෙවන අදියර මේ වන විට අවසන් වී ඇති බව ප්‍ර.ග.නි. පැවසුව ද, එම වැඩසටහනට ගුරුවරුන්ගේ දත්ත ඇතුලත් කිරීම මේ දක්වා සිදු වී නැති බව අනාවරණය විය. කාලයට සාපේක්ෂව එහි පවතින ප්‍රමාදය ගැන කාරක සභාවේ අප්‍රසාදය පළවිය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ගුරු සහ සිසු තොරතුරු ඇතුලත් පරිගනක පද්ධතියක වැදගත්කම විස්තර කරමින් ඒ සඳහා ක්‍රියාත්මක වැඩපිළිවෙලක් සකස් කර ගන්නා ලෙසත්, දැනට පවතින පරිගනක පද්ධතියේ ක්‍රියාත්මක භාවය පිළබඳව වාර්තාවක් ලබා දෙන ලෙසත් කාරක සභාව නියෝග කළේය. |
| 3. | කොළඹ ආනන්ද විද්‍යාලයේ පිහිටි සත්මහල් ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම. | සංරක්ෂණය කර තවදුරටත් භාවිතයට ගත හැකිව තිබූ එම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට නිර්දේශ කළ පාර්ශවය පිළිබඳවත්, එය ඉවත් කිරීමට ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය හෝ වෙනයම් ආයතනයක අනුමැතිය ලබාගෙන තිබේද යන්නත්, එය කඩා දැමීම හේතුවෙන් සිසුන්ට අපහසුතාවයන්ට මුහුණදීමට සිදුව ඇතිද යන වගත්, එම අබලි ද්‍රව්‍ය විකිණීමක් සිදු වී ඇත් ද යන්න පිළිබඳවත්, සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීමට සහ පාසලට විදුලි ජනක යන්ත්‍රයක් මිල දී ගැනීම සඳහා පසුගිය වසර 2 තිස්සේ එකතු කරන ලද මුදල් ශිෂ්‍ය සංගම් ගිණුමක තැන්පත් කර තිබේ ද යන්නත් සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස ප්‍ර.ග.නි.ට නියෝග කරන ලදි. |
| **කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>2016 පෙබරවාරි 12** | | |
| 1. | පොදු තැන්පත් ගිණුමේ වර්ෂ දෙක ඉක්මවූ තැන්පත් රුපියල් මිලියන 32 ක් පැවතීම සහ ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබීම. | මාර්ග සංවර්ධනයේ දී ඉතිරි වූ කොටස් සංවර්ධනය කිරීමට තිබෙන බැවින් එම තැන්පත් ගිණුමේ රුපියල් මිලියන 70 ක් පවතින බව ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර මෙම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කටයුතු නිම කිරීමට පියවර ගන්නා ලෙස කාරක සභාව විසින් නියෝග කරන ලද අතර, මේ පිළිබඳව සති දෙකක් ඇතුලත, දින වකවානු ද ඇතුලත් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 2. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “ බී ” ගිණුමේ හිඟ ශේෂ අයකර ගැනීම සඳහා ගෙන ඇති පියවර. | එම ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරන බවත්, ණයකරුවන් මිය යෑම, සේවය අතහැර යාම හා වැඩ තහනමට ලක්වීම වැනි හේතූන් නිසා මෙම තත්වය උද්ගත වී ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදි. කුමන හේතුවක් මත වුවද, අයවිය යුතු මුදල් පවතී නම් ඒවා අයකර ගැනීම සඳහා ආයතනික ක්‍රියාමාර්ග හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙසට කාරක සභාව විසින් නියෝග කරන ලදී. |
| 3. | ජාතික සවිය - ගම නැගුම ව්‍යාපෘතිය යටතේ රු.17,383,481/=ක් වටිනා මුදල්, යන්ත්‍ර හා උපකරණද, ආයෝජන මණ්ඩලය විසින් පවරා දී ඇති රු.55,618,000/= ක් වටිනා ගොඩනැගිලි හා යටිතල පහසුකම්ද, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට රු.37,621,110/= ක මුදලක් ගෙවා ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගන්නා ලද අක්කර 75ක පමණ භූමි ප්‍රමාණයක් සහිත ඉඩම ද අවුරුදු 30 ක බදු ක්‍රමයක් යටතේ සීමාසහිත හිරියාල ගොවි සමාගමට 1999 වසරේ දී ලබා දී තිබීම. | වර්තමානයේ එම ව්‍යාපෘතියේ බිත්තර වී නිෂ්පාදන වැඩසටහනක් සහ වී මෝල් දෙකක් ක්‍රියාත්මක වන බව ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| 4. | ඉහත ඉඩමේ තිබූ තේක්ක ගස් 93 ක් කපා ප්‍රවාහනය කිරිම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් දිසා වන අධිවි නිලධාරීගෙන් අවසර ඉල්ලා තිබූ නමුත් | රුපියල් මිලියන 80 ක පමණ පිරිවැයක් යෙදවීම මත, රජයේ අධීක්ෂණයක් අවශ්‍ය වන බැවින්, ඒ පිළිබඳව සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | රු.6,386,867/= වටිනා තේක්ක ගස් 111 ක් කපා දමා තිබීම. | අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධව, ආයෝජන මණ්ඩලය ඇතුලු සියලු පාර්ශවයන් කැඳවා, මෙම සමාගමට මුදල් ලබා දීම සහ සමාගමේ වත්මන් ක්‍රියාකාරීත්වය පිළිබඳව රජයේ අධීක්ෂණය යොමු වන ආකාරයේ වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ප්‍ර.ග.නි./ ග.නි. වෙත නියෝග කරන ලදි. |
| 5. | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ චක්‍ර ලේඛ ප්‍රකාරව 2014 වර්ෂයට අදාළව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 කට අදාළව ව්‍යාපෘති 1416ක් අවිච්ඡේද කර තිබීම. | අදාළ චක්‍රලේඛය 2015 වර්ෂය සඳහා සංශෝධනය කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි විසින් සඳහන් කරන ලදී. |
| | **මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**<br><br>**2016 පෙබරවාරි 23** | |
| 1. | 2015 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා අමාත්‍යාංශ 43 ක් මගින් ලබා දුන් රුපියල් බිලියන 4.3ක ප්‍රතිපාදනවලින් රු.බිලියන 2.1 ක් පමණක් උපයෝජනය කර තිබීම. | 2015.12.31 දිනට ශේෂය මීට වඩා අඩු අගයක් ගන්නා බවත්, අමාත්‍යාංශවලින් ලැබෙන මුදල් සම්බන්ධයෙන් අදාළ විෂය භාර නිලධාරියා සමග මාසිකව සමාලෝචනය කරන අතර දෙසැම්බර් අවසානය වන විට අමාත්‍යාංශ දෙකකින් පමණක් මුදල් ලැබී තිබුණු බවත්, ඒවා වියදම් කිරීමේ නොහැකියාව අදාළ අමාත්‍යාංශ වලට දන්වා යැවූ බවත් ප්‍ර.ග.නි./ග.නි.ප්‍රකාශ කළේය.<br><br>ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි හට නියෝග කරන ලදි. |
| 2. | වී මිලදී ගැනීම සඳහා මිනිපේ සමුපකාර සමිතිය වෙත ගෙවා තිබූ අත්තිකාරම් මුදලින් හිඟව පවතින රු.3,971,687/= | 2015 වර්ෂයේ හිඟ මුදල් ද සමඟ රුපියල් මිලියනයක මුදලක් දැනට අයකර ගෙන ඇති බවත්, රු.මිලියන 2.791 ක් වූ ඉතිරි මුදල රුපියල් 30,000/- බැගින් දැනට අය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | මුදල වාරික පදනම මත අයකර ගැනීමේ ප්‍රගතිය. | වෙමින් පවතින බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කරන ලදි. |
| 3. | 2008 වසරේදි වාහන අනතුරකින් සිදුවූ රුපියල් 360,435/- ක අලාභය අයකර නොගැනීම . | රිය අනතුර සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති තොරතුරු තහවුරු කර ගැනීමේ ගැටලුවක් පවතින බවත්, උපදෙස් ලබා ගැනීම සඳහා එය රාජ්‍ය මුදල් අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව ඉදිරිපත් කර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි ප්‍රකාශ කරන ලදි. ඒ සම්බන්ධයෙන් වාර්තාවක් මසක් තුල ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි හට නියෝග කරන ලදි. |
| 4 | ග්‍රාමීය ජනතාවගේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති වෙනුවට අම්බුළුවාව ජෛව විවිධත්ව ඒකකයේ ගොඩනැගිලි, ප්‍රවේශ මාර්ග හා පාලම් ඉදිකිරීම වැනි ව්‍යාපෘති 24 ක් සඳහා රු.15,652,320/- ක් යොදා තිබුණි. | ඒ සඳහා විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ මුදල් අනුමත කර ඇති බවත්, අදාළ අනුමැතීන්, සම්බන්ධිකරණ රැස්වීම්වලදි ලබාගත් බවත්, එම වැඩ කටයුතු සියල්ල අවසන් කර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි.ප්‍රකාශ කරන ලදි.<br>ඒ සම්බන්ධයෙන් වාර්තාවක් මසක් ඇතුලත කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි වෙත නියෝග කරන ලදි. |
| 5. | පාසල් දරුවන් සඳහා නැවුම් එළකිරි වීදුරුවක් ලබාදිමේ වැඩසටහන සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් 46% හෙවත් රු.1,270,651/- ක ප්‍රතිපාදන ඉතිරි වී තිබීම. | මෙම වැඩ සටහන සම්බන්ධයෙන් පැන නැගී ඇති ප්‍රායෝගික ගැටලු සහගත තත්ත්වය ප්‍ර.ග.නි./ග.නි. විසින් පැහැදිලි කරන ලදි.<br>සෞඛ්‍ය අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සමග සම්බන්ධ වී කිරි වීදුරුවක් වෙනුවට කොල කැඳ වැනි විකල්ප ක්‍රමවේදයන් යොදා ගන්නා ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි ට නියෝග කරන ලදි. |
| 6. | ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ දීමනා ලබාදීම සම්බන්ධයෙන් පවතින ප්‍රගතිය සතුටුදායක නොවීම. | අදාළ කාල සිමාව තුළ ඉදිරිපත් නොවීම, මුද්දරය අවලංගු වීම යන හේතුන් මත මෙම තත්වය උද්ගත වී ඇති බවත් එම මුද්දර නැවත අමාත්‍යාංශය වෙත යවන |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | | බවත්, ප්‍ර.ග.නි./ග.නි කාරක සභාවට දැන්විය. |
| 7. | 2005 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ රුපියල් 1,500,000/= ක මුදලක් වැයකර උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක ඉදිකළ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය භාවිතයට නොගෙන වසා දමා තිබීම | මෙම ව්‍යාපෘතියේ කටයුතු තවමත් අවසන් වී නොමැති බවත්, නැවත විමධ්‍යගත අරමුදල යටතේ මුදල් වෙන් කිරීමෙන් පසු ඉතිරි වැඩකටයුතු අවසන් කිරීමට හැකියාව පවතින බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| 8. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ජල ගබඩා ටැංකියක් ඉදිකිරීම සඳහා අත්පත් කරගෙන තිබූ පර්චස් 20 ක ඉඩම් කොටසක් සඳහා වන්දි වශයෙන් ලැබී තිබූ රුපියල් 1,448,286/= ක මුදල එම කාර්යය සඳහා වැය නොකර පොදු තැන්පත් ගිණුමේ රැඳවීම. | පළමු ඉඩම යෝග්‍ය නොවූ බැවින්, වෙනත් ඉඩමක් ඉල්ලා ඇති බවත්, ඒ අනුව දැනට තක්සේරු දෙපාර්තමේන්තුවට එම ඉඩම තක්සේරු කර වාර්තාවක් එවන ලෙසට දන්වා යවා ඇති බවත්, තක්සේරු වාර්තාව ලැබීමෙන් පසු අදාල කටයුත්ත ආරම්භ කළහැකි බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 9. | ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් සේවා බලකායේ පරිහරණය සඳහා මාස 06 ක කාල සීමාවකට මුදා හැර තිබුණු මහනුවර අතිරේක දිස්ත්‍රික් ලේකම් සඳහා වූ රජයේ නිවස ආපසු භාර දී නොතිබීම. | අදාළ නිවස මෙම වර්ෂයේ අප්‍රේල් මස 16 වන දින වන විට නැවත භාර දෙන බවට දන්වා ඇති බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| | **බන්ධනාගාර දෙපාර්තමේන්තුව**<br>**2016 පෙබරවාරි 24** | |
| 1. | දෙපාර්තමේන්තුවේ විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතීම, විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ පුරප්පාඩු 50% ක ප්‍රතිශතයක පැවතීම සහ එම අඩුව හේතුවෙන් වත්මන් කාර්ය මණ්ඩලයට ගෙවීමට සිදුව ඇති අතිකාල දීමනා අධි ප්‍රමාණයක පැවතීම. | පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරමින් පවතින බවත්, අතිකාල දීමනා වශයෙන් වසරකට රුපියල් මිලියන 300 ක මුදලක් ගෙවීමට සිදුව ඇති බවත් මෙහිදී ප්‍ර.ග.නි./ග.නි. සඳහන් කරන ලදි. පුරප්පාඩු පිරවීම පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ ලේකම් සමඟ සාකච්ඡා කොට ඒ සඳහා කඩිනම් විසඳුමකට එළැඹෙන ලෙසත්, ඒ අනුව ගනු ලබන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ක්‍රියා මාර්ග පිළිබඳව වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත්, ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 2. | 2015 දෙසැම්බර් 31 දිනට නිරවුල් කළ යුතු හෝ රජයේ ආදායමට බැර කළ යුතු වුවත් එසේ නොකළ ශේෂය රු. 7,069,572/= ක් ලෙස පොදු තැන්පත් ගිණුමේ පැවතීම. | මහා භාණ්ඩාගාරයෙන් ලද උපදෙස් අනුව, නිශ්චිත කාර්යයන් අනුව ගිණුමක් විවෘත කොට අනෙක් මුදල් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමින් සිටින බව ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| 3. | වාණිජ අත්තිකාරම් ගිණුමේ අයවිය යුතු මුදල් රු.62,273,889 ක් පැවතීම සහ එය නිරවුල් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග | මෙම මුදල් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාවට දැන්විය. |
| 4. | මහර බන්ධනාගාර ක්‍රීඩා පිටිය කුලියට දීමෙන් ලැබෙන ආදායම මුදල් රෙගුලාසිවලට පටහැනිව ක්‍රීඩා හා සුභසාධක සංගමයේ ගිණුමකට බැර කිරීම. | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ක්‍රීඩාවලදී මහා භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබෙන බවත්, එයට අවශ්‍ය මුදල් ක්‍රීඩා පිටිවලින් සහ ක්‍රීඩා සංගමයට ලැබෙන මුදල් වලින් සපයා ගන්නා බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගන්නා ලෙසට කාරක සභාව විසින් ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 5. | රුපියල් මිලියන 23 ක ශේෂයක් පවතින තැගි අරමුදල. | බන්ධනාගාර ආඥා පනත යටතේ තැගි අරමුදල පිහිටුවා ඇති බවත්, එය විධිමත්ව පවත්වාගෙන යාම සඳහා භාණ්ඩාගාරයේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බවත්, ප්‍ර.ග.නි/ග.නි කාරක සභාවට ප්‍රකාශ කරන ලදී. |
| 6. | 2011 සැප්තැම්බර් මස 23 වන දින වැලිකඩ බන්ධනාගාරයේ අතිරේක අධිකාරීවරයා අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුවට අයත් වාහනයකින් සිය නිවසට යැමේදී අනතුරකට ලක් වී රු.400,000/- ක අලාභයක් සිදුව තිබීම | එහි අවසාන පරීක්ෂණ වාර්තාව ලැබී ඇති බවත්, සිදුව ඇති අලාභය අධිකාරීවරයාගෙන් අය කර ගැනීමට කටයුතු කර ඇති බවත්, විනය පරීක්ෂණයක් සිදු කිරීමට පාලන කොමසාරිස්වරයා විසින් පියවර ගෙන තිබෙන බවත්,ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | සහ එය වසර 4 ක් ගතවන තුරු පියවා ගැනිමට කටයුතු නොකිරීම. | සභාවට දැන්විය. ඒ සම්බන්ධයෙන් කාරක සභාවට වාර්තාවක් ලබාදෙන ලෙස ප්‍ර.ග.නි/ග.නි ට නියෝග කරන ලදි. |
| 7. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යටතේ බන්ධනාගාරවල ඉඩ පහසුකම් පුළුල් කිරීමටත්, පුනරුත්ථාපන ක්‍රියාවලිය විධිමත් කිරීමටත්, එම බන්ධනාගාර පිහිටා ඇති වාණිජමය වටිනාකමක් ඇති නාගරික ඉඩම් නගර සංවර්ධනයට යොදා ගැනීම පිණිස විතැන් කිරීම සම්බන්ධයෙන් වූ පස් අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක නොවීම | බන්ධනාගාර විතැන් කිරීම පිළිබඳ මේ දක්වා නිශ්චිත වශයෙන් තීරණයක් ගෙන නොමැති බව ප්‍ර.ග.නි / ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදි. |
| 8. | සිරකරුවන් වර්ගීකරණය කොට රැඳවීම සහ සෞඛ්‍ය කඳවුරු පැවැත්වීමේ වැදගත්කම පිළිබඳව කාරක සභාව අවධාරණය කරන ලදි. | |
| 9. | සිරකරුවන් නිෂ්පාදනය කරන භාණ්ඩ සඳහා ශ්‍රමයට සරිලන ගෙවීමක් සිදු කිරීමට අවධානය යොමු කළයුතු බව. | මේ සඳහා අවධානය යොමු කරන ලෙස ග.නි. හට උපදෙස් දෙන ලදී. |
| 10. | බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් මිලදී ගන්නා භාණ්ඩවල ප්‍රමිතිය සම්බන්ධයෙන් ගැටලු පැවතීම. | විශේෂඥ උපදෙස් ලබාගනිමින් දෙපාර්තමේන්තුවට උසස් තත්ත්වයෙන් යුතු භාණ්ඩ මිලදී ගැනීම සඳහා වර්තමානයේ කටයුතු කරමින් සිටින බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| **ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**<br>**2016 පෙබරවාරි 25** | | |
| 1. | කාර්ය මණ්ඩලය සඳහා අනුමත නොවූ 1588ක සේවක අතිරික්තයක් පැවතීම සහ පුරප්පාඩු පිරවීම. | කැබිනට් අනුමැතිය මත බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | බඳවා ගැනීමේ පරිපාටිය සහ පත්වීම් ලබා දෙනු ලබන දිනය ද ඇතුළත්ව දින වකවානු සහිත වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 2. | දුම්රිය දෙපාර්තමේන්තුව සේවක අතිකාල දීමනා ගෙවීමේ ක්‍රමවේදය ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදනවලට පටහැනි වීම | දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ අතිකාල දීමනා ගෙවීම් දුම්රිය උපදෙස් සංග්‍රහය අනුව සිදු කෙරෙන බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී.<br><br>සේවක අතිකාල ගෙවීම් අනුමත කර ගත යුතු ආයතන සහ නිලධාරීන් පිළිබඳව කාරක සභාව දැනුවත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 3. | 2014/12/31 දිනට හිඟ බලපත්‍ර ආදායම් රුපියල් මිලියන 1,277.32 ක ප්‍රමාණයක් පැවතීම. | හිඟ ආදායම් යළි අයකර ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුන් අතර ඒ සම්බන්ධයෙන් මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව මාර්තු 23 වන දිනට පෙර වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී.<br><br>මුදල් අමාත්‍යාංශය සමග සාකච්ඡා කර හිඟ ආදායම් නැවත අය කර ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ගන්නා ලෙස ප්‍ර.ග.නි/ග.නි හට නියෝග කරන ලදී. |
| 4. | පෞද්ගලික නම් වලට ලියන ලද රු.මිලියන 41 ක් වටිනා චෙක්පත් 2,691 ක් 2014 හා 2015 වර්ෂවල දී දුම්රිය ස්ථාන වෙත ලැබෙන දෛනික ආදායමෙන් දුම්රිය ස්ථානාධිපතිවරුන් විසින් මාරු කර තිබීම. | මෙම තත්ත්වය සමනය කිරීමට පියවර ගෙන ඇති බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 5. | දුම්රියෙන් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙනුවෙන් 2014 දී ආයතන 13 කින් රු.මිලියන 74.67 ක් ද, 1980 සිට 2013 | හිඟ ආදායම රුපියල් මිලියන 29 ක් වන බවත්, අනෙක් හිඟ මුදල් සම්පූර්ණයෙන් ගෙවා ඇති බවත්, 2010 වර්ෂයට පෙර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | අවසානය දක්වා ආයතන 32 කින් රු.මිලියන 23.63 ක් ද, වශයෙන් 2014 ට අය විය යුතු හිඟ ආදායම රු.මිලියන 98.30 ක් පැවතීම. | හිඟ ආදායම රුපියල් මිලියන 20 ක් වන බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත දන්වන ලදී. |
| 6. | ඉඩම් හා ගොඩනැගිලි පරිහරණ දුර්වලතා සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග.<br>ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු අක්කර 13,980 ක භූමි ප්‍රමාණයෙන් දුම්රිය මාර්ග, කාර්යාල ගොඩනැගිලි හා ගබඩා වෙනුවෙන් අක්කර 8,616 ක් ද රක්ෂිතයන්ට වෙන් කළ පසු ඉතිරිය විවිධ පාර්ශවයන්ට බදු දී ඇති බව ද අනාවරණය විය. | පවතින ඉඩම් ප්‍රමාණයන් පිළිබඳව ඉඩම් සැලසුම් පවතින බවත් බදු දී ඇති ඉඩම් මෙන් තුන්ගුණයක් පමණ අනවසර පදිංචිකරුවන් රැඳී සිටින බවත්, ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කරන ලදී. දත්ත පරිගනක ගත කොට අවසන් වූ වහාම ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස කාරක සභාව නියෝග කළේය. |
| 7. | දුම්රිය වේග සීමා පැනවීම සම්බන්ධයෙන් සලකා බැලීමේ දී 2013 පැවති වේග සීමා වලට සාපේක්ෂව 2015 වේග සීමා 80 ක් වැඩි වී තිබීම. | වේග සීමා අඩු කිරීම සඳහා දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවත් ඒ සඳහා දැනට සැලසුම් කර ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| 8. | දුම්රිය දෙපාර්තමේන්තුව හා මොබිටෙල් (පුද්ගලික) සමාගම සමඟ ඒකාබද්ධ වූ ගිවිසුමක් මත 2010 වර්ෂයේ සිට දුම්රිය ප්‍රවේශපත්‍ර වෙන් කිරීම සඳහා ප්‍රධාන දුම්රිය ස්ථාන 141 සඳහා පරිගනක ජාලය හඳුන්වා දී තිබුණ ද දුම්රිය ස්ථාන 40 ක පමණක් එය ක්‍රියාත්මක වී තිබීම. | ජංගම දුරකථනය හරහා දුම්රිය ප්‍රවේශ පත්‍ර වෙන් කරවා ගැනීමේ පහසුකම් දුම්රිය ස්ථාන 50 ක පමණ ස්ථාපිත කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාවට ප්‍රකාශ කරන ලදී.<br>මේ සඳහා පෙර ගෙවුම් ක්‍රමයක් හඳුන්වා දීමට සහ දැනට පවතින ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලා වැඩි දියුණු කිරීම් සිදුකරන ලෙස කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදී. |
| 9. | දුම්රිය එන්ජින් 13 ක් වසරකට වැඩි කාලයක් අළුත්වැඩියා තත්වය යටතේ රත්මලානේ ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු වැඩපලේ පැවතීම. | දුම්රිය එන්ජින් ඉතා ඉහල තාක්ෂණික මට්ටමකින් පවතින බැවින් අළුත්වැඩියා අමතර කොටස් ලබා ගැනීමේ විශාල අපහසුතා පවතින බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 10 | පරිගනක වැඩසටහන | දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත පරිගනක වැඩසටහන පිළිබඳව දින වකවානු සහිතව වාර්තාවක් 2016 මාර්තු 20 වන දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| **සේවක අර්ථ සාධක අරමුදල**<br>**2016 පෙබරවාරි 26** | | |
| 1. | රුපියල් ට්‍රිලියන 1.6 ක් පමණ වන මෙම අරමුදලේ අභ්‍යන්තර විගණන කටයුතු මහ බැංකුව විසින් පෞද්ගලික ආයතනයක් හරහා සිදු කිරීම, අරමුදල් ආයෝජනයේ දී ප්‍රමාණවත් ආරක්ෂණයක් නොමැති වීම, කම්කරු කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු ප්‍රමාණවත් නොවීම. | අභ්‍යන්තර විගණන කටයුතු වල අඩුපාඩු මගහරවා ගනිමින් විධිමත් හා ක්‍රමවත් අයුරින් සිදු කිරීමට පියවර ගනිමින් පවතින බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 2. | අරමුදල වෙත විවිධ ආයතන වලින් ලැබෙන මුදල් අර්ථලාභීන්ගේ ගිණුම්වලට බැර නොකර පොදු තැන්පත් ගිණුමක පවත්වගෙන යාම, ඒ අනුව 2015 දෙසැම්බර් 31 දිනට එහි පැවති ශේෂය රුපියල් බිලියන 3.5 ක් පමණ වන බව සහ එම ගිණුම නිරවුල් නොකොට අඛණ්ඩව පවත්වා ගෙන යාම. | මෙම මුදල් වෙන් වශයෙන් හඳුනා ගැනීමේ අපහසුතා ඇති බවත්, නිරන්තර මුදල් හර සහ බැර වීම සිදුවන මෙම ගිණුමේ ශේෂය සම්පූර්ණයෙන්ම නිරවුල් කිරීමේ හැකියාවක් නොමැති බවත්, එම මුදල් කඩිනමින් අදාළ ගිණුම් වලට බැර කිරීම සඳහා පරිපාලනමය කටයුතු ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| 3. | නව පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අරමුදලින් මුදල් යෙදවීම සහ එම මුදල් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කිරීම පිළිබඳ වර්තමාන තත්ත්වය. | මේ වන විට මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 1482 ක් ප්‍රතිපූර්ණය කොට ඇති බවත්, එම සම්පූර්ණ මුදලම ලබා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 4. | ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අරමුදලට අනුයුක්ත නිලධාරීන්ගේ වැටුප මත වන උපයන විට ගෙවීමේ බද්ද ඔවුන්ගෙන් අවකරණය නොකොට සේවක අර්ථසාධක අරමුදලින් ගෙවා තිබීම සහ එම අරමුදලේම කටයුතු කරන කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට එය අදාළ නොවීම. | මෙහි කිසියම් අපැහැදිලි තත්වයක් පවතින බවත් එම ක්‍රමවේද නිවැරදි කළ යුතුව පවතින බවත් මහ බැංකු අධිපතිවරයා විසින් පෙන්වා දෙන ලදි.<br>රාජ්‍ය මුදල් චක්‍රලේඛ වලට අනුකූලව මෙම ක්‍රමවේදයන් නිවැරදි හා යාවත්කාලීන විය යුතු අතර මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ සාකච්ඡා කොට වැඩපිළිවෙලක් සකස් කරන ලෙස කම්කරු අමාත්‍යාංශ ලේකම්වරයා වෙත කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදි.<br>උපයන විට බදු ගෙවීම පිළිබඳ වාර්තාවක් ද කාරක සභාව වෙත ලබාදීමට කටයුතු කරන මෙන් දන්වන ලදී. |
| 5. | අරමුදල මගින් මුදල් ආයෝජනය කර තිබූ සමාගම් දෙකක (පී.සී හවුස් සහ ග්‍රීන් එලිවේටර්ස්) ආයෝජන වලින් පාඩු ලැබීම. | එමගින් රුපියල් මිලියන 42 ක පමණ සමස්ත පාඩුවක් සිදුව ඇති බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 6. | 2014 අයවැය යෝජනා අනුව රුපියල් බිලියන 06ක ප්‍රසාද දීමනාවක් ගෙවීමට තීරණය කිරීම. | එම මුදල් ලබා දීමේ ක්‍රමවේදය ඉදිරියට පවත්වාගෙන යාමේ අපහසුතා පවතින බව මහ බැංකු අධිපතිවරයා විසින් පෙන්වා දෙන ලදි.<br>සේවක අර්ථසාධක අරමුදලේ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා අදාළ සියලු ආයතන ඒකාබද්ධව ඉදිරි වසර 10 සඳහා විධිමත් සැලැස්මක් සකස් කරන ලෙස උපදෙස් ලබා දුන් කාරක සභාව මෙම අරමුදලේ කටයුතු වාර්ෂිකව රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් විමසුමට ලක්කරන බව ද අවධාරණය කරන ලදි. |
| 7. | අරමුදලේ තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය | කම්කරු කොමසාරිස් කාර්යාලය සහ මහ බැංකුව සමග සම්බන්ධ වී මහ බැංකුවේ තොරතුරු වලට හානි නොවන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | සේ ඒකාබද්ධ පරිගනක වැඩසටහනක් සකස් කිරීමේ හැකියාව පිළිබඳව සලකා බලන ලෙස කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |
| **තිරසාර සංවර්ධනය සහ වනජීවී අමාත්‍යාංශය**<br>**2016 මාර්තු 08** | | |
| 1. | තිරසාර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශයේ කාර්ය භාරය | නව ආයතනික ව්‍යුහයක් හා නව දිශානතියක් සමග තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය ස්ථාපනය කර ඇති බව ප්‍ර.ග.නි. පැවසූ අතර එහි දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා අමාත්‍යාංශය ගෙන ඇති ක්‍රියා මාර්ග පැහැදිළි කළේය. |
| **වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව**<br>**2016 මාර්තු 08** | | |
| 1. | 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්ව තිබූ වනජීවීන් සඳහා වාසස්ථාන සුපෝෂණය කිරීම යටතේ වූ ක්‍රියාකාරකම් 5 ක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොකිරීම හා ආරක්ෂිත ප්‍රදේශ ජාලය ස්ථාපිත කිරීම යටතේ ක්‍රියාකාරකම් 09 ක් සඳහා වෙන් කළ රුපියල් 750,000ක මුදල වෙනත් ව්‍යාපෘති යටතේ වැය කිරීම. | අයහපත් කාලගුණ තත්ත්වයන් නිසා එම වැඩ කටයුතු නිම කිරීමට නොහැකි වූ බවත්, ඒ සඳහා වෙන් වූ මුදල් වෙනත් ව්‍යාපෘති සඳහා ආයෝජනය කර අවසන් කර ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය |
| 2. | විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම ක්‍රමවත් නොවීම. | නියමිත කාල සිමාව තුල ඒ සඳහා පිළිතුරු විගණකාධිපතිවරයා වෙත ලබා දීම අනිවාර්ය බව ප්‍ර.ග.නි/ග.නි හට නියෝග කරන ලදී |
| 3. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම | මාණ්ඩලික නිලධාරින්ගේ පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවත්, අනෙකුත් පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රතිපාදන ඉල්ලා ඇති බවත්, කාර්ය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | මණ්ඩලය වැඩි කිරීම සඳහා අමාත්‍යාංශය දැනට සැලසුම් සකස් කරමින් සිටින බවත් ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. |
| 4. | දෙපාර්තමේන්තුව සතු වාහන 14 කට සිදු වී තිබූ රුපියල් මිලියන 1.4 ක අලාභ හානි සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය | ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතින බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී.<br><br>මේ සම්බන්ධ වූ විස්තරාත්මක වාර්තාවක් මාසයක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 5. | අත්තිකාරම් ලෙස රු. 1,933,200/= ක් ගෙවා තිබුණ ද මන්නාරම කාර්ය මණ්ඩල නිල නිවස, අඩවි ආරක්ෂක කාර්යාලය හා කම්කරු නිල නිවස ඉදිකිරිමට අදාළ ව්‍යාපෘතියේ වැඩ ආරම්භ නොකිරීම . | ව්‍යාපෘතියේ කටයුතු වලට බාහිර පාර්ශවයන්ගෙන් එල්ල වූ බලපෑම් හේතුවෙන් එම කටයුතු නිම කිරීමට නොහැකි වූ බවත්, කොන්ත්‍රාත්කරු පසුගිය වර්ෂයේ ඇස්තමේන්තුවලට මෙම වර්ෂයේ මුදල්වලින් අදාළ කටයුතු සිදු කිරීමට ලිඛිතව එකඟ වී ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී.<br><br>මේ සම්බන්ධව වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීමට ප්‍ර.ග.නි/ග.නි විසින් එකඟවන ලදී. |
| 6. | අලි පැටවුන් 22 දෙනෙකු නීති විරෝධී ලෙස විවිධ ව්‍යාපාරිකයින් භාරයේ දේවාල වල හා විහාරස්ථානවල තබාගෙන සිටින බව විගණනයේදී නිරීක්ෂණය විය. | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ පවත්වා අලි ඇතුන් 37 ක් සඳහා උසාවි නියෝග ගෙන ඇති බවත්, එයින් අලි ඇතුන් 32 දෙනෙක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව භාරයට ගෙන ඇති බවත්, තවත් අලින් තුන් දෙනෙකු භාර ගැනීමට පියවර ගෙන ඇති බවත්, එක් අලියෙකු සම්බන්ධයෙන් නැවත පරීක්ෂණ සිදු කරන බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 7. | අලි ඇතුන් ලියාපදිංචි කිරීමට අදාළව දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කර තිබුණු අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය, විශේෂයෙන්ම ලේඛනවල ආරක්ෂාව සම්බන්ධව ගෙන තිබුණු ක්‍රියාමාර්ග ඉතා දුර්වල තත්ත්වයක පැවතීම හේතුවෙන් අලි ඇතුන් ලියාපදිංචියට අදාළ සටහන් ලේඛනයක් අස්ථානගත වී තිබීම . | ඒ සම්බන්ධයෙන් දැනට පරීක්ෂණ කටයුතු සිදු කර ගෙන යන බවත්, මාර්තු මාසය අවසානය වන විට එම පරීක්ෂණ වාර්තාව ලබා ගැනීමේ හැකියාවක් පවතින බවත්, ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |
| 8. | හොරොව්පතාන විදුලි වැට ඉදිකිරීමේ ප්‍රගතිය . | එම ව්‍යාපෘතිය අවසන් කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |
| 9. | හග්ගල දැඩි ස්වභාවික රක්ෂිත භූමියේ නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශය තුළ අනවසර ඉඩම් අල්ලා ගැනීම් 116 ක් ද, බදුල්ල දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශ තුළ අනවසර ඉඩම් අල්ලා ගැනීම් 103 ක් ද වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබීම | දිසාපතිවරුන්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඇති බවත්, එම කමිටු වාර්තා අනුව ඉදිරියේදී කටයුතු කිරීමට පියවර ගන්නා බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 10. | Convention on International Trade in Endangered Species of Wild Fauna And Flora (CITES) බලපත්‍ර ගාස්තු තීරණය කර ඇති ආකාරය පිළිබඳව නිවැරදි තොරතුරු විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි වීම. | මෙම පනතට රෙගුලාසි සකස් කර නොමැති බැවින් මෙම තත්වය පැන නැගී ඇති බවත්, දැනට එම කටයුතු අවසන් වෙමින් පවතින බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී.<br><br>එම සම්පූර්ණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 11. | විල්පත්තු ජාතික උද්‍යානය තුළ එළුවන්කුලම කලාඔයේ සිට කොන්ඩච්චිකුඩා දක්වා නව මාර්ගයක් භාවිතා කිරීමේ වර්තමාන තත්ත්වය . | එම මාර්ගය නාවුක හමුදාවේ ආරක්ෂක කටයුතු සඳහා ඉදිකර ඇති බවත්, මේ සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සංවිධාන 04 ක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා ඇති බවත්, ලැබෙන තීන්දුව අනුව මෙම මාර්ගය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | වන බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී.<br>මේ සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 12. | අංගමැඩිල්ල ජාතික උද්‍යානයේ වන අලි හීලෑ කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම හා අලි ගොඩබෑමේ වේදිකාව ඉදිකිරීම වෙනුවෙන් රු.4,574,919/= ක් වියදම් කර ඇති නමුත් එය නිෂ්ක්‍රීයව පැවතීම. | මේ සම්බන්ධව වාර්තාවක් ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය. |
| | **ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව**<br>**2016 මාර්තු 08** | |
| 1. | 2016 වසර වන විටත් දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත නොකිරීම. | අභ්‍යන්තර විගණන ඒකකය සඳහා අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශයේ එක් නිලධාරියෙක් අනුයුක්ත කර ඇති බවත්, ඒ සඳහා තනතුරු අනුමත කර ඇති බවත් ගණකාධිකාරීවරුන්ගේ හිඟයක් පවතින බැවින් බඳවා ගැනීමේ කටයුතු අවසන් කර නොමැති බවත්, මාසයක් ඇතුළත අභ්‍යන්තර විගණන ඒකකය ශක්තිමත් කිරීමට කටයුතු කරන බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| 2. | සත්වෝද්‍යානයේ ප්‍රධාන ආපන ශාලාවේ මාසික කුලිය සියයට පනහකින් අඩු කිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුගෙන් අයවිය යුතු රුපියල් 4,075,500/= ක අලාභය සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබා ගැනීම හා ඒ පිළිබඳ පරීක්ෂා කිරීමට විශේෂ නිලධාරියෙකු පත් කිරිම පිළිබඳ වර්තමාන තත්ත්වය | අවස්ථා තුනක දී නීතිපති උපදෙස් ඉල්ලා ඇති නමුත්, මෙතෙක් නීතිපති උපදෙස් ලැබී නොමැති බවත් පත් කළ විශේෂ නිලධාරියා ද පත්වීම ප්‍රතික්ෂේප කර ලිපියක් මඟින් දන්වා ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී.<br>අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් ඍජු පරීක්ෂණයක් සිදු කර 2016 අප්‍රේල් 15 වන දිනට පෙර කාරක සභාව වෙත |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 3. | හම්බන්තොට සෆාරි උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු වල වර්තමාන තත්ත්වය | 2016 මාර්තු මස 27 වන දින එය විවෘත කිරීමට සැලසුම් කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 4. | ජාතික සත්ව උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ඉදිකෙරෙමින් පවතින රිදියගම සෆාරි උද්‍යානය සහ පළමු අදියර වැඩ අවසන් කළ පින්නවල වාගොල්ල නව සත්ව උද්‍යානය ජාතික සත්ව උද්‍යානය පනතට ඇතුළත් කර නොතිබීම | නව අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසු ජාතික සත්ව උද්‍යානය පනත සංශෝධනය කර ඉහත උද්‍යාන ද ඇතුලත් කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 5. | වත්තල මින් මැදුර ඉදිකිරීම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම. | අදාළ ඉඩම මහා භාරකාර දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක් වන බවත්, එම ඉඩම සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට පවරා නොමැති බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී.<br><br>සුදුසු ඉඩමක් වෙතොත් එය ලබාදීම සඳහා අදාළ සැලසුම් නිර්මාණය මහනගර සැලසුම් සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 6. | පින්නවල වාගොල්ල නව සත්වෝද්‍යානයේ ඉදිකිරීම් කටයුතු සඳහා පවරා ගත යුතු ඉඩම් අක්කර 13 ක් හඳුනාගෙන තිබුණ ද, එම ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොමැති වීම. | අදාළ ඉඩම් පවරා ගැනීම දැනට සිදුකර මින් පවතින බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 7. | ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව පින්නවල නව සත්වෝද්‍යානය සකස් කිරීම අරමුණ වී තිබූ නමුත්, යෝජිත මුළු භූමි ප්‍රමාණය වූ අක්කර 104 සඳහා පිළිගත හැකි මූලික | ඉඩම් අත්කර ගැනීමෙන් පසු සංකීර්ණ සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරන බවත්, දැනට දළ සැලැස්මක් සකස් කර ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | සැලැස්මක් හා විස්තරාත්මක සැලැස්මක් සකස් කර නොතිබීම. | |
| 8. | 1998 වර්ෂයේ දී වාගොල්ල සත්වෝද්‍යානය ඉදිකිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් වාගොල්ල කෘෂිකර්ම ගොවිපලෙන් ඉඩම් හෙක්ටයාර 16.45 ක් පවරාගෙන තිබුණ ද, එයින් ඉඩම් හෙක්ටයාර 4.15 ක් 2012 වර්ෂය අවසානය වන විටත් කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා යොදාගෙන නොතිබීම | අදාළ ඉඩම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක් වන බවත්, එම ඉඩමෙහි සත්වෝද්‍යානය ඉදිකිරීම හේතුවෙන් වෙනත් ඉඩමක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටි නමුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සුදුසු ඉඩමක් තවමත් ලැබී නොමැති බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 9. | පින්නවල සතුන් සඳහා වූ අරණ කඩා ඉවත් කිරීම හේතුවෙන් ඒ සඳහා දරන ලද අමුද්‍රව්‍ය පිරිවැය, උපදේශක ගාස්තු සහ එම ඉදිකිරීම් කඩා ඉවත් කිරීමේ ගාස්තු වූ රුපියල් 9,466,569/= ක් නිෂ්කාර්ය වියදම් ඇතුළු මුළු පිරිවැය රු.985,576,787/= ක් වූ බව නිරීක්ෂණය විය. | පැරණි අමාත්‍යාංශය යටතේ සකස් කරන ලද සැලැස්ම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතට පැමිණීමෙන් පසු වෙනස් කිරීමට උපදෙස් ලැබී තිබෙන බවත්, ඒ අනුව සැලැස්ම වෙනස් වී ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත දැනුම් දුන්නේය. |
| 10. | හම්බන්තොට සෆාරි උද්‍යානයේ වැව් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තු පිරිවැය රු.9,209,900/= ක්ව තිබූ අතර ඒ අතරින් වැව් 09 ඉදිකිරීම සඳහා මිනුම් කටයුතු වෙනුවෙන් රු.493,000/= වැය කර තිබුණ ද දැනට ඉදිකර අවසන් එක් වැවක් සඳහා ජලය ලබා ගැනීමට පවත්නා ජල පෝෂක ප්‍රදේශ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වැඩ කටයුතු නවතා දමා තිබීම. | වැව් දෙකක් ඉදිකර අවසන් බවත්, එහි වැසි ජලය රඳා ගැනීම සඳහා පොළව පදම් විය යුතු බවත්, ඒ සඳහා දැනට වලවේ ගඟෙන් ගන්නා ජලය යොදවා ඇති බවත්, ඉන් පසු වැසි ජලය රඳවා ගැනීමේ හැකියාවක් පවතින බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 11. | හම්බන්තොට සෆාරි උද්‍යානය සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ලබා ගෙන තිබුණ ද, වන අලි තර්ජන පිළිබඳව කිසිදු සඳහනක් එම වාර්තාවල | ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ඉදිරිපත් කළ බවත්, විදුලි වැටක් සහ විශේෂිත කොන්ක්‍රීට් තාප්පයක් ඉදිකිරීමට සැලසුම් කර ඇති බවත්, දැනට විශේෂිත තාප්පය සාදා අවසන් කර ඇති බවත්, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | ඇතුළත් කර නොතිබීම සහ ආරක්ෂිත විදුලි වැටවල් වන අලින් විසින් විනාශ කර තිබීම. | ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 12. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමෙහි 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය රුපියල් 3,321,890/= ක් විය. | අදාළ මුදල් අයකර ගැනීමට නීතිපතිතුමාගේ උපදෙස් සඳහා ඉදිරිපත් කර ඇති බවත්, ඇතැම් නිලධාරීන්ට නීතිමය පියවර ගෙන ඇති බවත්, සියළුම මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 13. | කාරක සභාව වෙත ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව දෙහිවල සත්වෝද්‍යානයේ සතුන්ගේ උපතේදී හා ඒ ආසන්න දිනවලදී මියයාම සැලකිය යුතු මට්ටමක වූ බව නිරීක්ෂණය විය. | ලෝකයේ සත්වෝද්‍යානවල සතුන් මිය යෑම සමඟ සසඳන විට මෙය එතරම් විශාල සංඛ්‍යාවක් නොවන බවත්, එම සංඛ්‍යාව අවම කර ගැනීමට විවිධ පියවර අනුගමනය කරන බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී.<br><br>පොලිතීන් වැනි අමුද්‍රව්‍ය තහනම් කර ඇති බවත්, ඉදිරි කාලයේදී පොලිතීන් භාවිතයෙන් සම්පූර්ණයෙන්ම වැලකීමට චක්‍රලේඛයක් මඟින් කටයුතු කරන බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 14. | දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහකාරවරුන් 5 දෙනෙකු සේවයේ නියුතු වූව ද 2009 – 2015 දක්වා වූ වර්ෂ හතක කාලය තුළ ප්‍රමාණවත් පර්යේෂණයන් සිදු කර නොතිබීම. | 2016 වර්ෂය සඳහා සැලසුම් කර ඇති පර්යේෂණ ලැයිස්තුව කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත දන්වන ලදි.<br><br>ජාතික සත්වෝද්‍යාන දෙපාර්මේන්තුව සඳහා අවුරුදු 05 කට අදාළ වන පරිදි මූලික සැලැස්මක් සකස් කර ඒ අනුව ඉලක්ක ලබා දෙන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලද අතර, ඒ පිළිබඳ වාර්තාවක් මසක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස නියෝග කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව<br>2016 මාර්තු 08** | | |
| 1. | ඩුබායි රාජ්‍යය මල් වගාව සඳහා යොදා ගන්නා තාක්ෂණය ලංකාවේ භාවිතා කිරීමේ හැකියාව. | ඒ සඳහා විශාල ප්‍රාග්ධනයක් යෙදවීමට සිදු වන බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය.<br>එම සංකල්පය පිළිබඳව සහ ගම්පහ වැනි උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම පිළිබඳ සැලැස්මක් සකස් කර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 2. | වර්ෂ අවසානයට පෙර පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිළිබඳ වර්තමාන තත්ත්වය | දෙපාර්තමේන්තු මට්ටමින් පිරවිය හැකි පුරප්පාඩු සම්පූර්ණ කර ඇති බවත්, දීප ව්‍යාප්ත සේවා සහ ඒකාබද්ධ සේවා පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ ආයතන වෙත දන්වා යවා ඇති බවත්, විද්‍යාත්මක සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගෙන ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| 3. | හග්ගල උද්භිද උද්‍යානයේ හෙක්ටයාර 69 ක ඉඩම් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කර ගැනීම පිළිබඳ වර්තමාන තත්ත්වය . | එම ඉඩම් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට හා වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වන බවත්, ප්‍රාදේශීය ලේකම්වරුන් මාර්ගයෙන් කමිටුවක් පත් කළ බවත්, එම කමිටුව මඟින් අදාළ පියවර ගැනීමට කටයුතු කර ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 4. | මීගලෑව "හරිත පියස" පුහුණු මධ්‍යස්ථානය ඌන උපයෝජනය | දැනට එය පැල තවානක් වශයෙන් වැඩිදියුණු කරමින් පවතින බවත්, එහි ගොඩනැඟිල්ල අළුත්වැඩියා කරමින් පවතින බවත්, ඉන් පසු මල් වගාකරුවන්ගේ පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පවත්වා ගෙන යෑමේ හැකියාවක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | පවතින බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 5. | හග්ගල උද්භිද උද්‍යානයට අයත් ගොඩනැඟිල්ලක පවත්වාගෙන යනු ලබන ආපන ශාලාව වෙනුවෙන් 2007 අගෝස්තු සිට 2013 ජූලි දක්වා ලැබී තිබුණු බදු ආදායම රුපියල් 1,053,900/= ක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර නොකර සේවක සුභසාධක සමිතියේ අරමුදලට බැර කර එම දිනෙන් පසුව ලැබුණු බදු ආදායම වූ රුපියල් 270,000/= මුදල පමණක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තැබීම. | බදු මුදල් ලෙස ලැබූ සමස්ත ආදායම රජයේ ආදායමට බැර කළ යුතු බවත්, මේ පිළිබඳව භාණ්ඩාගාරය වෙතින් විමසිය යුතු බවත්, ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත්, ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 6. | ගම්පහ උද්භිද උද්‍යානයට පිවිසීම සඳහා යෝජිතව තිබූ පාළම සමාලෝචිත වර්ෂයේ දී ඉදිකර නොතිබුණු බැවින් රුපියල් 2,399,315/= ක වියදමක් දරා ඉදිකර තිබුණු නව පිවිසුම් මාර්ගය, ගේට්ටුව හා ප්‍රවේශ පත්‍ර කවුළුව උපයෝජනය කිරීමට නොහැකි වීම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විරෝධතා හේතුවෙන් මෙය සිදු වූ බවත්, ඒ සඳහා අවසර ලැබී ඇති හෙයින්, සැලැසුමක් සකස් කරමින් සිටින බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 7. | ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ ආකර්ෂණය දිනා ගැනීම සඳහා ගෙන ඇති උපාය මාර්ග | මිරිජ්ජවිල උද්භිද උද්‍යානයට නව ප්‍රවේශ මාර්ගයක් සකස් කර ගැනීමට සැලසුම් කර ඇති බවත්, හම්බන්තොට උද්‍යානයට නවාංග ඇතුලත් කරමින් තිබෙන බවත්, එවැනි උද්‍යාන සඳහා නවාංග ඇතුලත් කිරීමට පියවර ගෙන ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| | **අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**<br>**2016 මාර්තු 10** | |
| 1. | 2002 පාසැල් පෙළ පොත් මුද්‍රණයට අදාළව | මෙම සිදුවීම් සම්බන්ධ සම්පූර්ණ තොරතුරු ඇතුලත් වාර්තාවක් 2016 අප්‍රේල් 01 දිනට පෙර කාරක සභාවට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | - රුපියල් මිලියන 23 ක චෙක්පත් වංචනිකව මුද්‍රණකරුවකුට ලබාදීම.<br><br>- ගිවිසුම් ප්‍රකාරව එකඟ වූ පාසල් පෙළ පොත් මුද්‍රණය නොකිරීම නිසා රු. 212,595,000/- ක වන්දි මුදලක් අයකර ගැනීම.<br><br>- මුද්‍රණකරුවකුගෙන් අයකරගත යුතු රු. 39,112,143/- ක වන්දි මුදල අයකර ගැනීමට අදාළ නීතිමය කටයුතු<br><br>- අදාල නිලධාරීන්ට එරෙහිව ගන්නා ලද විනය ක්‍රියාමාර්ග | ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි /ග.නි. හට නියෝග කරන ලදි. |
| 2. | 2010 වර්ෂයේ පිරිවිතරවල සඳහන් පිටු ගණනට වඩා වැඩි පිටු සඳහා ගෙවීම් කිරීමේදී, වැඩි වූ හිස් පිටු 64 ක් වෙනුවෙන් රුපියල් 158,526/= ක් ද, 2011 වර්ෂය වෙනුවෙන් හිස් පිටු වෙනුවෙන් පෞද්ගලික මුද්‍රණ ආයතනයක් වෙත කිසිදු ලිඛිත ඉල්ලීමකින් තොරව රුපියල් 538,881/= ක් ගෙවා තිබීම. | මෙම විමසුමට අදාළව ප්‍ර.ග.නි./ග.නි. ලබා දුන් පිළිතුරු සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි බව අවධාරණය කළ කාරක සභාව 2009 සිට 2014 දක්වා කාලය තුල සිදුකළ මෙවැනි ගෙවීම් පිළිබඳ ලේඛනයක් සහ එක් එක් ගෙවීම් පිළිබඳව හේතු සහිත විග්‍රහයක් ද කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 3. | පෙළපොත් අවශ්‍යතාවය නිසි පරිදි ගණනය කිරිමකින් තොරව විශාල වශයෙන් පොත් මුද්‍රණය කර තිබීම සහ පැරණි පොත් විශාල ප්‍රමාණයක් ගබඩාවල තිබීම. | රජයේ ප්‍රතිපත්තිමය තීරණ අනුව පෙළ පොත් මුද්‍රණය කරන බවත්, දැනට සිදු කරගෙන යනු ලබන භාණ්ඩ සමීක්ෂණයෙන් පසුව ගබඩා වල ඇති පොත් පිලිබඳ තොරතුරු ලබා දිය හැකි බවත්, ග.නි. විසින් කාරක සභාවට ප්‍රකාශ කරන ලදි.<br><br>සියළුම ගබඩාවල පවතින පොත් සම්බන්ධයෙන්, අලෙවිය සඳහා සුදුසු පොත්, භාවිතයට ගත නොහැකි පොත් සහ භාවිතයට ගත හැකි පොත් වශයෙන් වර්ගීකරණයක් කර විස්තරාත්මක වාර්තාවක් මෙම අප්‍රේල් මස 01 වන දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 4. | පාසැල්වලට නොමිලේ බෙදාහරින ලද පෙළපොත්වල වටිනාකම අනුමත අත්තිකාරම් ගිණුමට ලියාහැරීම වෙනුවට 2014 දෙසැම්බර් 31 දින වන විට රුපියල් 9,662,075,549/= ක ණයගැති ශේෂයක් ගිණුම් වල පවත්වාගෙන යාම. | මෙම ගිණුම් නිවැරදිව සටහන් කළ යුතු බව විගණකාධිපති අවධාරණය කළේය. මහා භාණ්ඩාගාරයේ උපදෙස් අනුව මෙම ගිණුම් නිවැරදිව පවත්වාගෙන යාමට පියවර ගන්නා ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 5. | 2009 දෙසැම්බර් 31 සිට පවතින රු. 303,469,564/= ක් වූ භාවිතයෙන් ඉවත් කළ පොත්, තොග වටිනාකම් ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු නොකර 2015 දෙසැම්බර් 31 දක්වා ගිණුම්ගත කර තිබීම. | අපහරණය කරන ලද මෙම පොත් තොගය වාලච්චේන කර්මාන්තශාලාවට යැවීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළ අතර ඒ අනුව කටයුතු සිදු කරන ලෙස කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදි.<br><br>දෙපාර්තමේන්තුවේ ගිණුම් කටයුතු නිරීක්ෂණය කරනු ලැබූ කාරක සභාව, විගණකාධිපතිගේ ද උපදෙස් ලබා ගෙන නිලධාරීන්ට ගිණුම් කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා දී, උද්ගතව ඇති තත්ත්වයන් නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි වෙත උපදෙස් ලබා දෙන ලදි. |
| 6. | ඉංග්‍රිසි මාධ්‍ය සිසුන්ට ප්‍රමාණවත් අන්දමින් පෙළ පොත් නොමැති තත්වයක් පවතින බව කාරක සභාවේ නිරීක්ෂණයට ලක්විය. | අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන ප්‍රමාණවත් අයුරින් ඉංග්‍රිසි මාධ්‍ය පෙළ පොත් මුද්‍රණය කර නිකුත් කර ඇති බවත්, මෙවැනි තත්වයක් උද්ගතව ඇත්නම් ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගනු ලබන බවත් ප්‍ර.ග.නි./ග.නි. සඳහන් කළේය. |
| 7 | පාසැල් පෙළපොත් මුද්‍රණයේදී රාජ්‍ය අංශයට ප්‍රමුඛතාවය ලබා දිය යුතු බවට නිර්දේශ කර තිබියදීත් අවශ්‍යතාවයෙන් 70% ක් පමණ පෞද්ගලික මුද්‍රණ | රජයේ වෙනත් කාර්යයන්ට ප්‍රමුඛතාව ලබා දීම නිසා රාජ්‍ය අංශයේ මුද්‍රණාල වලින් නිසි පරිදි පොත් මුද්‍රණය කරවා ගැනීමේ ප්‍රායෝගික ගැටලු පැවති බව ප්‍ර.ග.නි./ග.නි. විසින් පෙන්වා දෙන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | කරුවන් වෙතින් මුද්‍රණය කරවාගෙන තිබීම. | එම තත්වයන් සැලකිල්ලට ගෙන ඉදිරියේදී පොත් මුද්‍රණය සඳහා සුදුසු හා කාර්යක්ෂම ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කළේය. |
| **ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව**<br>**2016 මාර්තු 10** | | |
| 1. | දෙපාර්තමේන්තුවේ සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 63% ක විශාල ප්‍රතිශතයක් ව පැවතීම. | මාණ්ඩලික නිලධාරින් 22 ක හිඟයක් පවතින බවත්, පුරප්පාඩු පිරවීම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් සිදු කළ යුතු බවත්, මේ පිළිබඳව එම අමාත්‍යාංශය දැනුවත් කර ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි කාරක සභාවට දැන්වීය. |
| 2. | 2012 පෙබරවාරි 05 දින අනතුරට පත් වූ රථයේ අලාභය රුපියල් මිලියන 1.2 ක් ලෙස ඇස්තමේන්තුගත කර තිබුණ ද, එම අලාභයෙන් රුපියල් 62,000/- ක් පමණක් රියදුරුගෙන් අයකරගෙන තිබීම. | මේ සඳහා විනය පරීක්ෂණයක් පවත්වා විධිමත් නියෝගයක් ලබා නොදීම නිසා අය කර ගැනීමේ ගැටළුවක් පැන නැඟී ඇති බවත්, විනය පරීක්ෂණයක් සඳහා කමිටුවක් පත් කර ඇති බවත්, අයකර ගැනීම තාවකාලිකව අත්හිටුවා ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| **මිනින්දෝරු දෙපාර්තමේන්තුව**<br>**2016 මාර්තු 10** | | |
| 1. | විවිධ මැනුම් සහ ඉඩම් අත්පත් කර ගැනීමේ මැනුම් වලට අදාළව ඉලක්කයන් පිහිටුවා තිබුණ ද එම ඉලක්කයන් තාත්වික නොවීම. | ඇතැම් අවස්ථාවලදී කඩිනමින් නිම කළ යුතු කාර්යයන් පැවරෙන විට ඉලක්කයන් ඉක්මවා කඩිනමින් නිම කිරීමට සිදු වන බව ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදි. |
| 2. | කාර්ය මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 7,503 ක් වන නමුත් එයින් 1,408 ක පුරප්පාඩු පැවතීම. | දැනට මිනින්දෝරුවරුන් 650 දෙනෙකු බඳවා ගෙන ඇති බවත්, අනෙක් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු ඉදිරියේදී පිරවීමට කටයුතු කරන බවත්, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | දෙපාර්තමේන්තුවේ රියදුරන් සංඛ්‍යාව වැඩි කළ යුතුව ඇති බැවින්, අනුමැතිය සඳහා යොමු කර ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 3. | අස්ථානගත වූ වාහන අතරින් හඳුනාගෙන නොතිබූ වාහන 22 පිළිබඳ තත්වය | වාහන 19 ක් මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතුව තිබූ බව දැන ගැනීමට ලැබුණු බව ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 4. | මිනින්දෝරු සේවයෙන් ඉවත් වූ නිලධාරීන් 71 දෙනෙකු විසින් ඔවුන් භාරයේ තිබූ රුපියල් 7,492,657/- ක් වටිනා මැනුම් උපකරණ භාරදී නොතිබීම සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා වාර්තාවක් ඉදිරිපත් කිරීම සහ නිලධාරීන් 50 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල් කපාහැර තිබීම. | අදාල මැනුම් උපරකණ සම්බන්ධයෙන් 64 දෙනෙකුගේ ලිපිගොනු කටයුතු නිම වී ඇති අතර, 4 දෙනෙකුගේ ලිපි ගොනු නීති අංශය වෙත යොමු කර ඇති බවත්, 03 දෙනෙකුගේ ලිපිගොනු සම්බන්ධයෙන් තවදුරටත් අයකිරීමේ කටයුතු සිදු වන බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| **ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව<br>2016 මාර්තු 10** | | |
| 1 | දෙපාර්තමේන්තුව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබිම සහ ප්‍රසම්පාදන සැලැස්ම විධිමත් ආකාරයෙන් සකස් කර නොතිබිම. | මෙම මාර්තු මාසය තුල දි අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කිරිමට කටයුතු කරන බවත්,විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br>සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම සති 2 තුල සකස් කර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස නියෝග කරන ලදි. |
| 2 | කාර්ය මණ්ඩලයේ පවතින සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 53% ක් වන අතර 2010 සිට පවතින ප්‍රධාන තනතුරු තුනක | බඳවා ගැනීමේ පටිපාටිය මෙතෙක් අනුමත නොවීම මෙයට හේතුවී ඇති බව ග.නි පැවසීය. මේ සම්බන්ධයෙන් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීමෙන් ආයතන කාර්ය සාධනයට වන බලපෑම | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, වැටුප් කොමිසම ඇතුලු අදාළ අංශ වෙත යොමු කරන ලෙසත්, එම ආයතන ලබා දෙන නිර්දේශ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසත්, නියෝග කරන ලදි. |
| 3. | ජාතික ලේඛනාගාරය වැඩි දියුණු කිරීමට ගෙන ඇති ක්‍රියා මාර්ග | මෙය ආසියාවේ හොඳම ලේඛනාගාරය බවට පත්වී තිබුණ ද, නවීන තාක්ෂණය සමඟ ඉදිරියට යාමේ යම් පසුබෑමක් පවතින බවත්, දැනට ඩිජිටල් තාක්ෂණය වෙත අවධානය යොමු වී තිබෙන අතර ඒ සඳහා ජාතික ලේඛනාරක්ෂක පනත සහ අනුෂාංගික අණ පනත් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය ග.නි. පැහැදිලි කළේය.<br>මෙහි ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් සතියක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 4. | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් දැනට සංරක්ෂණය නොකර තිබෙන ලේඛන | දෙපාර්තමේන්තුවේ තාක්ෂණික අංශය මඟින් මෙම කටයුතු සිදුවන බවත්, ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැති බවත්, පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අනුමැතිය සඳහා යොමු කර ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 5. | දෙපාර්තමේන්තුවට අයත් නව ගොඩනැගිල්ල පුළුල් කිරීමේ කටයුතු හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ලබා දී තිබූ ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 49.58 ක් නැවත මහා භාණ්ඩාගාරයට යවා තිබීම | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සිදු කළ සී.ඊ.සී.බී ආයතනය විසින්ම ඊට අවශ්‍ය උපකරණ ද සැපයීමට සැලසුම් කළ ද, යළි මිළ ගණන් කැඳවීමක් සිදු කරන ලෙස ලද නිර්දේශයට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී සිදුවූ ප්‍රමාදය මෙයට හේතුව බව ග.නි. ප්‍රකාශ කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **ජාතික සහජීවනය,සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය<br>2016 මාර්තු 10** | | |
| 1. | හිටපු අමාත්‍යවරයෙකුගේ නිල නිවසේ තිබූ වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු උපකරණ කීපයක් අමාත්‍යාංශය වෙත නිසි පරිදි පැවරීම සිදු කර නොමැත. | භාණ්ඩ පවරා ගැනීමේ නියෝග අදාළ අමාත්‍යාංශය වෙත යවා ඇති බවත්, එම කටයුතු සිදුවෙමින් පවතින බවත් ප්‍ර.ග.නි. පැවසීය |
| 2. | රජයේ ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර ඇති නව්‍ය ආදර්ශ වැඩපිළිවල ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය | තෝරාගත් රාජ්‍ය ආයතන 14 හි ස්ථාපිත කර ඇති නව ආදර්ශ වැඩපිළිවල සාර්ථකව ක්‍රියාත්මක වන බව ප්‍ර.ග.නි. පැවසීය. |
| 3 | "තනියාය" නම් ටෙලි නාට්‍ය නිර්මාණය කිරීම සඳහා තිර රචකයකුට රු. 500,000/= මුදලක් ගෙවා ඇති නමුත් එම කාර්යය අතරමැද නවතා තිබීම | මෙය විකාශය කිරීම සඳහා ජාතික රූපවාහිනී නාලිකාව සමඟ ඇති කරගෙන තිබූ එකඟතාවය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මෙම තත්ත්වය පැන නැගුන බව ප්‍ර.ග.නි. පැවසීය.<br>සමාජ ඒකාබද්ධතාවය අරමුණු කරගත් ටෙලි නිර්මාණයක් බැවින් නැවත වතාවක් මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත උපදෙස් ලබා දෙන ලදි. |
| 4 | උතුරු පළාතේ පවතින සමාජ ඒකාබද්ධතා නිලධාරින්ගේ හිඟය. | සමාජ ඒකාබද්ධතා නිලධාරින් 92 බඳවා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතිය ඉල්ලා ඇති බවත්, අනුමැතිය ලද වහාම බඳවා ගැනීමේ කටයුතු සිදු කරන බවත් ප්‍ර.ග.නි. පැවසීය. |
| 5 | ජාතික ගීය රාජ්‍ය භාෂා දෙකෙන්ම ගායනා කිරීම පිළිබඳව මතය | මේ සම්බන්ධයෙන් ශ්‍රී ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කිරීමේ කැබිනට් අනු කමිටුව විසින් සකස් කර ඇති වාර්තාව පිළිබඳ පැහැදිලි කල ප්‍ර.ග.නි. එහි පිටපතක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට එකඟ විය.<br>ජාතික සහජීවනය කෙරෙහි ඍජු බලපෑමක් ඇති කරවන සංසිද්ධියක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | බැවින් අමාත්‍යාංශය මගින් රූපවාහිනී වැඩසටහන්, ගුවන් විදුලි වැඩසටහන් සහ විස්තර පත්‍රිකා මගින් මහජනතාව දැනුවත් කිරීම කාලීන අවශ්‍යතාවයක් සේ සලකා කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි. වෙත උපදෙස් දෙන ලදි. |
| 6. | රාජ්‍ය ආයතන වල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය | පෞද්ගලික අංශයට ද මෙය බලපැවැත්වෙන පරිදි අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු බව අවධාරණය කළ අතර, ඒ සඳහා අදාල පනත සංශෝධනය කළ යුතු බවට යෝජනා කරන ලදි. |
| | **රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**<br>**2016 මාර්තු 10** | |
| 1 | දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක තනතුරු 33 ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල පරිවර්තන කාර්යයන්හි සිදුවන ප්‍රමාදය සහ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06ක් පුරප්පාඩුව පැවතීම | පවතින වැටුප් තල වල ගැටලු හේතුවෙන් දෙපාර්තමේන්තුවට බඳවා ගන්නා නිලධාරීන් රඳවා ගැනීමේ අපහසුවක් පවතින බව ප්‍ර.ග.නි./ග.නි පෙන්වා දුන්නේය.<br>මෙම තනතුරු විශේෂිත සේ සලකා භාෂා පරිවර්තකයින් විශේෂ වැටුප් තලයක පිහිටුවීම සුදුසු බව කාරක සභාව පෙන්වා දුන් අතර, මෙම ගැටළුව විසඳා ගැනීමේ ක්‍රියාමාර්ගයක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමග සාකච්ඡා කර 2016 මාර්තු 31 වන දිනට පෙර කාරක සභාව වෙත දන්වන ලෙස ප්‍ර.ග.නි./ග.නි වෙත නියෝග කරන ලදි.<br>කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය සේවක සංඛ්‍යාව (245) අනුමත කර තිබුන ද, ඒ සඳහා අමතර ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් නොලැබෙන බව දන්වා ඇති බැවින්, මෙම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට නොහැකිව පවතින බව ග.නි. පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | මේ සඳහා ප්‍රායෝගික විසඳුමක් ලබා දීමට කටයුතු කරන ලෙස මහා භාණ්ඩාගාර නිලධාරීන්හට උපදෙස් ලබා දෙන ලදි. |
| 2 | ත්‍රි භාෂා ශබ්ද කෝෂ පොත් 58ක ඌනතාවයක්, ලේඛන දෙමළ නව පොත් 21 ක් විනාශ වීම සහ 2012 වර්ෂයේ දී රු.49,000/= වටිනාකමකින් යුත් කථන දෙමළ පොත් 150ක් හා ලේඛන දෙමළ පොත් 95 ක් අස්ථාන ගත වීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග | මේ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වෙන බවත්, මාස 02 ක් තුල ඒ සම්බන්ධව වාර්තාවක් ලබා දෙන බවත් ග.නි. ප්‍රකාශ කළේය. |
| 3 | රාජ්‍ය නිලධාරින්හට භාෂා ප්‍රවීනතාවය ලබා ගැනීමේ පහසුකම් සැලසීම වෙනුවෙන් e- Learning දුරස්ථ ඉගෙනුම් ක්‍රම වේදය ක්‍රියාත්මක කිරීම. | සම්පත් දායකයන් හට ගෙවීම් කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් අනුමත කර ඇති ගාස්තු ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, ඔවුන්ගේ සේවය ලබා ගැනීමේ අපහසුතාවක් පවතින බැවින්, මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව ප්‍ර .ග.නි./ග.නි විසින් ප්‍රකාශ කරන ලදි. |
| 4 | සිංහල - දෙමළ ස්වයංක්‍රීය භාෂා පරිවර්තන මෘදුකාංග ස්ථාපිත කිරීම. | මොරටුව විශ්ව විද්‍යාලය සමග එක්ව මෙම කටයුත්ත සිදු කෙරෙන බවත් ඉදිරි මාස 06 ඇතුලත මෘදුකාංගය ස්ථාපිත කර අවසන් කිරීමට හැකි බවත්, ග.නි. පැවසීය. |
| | **කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**<br>**2016 මාර්තු 11** | |
| 1 | කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සහ වැඩ බැලීමේ පදනම යටතේ පවතින තනතුරු | පුරප්පාඩු සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව ප්‍ර.ග.නි/ග.නි පැවසීය.<br>පවතින 203 ක සේවක පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් දින වකවානු සහිතව කාරක සභාවට ඉදිරිපත් කරන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ලෙස ප්‍ර.ග.නි/ග.නි හට නියෝග කරන ලදි. |
| 2 | කර්මාන්ත ක්ෂේත්‍රය, කර්මාන්ත ප්‍රමාණය, සහ කර්මාන්ත පුර වලින් ජනනය වන රැකියා ප්‍රමාණය | ලබා දුන් තොරතුරු පිලිබඳව සෑහීමකට පත් විය නොහැකි බව කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි ට දන්වා සිටි අතර, ඒ සම්බන්ධයෙන් විස්තරාත්මක වාර්තාවක් මාර්තු 31 දිනට පෙර ඉදිරිපත් කරන ලෙස නියෝග කරන ලදි. |
| 3. | වර්තමාන කර්මාන්තපුර වල එක්රැස්වන කාර්මික අපද්‍රව්‍ය කළමණාකරණය | දැනට අමාත්‍යාංශයේ මැදිහත්වීම මත දංකොටුව ප්‍රදේශයේ පිහිටි කර්මාන්ත ශාලාවල අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මධ්‍යම ඒකකයක් (Central Unit) සකස් කිරිමේ එකඟතාවයට පැමිණ ඇති බවත්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද වෙන් කර ගෙන ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. |
| 4. | සංඛ්‍යා ලේඛන වලට අනුව කර්මාන්ත ශාලා ප්‍රමාණය මෙන්ම ඒවායේ සේවක සංඛ්‍යාවද අඩුවීමක් නිරීක්ෂණය වීම සහ එයට හේතු | ප්‍රතිපත්තිමය වෙනස්කම්, අධික බදු පැනවිම සහ පිටරටින් භාණ්ඩ ගෙන්වීම වැනි කරුණු මෙම තත්ත්වයට හේතු වී ඇති බවත්, කර්මාන්ත ශාලා පිහිටුවිමේදි ගිවිසුම් ගතව කටයුතු කළත්, ව්‍යවසායකයාගේ අභිමතය පරිදි එයින් ඉවත් විමේ අවස්ථාව ද ඔවුනට හිමිව තිබිම මෙම තත්ත්වයට හේතුව බව ප්‍ර.ග.නි./ග.නි ප්‍රකාශ කළේය. |
| 5. | අමාත්‍යාංශයට වෙන් කරන ලද රුපියල් බිලියන 3.116 ක ප්‍රාග්ධන වියදමින් 1.8% ක් වෙන් කරන ලද ණය ව්‍යාපෘතිය | 8% පොලී අනුපාතයක් මත සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සහ කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධනය සඳහා ණය සැපයෙන මෙම අරමුදල සඳහා රාජ්‍ය බැංකු 10 ක් සම්බන්ධ වි ඇති බවත්, අමාත්‍යාංශ නිලධාරීන් හරහා මෙහි කටයුතු සිදු කෙරෙන බවත්, එය තව දුරටත් ක්‍රමවත් කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වය යටතේ කැබිනට් අනුමැතිය මත කාර්ය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | සැලැස්මක් සකස් කර ඇති බවත්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සමඟ සම්බන්ධ වී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රචාරය කරන බවත්, අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සුදුසු පුද්ගලයන් තේරීම සඳහා කටයුතු සිදුවන බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කරන ලදී.<br>එම ආයතන වල කටයුතු පිළිබඳව සවිස්තර වාර්තාවක් මාර්තු 31 වන දිනට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි හට නියෝග කරන ලදී. |
| 6. | කර්මාන්ත අමාත්‍යාංශයේ යටතේ පවතින අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තයේ ප්‍රගතිය | මෙම කර්මාන්තය සඳහා මාස 06 ක ප්‍රායෝගික පුහුණුවක් ලබා දී, අදාළ කර්මාන්තයට පුද්ගලයින් යොදවන බවත්, ඒ සඳහා රුපියල් මිලියන 70 ක් අනුමත කර ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| | **වාණිජ දෙපාර්තමේන්තුව**<br>**2016 මාර්තු 11** | |
| 1. | පසුගිය වසර 10 කාලය තුල දළ දේශීය නිෂ්පාදනය මෙන්ම දළ ජාතික නිෂ්පාදනය ද ප්‍රතිශතාත්මකව අඩුවීමක් පෙන්වා ඇති බැවින් එයට හේතු වූ කරුණු. | අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ අපනයනයන් ප්‍රමාණවත් විවිධාංගීකරණයක් නොවීම, ලෝක වෙළඳපලේ ඇති වූ දැඩි තරගකාරිත්වය, අපනයනය ප්‍රමාණාත්මක අඩුවීම සහ අපනයන කාලානුරූපව නවීකරණය නොවීම එයට හේතු වී ඇති බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |
| 2 | GSP+ සහනය සහ ධීවර නිෂ්පාදන අපනයන තහනම ඉවත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව ගෙන ඇති ක්‍රියාමාර්ග. | 2004 සහ 2005 වර්ෂවල GSP සහනය අපේක්ෂාවෙන් අයදුම්පත් ඉදිරිපත් කළ ද, එවකට පැවති යුද්ධය නිසා 2008 වර්ෂයේ ඒ පිළිබඳව සලකා බැලීම පවා සිදුනොවූ බවත්, ඉල්ලීම නැවත ඉදිරිපත් කිරීම සඳහා අයදුම්පත් සකස් කරමින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | පවතින බවත්, අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ තත්ත්වය සතුටුදායක බැවින් මානව හිමිකම් සම්මුතින් 3 ක් පමණක් පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිචාරය ඔවුන් අපේක්ෂා කරන බවත්, ධීවර තහනම ඉවත් කරගැනිම සඳහා එම අමාත්‍යාංශය සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් කටයුතු කළ බවත් ප්‍ර.ග.නි./ග.නි පැවසීය.<br><br>මැයි මාසය වන විට එම තහනම ඉවත් කරගැනිමට හැකිවෙතැයි ප්‍ර.ග.නි. විශ්වාසය පළකළේය. |
| 3 | දූත මණ්ඩලවල සේවයේ යොදවා ඇති වාණිජ නිලධාරින්ගේ කාර්ය භාරය හා එම නිලධාරින් පත්කිරිම මගින් රටට ලැබී ඇති වාසිදායක තත්වය. | සැම වාණිජ නිලධාරියෙකුම අමාත්‍යාංශ අනුමැතිය මත වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ආයෝජන සහ අපනයන ප්‍රවර්ධනය පිණිස ඉලක්ක ගත වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කළ යුතු බවත් , එහි ප්‍රගතිය යළි වාර්තා කළ යුතු බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසිය.<br><br>විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පිහිටුවා ඇති අනෙකුත් ආයතන අතර අන්තර් සම්බන්ධතාවක් නොපැවැත්වීම පිළිබඳව කාරක සභාවේ අප්‍රසාදය පළවූ අතර, නිසි සැලැස්මක් සහිතව එම ආයතන අතර සම්බන්ධීකරණයන් සිදුකර ඉදිරි පස් වසර තුල ප්‍රවර්ධනය කළ හැකි කර්මාන්ත හඳුනාගෙන වාර්තාවක් සහ වාණිජ නිලධාරින් සේවයේ යොදවා ඇති රටවල් 25 තුල ආයෝජන හා අපනයන ප්‍රවර්ධනය සඳහා ඔවුනට ලබා දී ඇති ඉලක්ක සහ ඒ පිළිබඳව දෙපාර්තමේන්තුව සිදු කර ඇති පසු විපරම සම්බන්ධයෙන් වාර්තාවක් මසක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | තුල කාරක සභාවට ලබා දෙන ලෙස ප්‍ර.ග.නි.හට නියෝග කරන ලදි. |
| **සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව<br>2016 මාර්තු 11** | | |
| 1. | ආයතන කාර්ය සාධනය කෙරෙහි ඍජු බලපෑමක් සිදුව ඇති 39% ක් වූ කාර්ය මණ්ඩල හිඟය. | පුරප්පාඩුව පැවති ඇතැම් තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කර ඇති බවත්, කැබිනට් මණ්ඩල අනුමැතිය මත පූර්ණ කාලීනව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ධූරයට නිලධාරියෙකු පත් කර ඇති බවත්, දැනට සමාගම් රෙජිස්ට්‍රාර් තනතුරෙහි වැඩබලන නිලධාරිනිය එම තනතුරේ ස්ථිර කිරිමේ ගැටලුවක් පවතින බවත් ප්‍ර.ග.නි/ග.නි සඳහන් කළේය. |
| 2. | ප්‍රසම්පාදන සංග්‍රහයේ 5.4.8 (ආ) වගන්තියට අනුව කාර්ය සාධන ඇපකරයක් නොමැතිව රු. 88,812,227/= ක පරිගනක ගත කිරිමේ ව්‍යාපෘතියක් පිරිනැමීම මෙන්ම එය අසාර්ථක වීමෙන් ආයතනයට සිදුව ඇති රුපියල් මිලියන 13 ක පමණ මුල්‍යාමය පාඩුව. | ඒ සම්බන්ධයෙන් දින වකවානු සහිත වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි හට නියෝග කරන ලදි. |
| 3. | ලියාපදිංචි සමාගම් වෙතින් 2008-2015 කාල පරිච්ඡේදය තුල දෙපාර්තමේන්තුට අයවිය යුතු හිඟ ගාස්තු ලෙස පැවති රු 628,240,000/= ක මුදල අයකර ගැනිම සඳහා ගෙන ඇති පියවර. | සෑම නව ලියාපදිංචියකදිම සමාගම අදාළ මුදල ගෙවිය යුතු අතර දැනට සමාගම් 79,000 කට ආසන්න ප්‍රමාණයක් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වි ඇති බවත්, ව්‍යාපාරික කටයුතු සිදු නොවුවත් වාර්ෂික ලියා පදිංචිය සඳහා රු. 60,000/- මුදලක් ආයතනයට ගෙවිය යුතු බවත්, ආදායම් විෂමතාවයන් නොසලකා හිඟ මුදල් ගෙවිමෙන් ලියාපදිංචිය යථාවත් කර ගත හැකි බවත්, ප්‍ර.ග.නි/ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ඒ පිළිබඳ වාර්තාවක් ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි හට නියෝග කරන ලදි. |
| 4. | රු.මිලියන 325.65 ක අලාභයක් සිදුව ඇති සමාගමක කොටස් මිලදී ගැනීම සඳහා සමාගම් අරමුදලේ මුදල් යොදවා ලබා ගත් කොටස් වල අයිතිය සමාගම් අරමුදලට ලබා ගැනීම. | 2007 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් මෙම මුදල් E-Service Lanka නැමති රාජ්‍ය හා පෞද්ගලික ඒකාබද්ධ වූ ආයතනයක ආයෝජනය කර ඇති අතර එහි කොටස් හිමිකම් සහතිකය අමාත්‍යාංශ ලේකම්වරයා නමට ලබා දී ඇත. මෙම ගණුදෙනුව පරීක්ෂා කිරීම සඳහා ජනාධිපති විමර්ශන ඒකකයටත්, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයටත් දැනුම් දීමට කටයුතු කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි පැවසීය.<br><br>මෙම ගණුදෙනුව සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි හට නියෝග කරන ලදි. |
| **මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව<br><br>2016 මාර්තු 11** | | |
| 1. | 2015 වන විට මාණ්ඩලික ශ්‍රේණියේ පුරප්පාඩු 35 ක් සහ විවිධ අංශවල පැවති පුරප්පාඩු. | පවතින පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගෙන ඇති බවත්,ප්‍රමාණවත් සුදුසුකම් නොමැතිවීම හේතුවෙන් අභ්‍යන්තර බඳවා ගැනීම් ගැටලු සහගත බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |
| 2 | දෙපාර්තමේන්තු පරිශ්‍රය තුල නව මිනුම් විද්‍යාගාරයක් ඉදිකිරීමට ගත් තීරණය අනුව, සේවාවන් සපයාගැනීම සඳහා රු.15,325,542/= ක මුදලක් 2007 සිට 2009 දක්වා කාලය තුල වැය කර තිබුණත් ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණේ වසර 7 කට පසුව බැවින් එය නිෂ්කාර්ය වියදමක් වීම. | අදාල ස්ථානය අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකිරීමට ප්‍රමාණවත් නොවීම නිසා රුපියල් මිලියන 76 ක් ගෙවා නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් ලබා ගත් ඉඩමක එය ඉදිකර දැනට ක්‍රියාත්මක තත්වයේ පවතින බව ප්‍ර.ග.නි/ග.නි විසින් දන්වා සිටින ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 3 | නව පරිගනක ජාලය ක්‍රියාත්මක කිරීම | අරමුදල් ප්‍රමාණවත් නොවීම නිසා පරිගනක ජාල ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවීමට සිදු වූ බවත්, මේ සඳහා රු.මිලියන 50 ක ඇස්තමේන්තුවක් ලංකා වාණිජ විවිධ නීතිගත සංස්ථාව විසින් ඉදිරිපත් කර ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි පැවසීය. |
| **අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**<br>**2016 මාර්තු 11** | | |
| 1. | කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු . | ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු සඳහා අදාළ චක්‍රලේඛයට අනුව සිටින නිලධාරීන් 2018 වර්ෂයේ දී සුදුසුකම් ලබන බවත්, අනෙකුත් සියලු පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගනු ලබන බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී.<br>මෙම පුරප්පාඩු පිරවීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සකස් කළ වාර්තාවක් 2016 අප්‍රේල් මස 05 වන දිනට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 2. | 2012 මූල ධන වැය ඌන උපයෝජනයක් ද 2014 දී ප්‍රතිපාදන 9% - 79% දක්වා ඉතිරිවීමේ පරාසයක් ද පැවතීම. | 2014 දී සැලසුම් කළ අන්දමට රසායනාගාර උපකරණය මිලදී ගැනීමට නොහැකි වීම එයට හේතු වූ බව ග.නි.පැවසීය. |
| 3. | දෙපාර්තමේන්තුවේ කාර්යභාර්ය සහ ඉදිරි වසර පහ තුළ කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය වැඩි දියුණු කිරීම සඳහා ඉලක්ක ගත වැඩ පිළිවෙල සකස් කිරීම. | දැනට ඩොලර් බිලියන 0.5 ක මට්ටමේ පවතින අපනයන ආදායම 2020 වන විට ඩොලර් බිලියනයක් දක්වා වැඩි කර ගැනීම සඳහා සැලසුම් සකස් කර ඇති බව ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී.<br>අපනයන භෝග වර්ග ප්‍රවර්ධන සැලසුම්, ඉලක්ක ගත විදේශ විනිමය ප්‍රමාණය, |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | | 2020 වර්ෂයේදී එය සපුරා ගන්නා අන්දම, 2017, 2018 සහ 2019 යන වර්ෂ වලදී ක්‍රමානුකූලව එම අරමුණු කරා ලඟා වන ක්‍රමවේදය ඇතුලත් වාර්තාවක් 2016 අප්‍රේල් මස 30 වන දිනට පෙර කාරක සභාවට ලබාදිමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 4. | රජයට සහ පුද්ගලික අංශයට අයත් අක්කර 350 ක පමණ ඉඩම් ප්‍රමාණයක් පවරා නොගැනීම. | අදාළ ඉඩම් වලින් කැබලි 07 ක් මේ වන විට පවරා ගෙන තිබෙන බවත්, ඉතිරි ඉඩම් කැබලි 42 අත්කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| 5. | 2012 ජූලි 26 දින සොරා ගත් බව සඳහන් වන දෙපාර්තමේන්තුවට අයත් පැජරෝ වර්ගයේ ජීප් රථය පිළිබඳ සිදු කළ පරීක්ෂණ හා එහි පාඩුව පියවා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග. | එහි පරීක්ෂණ කටයුතු අවසන් කර ඇති බවත්, අදාළ රියදුරු සේවයෙන් පහකර ඇති බවත්,වාහනය අනුයුක්ත කර තිබූ නිලධාරියාගෙන් නිර්දේශිත මුදලක් අය කරගැනීමට කටයුතු කර ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදි.<br><br>එම සම්පූර්ණ සිදුවීම පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 6 | වල්ලපට්ට ශාක අපනයනයෙන් විශාල විදේශ විනිමයක් උපයා ගත හැකි බැවින් එය ප්‍රවර්ධනය කිරීම. | පෞද්ගලික අංශය මඟින් එම ශාකය දැනටමත් ප්‍රවර්ධනය කරමින් පවතින බව ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>නීත්‍යානුකූලව එම ශාකය වගා කිරීම පිළිබඳ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කරන ලෙස කාරක සභාව විසින් යෝජනා කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව (යළි කැඳවීම)<br>2016 මාර්තු 23** | | |
| 1 | රජයේ පවතින නීති රීති වලට අනුකූල නොවන අන්දමේ අතිකාල ගෙවීම් සම්බන්ධයෙන් පිළිගත නොහැකි ක්‍රමවේදයක් රේගු දෙපාර්තමේන්තුව අනුගමනය කර ඇත. | ඒ පිළිබඳව වාර්තාවක් 2016 මැයි 01 වන දිනට පෙර ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදි. |
| 2. | 1989 අංක 13 දරණ නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) පනත පූර්ණ වශයෙන්ම ක්‍රියාත්මක නොවීම හේතුවෙන් රටට අහිමි වන ආදායම. | පනත සංශෝධන කිරීමට නීතිපතිවරයා විසින් ලබා දී ඇති යෝජනා වලට අනුගත වීම සම්බන්ධයෙන් සහ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දින වකවානු ඇතුලත් වාර්තාවක් 2016 මැයි 01 වන දිනට පෙර ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. /ග.නි වෙත නියෝග කරන ලදි. |
| 3. | මධ්‍යම අපහරණ අංශය මඟින් අලෙවි කළ විදුලි මෝටර් රථයක් ලියාපදිංචි කිරීම වෙනුවට රු. මිලියන 36 කට වැඩි වටිනාකමකින් යුත් "හමර්" මාදිලියේ රථයක්, එකලස්කල රථයක් ලෙස ලියාපදිංචි කිරීමට හැකි අයුරින් පරිගනක පද්ධතියට වංචනික තොරතුරු ඇතුළත් කර තිබීම. | මෙවැනි වංචා වැළැක්වීම සඳහා ආයතන අතර පරිගණක පද්ධති එකිනෙකට සම්බන්ධ විය යුතු බවත්, ස්වයංක්‍රීය සැසඳුම් ක්‍රමයක් තිබීම වැදගත් බවත්, මේ සම්බන්ධව පරීක්ෂා කර, වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත්, ප්‍ර.ග.නි හට දැන්වීය. |
| 4. | රු. 859,500/= ක් වැය කර ඇඟිලි සළකුණු යන්ත්‍ර 07 ක් මිළ දී ගෙන තිබියදීත් එම යන්ත්‍ර භාවිතා කිරීම රේගු නිලධාරින් විසින් ප්‍රතික්ෂේප කිරීම සහ නව රේගු ගොඩනැගිල්ලේ මෙම යන්ත්‍ර ස්ථාපිත කිරීමට කටයුතු නොකිරීම. | රේගු නිලධාරින්ගේ වෘත්තීමය ස්වභාවය අනුව එක් ස්ථානයකට පමණක් ඔවුන්ගේ සේවාව සීමා නොවීම සහ එම යන්ත්‍ර ඉතා සියුම් තාක්ෂණයක් සහිත බැවින් ඒවා භාවිතා කිරීමේ ප්‍රායෝගික අපහසුතාවයන් පවතින බව ග.නි. පැහැදිලි කළේය.<br>මෙම තත්ත්වය සම්බන්ධයෙන් නීතිමය ආවරණයක් ලබා ගන්නා ලෙසත්, මේ පිළිබඳව වාර්තාවක් 2016 මැයි 01 වන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | දිනට පෙර ඉදිරිපත් කරන ලෙසත් ප්‍ර.ග.නි./ග.නි වෙත නියෝග කරන ලදි. |
| 5. | මනුෂ්‍ය ආහාරයට නුසුදුසු සුදුළූනු සහිත බහාලුම් ගැණුම්කරු වෙත මුදාහැර තිබීම සහ රු. 1,134,000/= ක රේගු බදු අත් හැර තිබීම. | මහජන සෞඛ්‍ය පිළිබඳව දැඩි ආරක්ෂක පිළියම් යෙදීමේ වගකීම සම්බන්ධයෙන් විමසා සිටි අතර මේ පිළිබඳව පසු විපරම් කටයුතු සිදු කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි වෙත නියෝග කළේය. |
| 6. | තීරු බදු නිදහස් පදනම මත ලබන බදු සහනය. | කටුනායක අන්තර්ජාතික ගුවන්තොටුපලේ තිරුබදු නිදහස් පදනම මත භාණ්ඩ අලෙවි කරන වෙළඳ සැල් හිමියන් විසින් ගුවන් මගීන්ට අදාළ බදු සහනය නිසියාකාරව ලබා දීම නිරීක්ෂණය කිරිම සඳහා විධිමත් වැඩපිළිවලක් සකස් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි වෙත නියෝග කරන ලදි. |
| 7. | වාහන ආනයන කිරීමේ දී සිදුවන අක්‍රමිකතා සහ වාහන ලියාපදිංචියේ දී සිදු කරන වංචා පිළිබඳ තොරතුරු ලබා ගැනීමට විධිමත් ක්‍රියාපටිපාටියක් නොමැති වීම නිසා රජයට අහිමි වන බදු ආදායම . | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී වාහන ආනයන බදු අයකර ගැනීමට ක්‍රමවත් වැඩ පිළිවලක් සකස් කරන ලෙස ප්‍ර.ග.නි. /ග.නි වෙත නියෝග කරන ලදි.<br><br>බහාලුම් පරීක්ෂාව සඳහා අධි තාක්ෂණික ස්කෑන් යන්ත්‍ර යොදා ගැනීමට නියමිත බවත්, ඉන් පසුව මෙම තත්ත්වය ක්‍රමවත් කිරීමට හැකි වනු ඇති බවත් ග.නි. ප්‍රකාශ කළේය. |
| 8. | බහාලුම් මෙහෙයුම් මධ්‍යස්ථානවල දී රාජසන්තක කරන ලද භාණ්ඩ පිළිබඳව විස්තරාත්මක තොරතුරු නොමැති වීම හේතුවෙන් එම භාණ්ඩ වෙන්දේසි සඳහා යොමු කිරීමේ දී සත්‍ය වශයෙන්ම එම භාණ්ඩ පැවති තත්ත්වයේම පවතී ද යන්න තහවුරුකර ගැනීමේ හැකියාවක් නොමැති වීම. | භාණ්ඩ රාජසන්තක කළ අවස්ථාවේ පැවති උපාංග, වෙන්දේසි කිරීමේ දී නොතිබීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව ගෙන ඇති ක්‍රියාමාර්ග වාර්තා කරන ලෙසත්, මෙම තත්ත්වය නියමානුකූල කිරීමට වැඩ පිළිවලක් සකස් කර එය කාරක සභාව වෙත යොමු කරන ලෙසත් ප්‍ර.ග.නි. /ග.නි වෙත නියෝග කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 9. | රේගු බදු රහිතව භාණ්ඩ මිල දී නොගන්නා මගීන්ගේ ගුවන් ගමන් බලපත්‍ර අංක යොදාගෙන බාහිර පුද්ගලයන් විසින් තීරු බදු රහිත සාප්පු සංකීර්ණ වලින් භාණ්ඩ මිළ දී ගැනීම වැලැක්වීම. | මේ සඳහා සුදුසු අභ්‍යන්තර වැඩ පිළිවලක් නොයෙදීම සම්බන්ධයෙන් කාරක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. /ග.නි වෙත නියෝග කරන ලදි. |
| 10. | රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ලබා ගන්නා ත්‍යාග (දිරි දීමනා) සහ එහි නීතිමය තත්ත්වය. | දිරි දීමනා සම්බන්ධයෙන් නීතිමය තත්ත්වය සහ රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවලින් පසුගිය අවුරුදු 10 තුල අය කර ඇති දඩ මුදල් ආදායම ආයතන වශයෙන් වෙන්ව සකස් කළ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව දැන්විය. |
| | **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (යළි කැඳවීම)**<br>**2016 මාර්තු 24** | |
| 1. | විගණන විමර්ශන කටයුතු වල ප්‍රගතිය | විගණන විමසුම් මගින් ඉදිරිපත් කොට තිබූ කරුණු වලින් දෙකක් හැර අනෙකුත් සියල්ල සම්බන්ධයෙන් පැහැදිලි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් විචක්ෂණභාවයකින් තොර මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි බවත්, මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු කෙරෙහි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව දැඩි අවධානය යොමු කළ යුතුව පවතින බවත් විගණකාධිපතිවරයා අවධාරණය කළේය.<br><br>විමර්ශනයට භාජනය වන සිදුවීම් ඇති වූ අවස්ථාවලදී වත්මන් නිලධාරීන් සේවයේ යෙදී නොසිටීම යන කරුණ අදාළ නොවන බවත්, සියළු තොරතුරු ඉදිරිපත් කිරීමට වත්මන් නිලධාරීන් බැඳී සිටින බවත්, කාරක සභාව විසින් අවධාරණය කරන ලදි. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| 2. | වාහන ලිපි ගොනු 597 අස්ථානගතවීම | මෙම ලිපි ගොනු අතරින් 52 ක් ලැබී තිබෙන බවත්, එයින් 28 ක් විගණනය සඳහා භාර දී ඇති බවත්, ඉතිරි ලිපි ගොනු සෙවීම සඳහා කටයුතු යොදා ඇති බවත්, ප්‍ර.ග.නි./ග.නි. විසින් සඳහන් කරන ලදි.<br><br>ලිපිගොනු විමර්ශනය සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටි සමස්ත ලිපිගොනු සංඛ්‍යාව සහ ලබා දී ඇති ප්‍රමාණය නිශ්චිතව කාරක සභාවට දන්වන ලෙස විගණකාධිපතිවරයාට දන්වන ලදි.<br><br>2015 වසර තුළ නව වාහන 668,907 ක් ලියාපදිංචි කර ඇති බව ග.නි. දන්වා සිටියේය. එම ලියාපදිංචි වාහන ප්‍රමාණය තුල පවතින මෝටර් රථ ( Motor Car ) 105,628 ක් පිළිබඳව තොරතුරු රේගුවට යොමු කොට නිර්දේශයක් ලබාගන්නා ලෙසත්, එම වාහන ආනයනය හා ලියාපදිංචිය පිළිබඳ වාර්තාවක් කාරක සභාවට ලබාදෙන ලෙසත් ප්‍ර.ග.නි. /ග.නි.හට නියෝග කරන ලදි.<br><br>සැම මසකම අවසානයේ දී දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී හා අභ්‍යන්තර විගණක එක්ව, වාහන ආනයනය පිළිබඳ තොරතුරු රේගුව මගින් ලබාගෙන ඒවා ලියාපදිංචි වීම සමඟ සසඳා වාර්තාවක් සකස් කරන ලෙසත්, එය මෙම මාර්තු මස 31 දින සිට ක්‍රියාත්මක කරන ලෙසත්, කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදි. |
| 3. | E මෝටරින් ව්‍යාපෘතිය. | 2009 වසරේ සිට රුපියල් මිලියන 700 ක් වැය කොට තිබියදීත්, මෙම ව්‍යාපෘතියේ අකර්මණ්‍ය ස්වභාවය පිළිබද කාරක සභාව විසින් සිය දැඩි අප්‍රසාදය පළ කරන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | කාර්යාල කටයුතු පිළිබඳව නිල ලෙස සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් මෙම දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි.ට උපදෙස් ලබා දුන් කාරක සභාව, එහි ක්‍රියාත්මක භාවය පිළිබඳව වාර්තාවක් මැයි මස 01 වෙනි දිනට පෙර එවන ලෙස ග.නි.වෙත නියෝග කරන ලදි.<br><br>එමෙන්ම E මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ICTA සහ LANKA CLEAR යන ආයතන වලින්ද උපදෙස් ලබාගන්නා ලෙසත්, මුදල් අමාත්‍යාංශය සමඟ නැවතත් සාකච්ඡා කර අවශ්‍ය පියවර ගන්නා ලෙසත් ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදි. |
| 4. | වාහන 5494 අවිධිමත් ලෙස ලියාපදිංචි කර තිබීම. | මේ පිළිබඳව විස්තරාත්මක වාර්තාවක් 2016 ජුනි මස 10 දිනට පෙර ලබා දෙන ලෙස නියෝග කරන ලදී. |
| 5. | අත් ට්‍රැක්ටර් ආනයනය කළ රේගු සටහන් භාවිතා කරමින් ප්‍රාඩෝ ජීප් රථ 7 ක් ලියාපදිංචි කිරීම පිළිබඳව 2009 වර්ෂයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර තිබුණ ද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ඊට අදාළ ලිපි ගොනු ලබා නොදීම හේතුවෙන්, එම පරීක්ෂණ කටයුතු පවත්වගෙන යා නොහැකි බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දන්වා ඇති බැවින්, ඒ පිළිබඳව ගනු ලබන ක්‍රියා මාර්ග. | ඒ පිළිබඳ මූලික විමර්ශන කටයුතු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් අරඹා ඇති බවත්, එහි ප්‍රගතිය මෙම කාරක සභාවට වාර්තා කිරීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය.<br><br>එම පරීක්ෂණය සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ නිලධාරියෙකු ද සහභාගි කරවන ලෙසත්, තොරතුරු රේගු දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලෙසත්, උපදෙස් ලබා දුන් කාරක සභාව, මෙම වාහන අසාධු ලේඛණගත කිරීමෙන් පමණක් නොනැවතී ඒවායේ ලියාපදිංචිය අහෝසි කිරීමට කටයුතු කරන ලෙස ද, ප්‍ර.ග.නි./ග.නි. වෙත උපදෙස් දෙන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 6 | විගණන විමර්ශන සමාලෝචනය | විගණකාධිපතිවරයා ඉදිරිපත් කර තිබූ කරුණු පිළිබඳ දීර්ඝ ලෙස සමාලෝචනයක යෙදුණු කාරක සභාව මෙම දෙපාර්තමේන්තුවේ බරපතල පරිපාලන දුර්වලතා මෙන්ම අකාර්යක්ෂමතාවයන් පවතින බව අවධාරණය කළේය. එම තත්වය මඟ හරවා ගැනීම සඳහා වහා විසඳුම් සෙවිය යුතු බවත්, ඒ සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර දෙපාර්තමේන්තුවේ කටයුතු දැඩි ලෙස අධීක්ෂණයකට ලක් කළ යුතු බවත්, නිකුත් කරනු ලබන උපදෙස් ක්‍රියාත්මක නොවන්නේ නම් ඒ පිළිබඳව ගිණුම් කාරක සභාව වෙත වාර්තා කරන ලෙසත් ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදි.<br><br>E මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන තෙක් මෙම දෙපාර්තමේන්තුවේ කළමනාකරණය සඳහා පැහැදිලි වැඩ පිළිවෙලක් සකස් කොට, එහි ප්‍රගතිය කාරක සභාවට වාර්තා කරන ලෙසත්, සංශෝධිත E මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවෙන අයුරු දින වකවානු සහිත වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසත් නියෝග කරන ලදි. |
| | **කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය**<br><br>**2016 අප්‍රේල් 07** | |
| 1 | කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම | සියලුම පුරප්පාඩු පිරවීම සඳහා කඩිනමින් කටයුතු කරන බව ප්‍ර.ග.නි.විසින් ප්‍රකාශ කරන ලදි. |
| 2 | රු.මිලියන 11,940/= ක් අය කර ගැනීම සඳහා වූ නඩු 13,604 ක් පැවතීම, ඒ අතුරින් රු.මිලියන 429 ක් සඳහා නඩු | කාලයක් තිස්සේ පවතින නඩු 16,000 ක් පමණ තිබෙන බවත් මෙම නඩු කටයුතු |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | 2,385 ට විවෘත වරෙන්තු නිකුත් කර තිබීම හා එම නඩු කටයුතු වල මන්දගාමී ස්වභාවය. | ක්‍රමානුකූලව නිම කිරීමට පියවර ගෙන තිබෙන බවත් ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br><br>පවරා ඇති නඩු වලින් රු. බිලියන 11 ක් පමණ අය වීමට තිබෙන බැවින්, මෙම ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ක්‍රියාකාරී වැඩපිළිවෙලක්, සකස් කර ඒ පිළිබඳ වාර්තාවක් 2016 ජුනි මස 15 දිනට පෙර එවන මෙන්, ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදි. |
| 3 | වාහන අනතුරු හේතුවෙන් සිදුව ඇති රු. මිලියන 7.3 ක පමණ අලාභය | එම අනතුරු වලින් සිදුව ඇති අලාභ හා පාඩු පියවා ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇතිවීම අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලබන බවත් ප්‍ර.ග.නි. පැවසීය. |
| 4 | බාල වයස්කාර ගිණුම් හිමියන්ගේ ලිපි ගොනු හා ගිණුම් පොත් අනාරක්ෂිතව පැවතීම සහ ඒවා යාවත්කාලීන කිරීම. | ගිණුම් සියල්ලම පරිගනක ජාලගත කිරීමේ කටයුතු අරඹා ඇති බවත්, ඒ අනුව වාර්ෂිකව යාවත්කාලීන කිරීමක් ද සිදුවන බවත්, කම්කරු වන්දි කොමසාරිස්වරිය ප්‍රකාශ කළාය. |
| 5. | සේවකයින්ට මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට වන්දි ලබා දීමේ ක්‍රමවේදය සහ සේවා කාළය තුළ දී මෙන්ම සේවයට පැමිණීමේ දී ද සිදුවන අනතුරු වලදි වන්දි ලබා ගැනීම. | සේවක පාර්ශ්වය කෙරෙහි වැඩි අවධානයක් යොමුකර, සේවා යෝජකයින් හා වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කර, කාලෝචිත අයුරින් මෙම කම්කරු වන්දි පනත සංශෝධනය සඳහා අවශ්‍ය පියවර නොපමාව ගන්නා ලෙස ප්‍ර.ග.නි. වෙත උපදෙස් ලබා දෙන ලදි.<br><br>කම්කරු නීති හා අණපනත් සහ එහි ප්‍රතිලාභ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට නිසි වැඩපිළිවලක් ක්‍රියාත්මක කරන ලෙස ද උපදෙස් ලබා දෙන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **කම්කරු දෙපාර්තමේන්තුව<br>2016 අප්‍රේල් 07** | | |
| 1 | අර්ථ සාධක අරමුදල් නිසි පරිදි අය නොවීම සහ සේවා යෝජකයින් අර්ථ සාධක අරමුදල් වාරික නොගෙවීම. | කම්කරු කාර්යාල වල පවතින ගැටලු විසඳා ඇති බවත්, අරමුදල සඳහා වාරික නොගෙවීම සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියා මාර්ග වලට අවතීර්ණ වීමට සිදුවන බවත්, අදාළ සියලු කරුණු සැලකිල්ලට ගෙන සේවක අර්ධසාධක අරමුදල් පනත සංශෝධනය සඳහා කටයුතු කර තිබෙන බවත්, ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. |
| 2 | දෙපාර්තමේන්තුව සතුව තිබූ වටිනාකම රු. 800,000/= ක් වූ වාහනයක් 2002 ජනවාරි මාසයේදි පැහැරගැනීමට ලක්විම පිළිබඳව ක්‍රියා මාර්ග ගැනීම ප්‍රමාද වීම. | නැතිවූ වාහනය පිළිබඳව විස්තර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන, අදාළ පරීක්ෂණ කටයුතු වලින් ලබා දී තිබෙන නිර්දේශ හා අලාභය අය කර ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ වාර්තාවක් සති දෙකක් ඇතුළත කාරක සභාව වෙත එවන මෙන් ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. |
| 3 | අල්ලස් චෝදනා යටතේ අත්අඩංගුවට පත්වූ නිලධාරීන් හතර දෙනෙකුට එරෙහිව විධිමත් විනය ක්‍රියා මාර්ග ගෙන නොතිබීම. | අදාළ නිලධාරීන් අනිවාර්ය නිවාඩු යවා ඇති බවත්, නඩු පැවරීමෙන් පසු වැඩ තහනමකට ලක් කර ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. එයට අදාළ සියලු තොරතුරු විගණකාධිපතිවරයා වෙත වාර්තා කරන මෙන්, ප්‍ර.ග.නි./ග.නි. හට නියෝග කරන ලදි. |
| **මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව<br>2016 අප්‍රේල් 07** | | |
| 1 | පාසල් සිසුන්, උපාධි අපේක්ෂකයින්, දෙමව්පියන් හා ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා රු. මිලියන 3.5 ක් වැය කරමින් සිදු කරන ලද වෘත්තීය මාර්ගෝපදේශන වලින් ලැබී ඇති ප්‍රතිඵල. | රැකියා ලබා ගැනීම අරමුණු කර ගෙන ඒ සඳහා වන අධ්‍යාපනයට යොමුකරවීම සඳහා මෙම වෘත්තීය මාර්ගෝපදේශන වැඩ සටහන් සාර්ථකව පැවැත්වූ බවත්, එමගින් සාධනීය ප්‍රතිඵල ලැබී ඇති බවත්, ප්‍ර.ග.නි./ග.නි. විසින් ප්‍රකාශ කරන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | | ලදි. එම ක්‍රියාදාමය පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයා වෙත ලබා දෙන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත නියෝග කරන ලදි. |
| 2 | රාජ්‍ය හා පුද්ගලික අංශයේ හවුල් ව්‍යාපාරයක් ලෙස ආරම්භ කළ"රැකියා පියස" ව්‍යපෘතියෙහි කාර්ය සාධනය හා ඵලදායිතාව. | මෙම ව්‍යාපෘතිය සඳහා දිස්ත්‍රික් කාර්යාල මේ වන විට පිහිටුවීමට කටයුතු කර ඇති බවත්, ඒ වෙනුවෙන් වෙබ් අඩවියක්ද ස්ථාපිත කර රැකියා අපේක්ෂයින්ගේ හා රැකියා සපයන ආයතන වල තොරතුරු ඇතුලත් කර ඇති බවත් ග.නි. පැවසීය.<br><br>එම කටයුතු වල ප්‍රගතිය හේතුවෙන් පසුගිය වසරේ දී රැකියා 4437 ක් සපයා දීමට හැකියාව ලැබී ඇති අතර, එහි වර්ධනයක් මෙන්ම වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් මගින් ද<br><br>ඵලදායීතාවයක් අපේක්ෂා කරන බවත් ග.නි. පැවසීය. |
| 3 | ජාතික මිනිස් බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තිය සකස් කිරීම සහ වත්මන් ශ්‍රම බලකාය හා රැකියා වියුක්තිය. | එම ප්‍රතිපත්තිය සකස් කොට ක්‍රියාවේ යෙදවූ බවත්, නව රජයේ සංවර්ධන වැඩ පිළිවෙලට අනුගත වන අන්දමින් එය සංස්කරණය කොට නැවතත් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කොට ඇති බවත්, ප්‍ර.ග.නි./ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි.<br><br>ශ්‍රම බලකාය මිලියන 8.8 ක් වන බවත්, සේවා වියුක්තිය ලක්ෂ 4 ක් වන බවත්, එම පිරිස තුළ උපාධිධාරීන් 16,000 ක් සහ 5 ශ්‍රේණියට පමණක් අධ්‍යාපනය ලැබූ 15,000 ක් සිටින බවත්, ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. සමස්ත ශ්‍රම බලකායෙන් මිලියන 1.4 ක් රාජ්‍ය සේවකයින් වන අතර මිලියන 4 ක් පමණ පුද්ගලික අංශයේ සංවිධිත රැකියා නියුක්තිකයන් බව ද හෙතෙම පැවසීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 4 | කම්කරු නිලධාරීන්ගේ වෘත්තීය තත්ත්වය වැඩිදියුණු කිරීම. | වසරකට පරීක්ෂණ 75,000 ක් පමණ සිදු කරන සහකාර කම්කරු කොමසාරිස්වරුන් සහ කම්කරු නිලධාරීන් හට අවශ්‍ය පහසුකම් සැලසීම මෙන්ම සේවා තත්ත්වයන් උසස් කිරීම පිළිබඳ ගැටලු පවතින බව ප්‍ර.ග.නි. විසින් කාරක සභාවේ අවධානයට යොමු කරවන ලදි. අදාළ තනතුරු වල පුරප්පාඩු 202 ක් පවතින බවත්, ඒවා 2017 වසරේදී පිරවීමට කටයුතු කරන ලෙස උපදෙස් ලැබී ඇති බවත් ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. |
| **කෘෂිකර්ම අමාත්‍යාංශය<br>2016 අප්‍රේල් 07** | | |
| 1 | අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කරන ලද ඉල්ලීමට අනුව, කාර්ය මණ්ඩලය 1548 ක් වශයෙන් අනුමත කර එවා ඇති බවත්, අනෙකුත් පුරප්පාඩු පිරවීම සඳහා පත්වීම් බලධාරීන්ට ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවත්, ප්‍ර.ග.නි විසින් ප්‍රකාශ කරන ලදි. |
| 2. | 2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්මට ඇතුලත් කර නොතිබීම.<br>2012 සහ 2013 වර්ෂවල ක්‍රියාකාරී සැලැස්මට රුපියල් මිලියන 150 ක ප්‍රතිපාදන ලැබූ වී වගාව සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම හා සහල් අපනයන වැඩසටහන ඇතුලත් කර නොතිබීම.<br>කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාණිජ ගොවිපල ක්‍රියාත්මක නොකිරීම .<br>2015 වර්ෂයේ වැඩසටහන් 08ක් සඳහා රු. මිලියන 5.393ක ප්‍රතිපාදන සලසා | ක්‍රියාකාරි සැලැස්ම ක්‍රමවත් හා විධිමත් කළ යුතු බව ප්‍ර.ග.නි වෙත දැනුම් දෙන ලදි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| | තිබුණ ද, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබීම. | |
| 3. | රුපියල් 795,444,811/= ක වටිනාකමින් යුතු පොහොර මෙට්‍රික් ටොන් 7508.05 ක තොගයක් ගොවින්ට බෙදා නොදීම. | මේ සම්බන්ධයෙන් පවරා ඇති නඩුව නීතිපති උපදෙස් ලැබෙන තුරු කල් තබා ඇති බවත්, අලෙවි කළමනාකරුට විරුද්ධව පරීක්ෂණ සිදු කරමින් පවතින බවත්, ප්‍ර.ග.නි විසින් කාරක සභාව වෙත ප්‍රකාශ කරන ලදී. |
| 4. | පෞද්ගලික ආයතන දෙකක් සඳහා ලබාදී තිබූ ණය මුදල්වලින් 2014 වර්ෂය වන විට ද රු.1,362,961 ක හිඟ ශේෂයක් පැවතීම | අදාළ ආයතන වන, සඳරුවන් කෙත නමැති කිරි සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා එන්තරවාසියක් යවා ඇති බවත්, ලංකා ලිබියානු සමාගම වසා දමා ඇවර කිරීමෙන් පසුව අදාළ සියළුම මුදල් ගෙවා ඇති බවත්, ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| 5. | ගොවි භාරකාර අරමුදලේ ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ රුපියල් 7,241,456/= ක ඉතිරි කිරීමේ ගිණුම් ශේෂයක් පෙන්වා තිබුණද එය තහවුරු කෙරෙන තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම. | මෙම ශේෂ ගණනය කිරීම ප්‍රායෝගික වශයෙන් ගැටළු සහගත බැවින් ඒ සඳහා තවත් මාස 03 පමණ කාලයක් අවශ්‍යවන බව ප්‍ර.ග.නි. පැවසීය.<br>එය අවසන් කළ වහාම වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදි. |
| 6. | ගොවි භාරකාර අරමුදල පරිගනක ගත කිරීමේ වැඩසටහනේ ප්‍රගතිය. | කොළඹ විශ්වවිද්‍යාලය සමග ආරම්භ කිරීමට නියමිත පරිගනක කළමනාකරණ තොරතුරු පද්ධතියක් මගින්, ගොවිජන සේවා මධ්‍යස්ථානවල තිබෙන ගොවි බැංකු වල කටයුතු පරිගනක ගත කිරීමේ හැකියාවක් පවතින බව ප්‍ර.ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| 7. | කෘෂිකර්ම ක්ෂේත්‍රය තුල කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ ප්‍රගතිය. | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 50 ක ප්‍රතිපාදන වෙන් කරවාගෙන ඇති බවට ප්‍ර.ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| 8. | කෘෂි අස්වැන්න ලබා ගැනීමෙන් පසු ගබඩා කිරීම සහ මිල පාලනය කිරීමට ගනු ලබන ක්‍රියා මාර්ග.<br><br>කාබනික පොහොර භාවිතය වැඩි කිරීමේ ඉලක්කයන් සහ අපනයන ආදායම වැඩි කර ගැනීමේ ඉලක්කයන් පිළිබඳ දත්ත.<br><br>කාබනික පොහොර භාවිතය සම්බන්ධයෙන් ග්‍රාමසේවා කොට්ඨාශ මට්ටමින් ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ලබා ගත් තොරතුරු.<br><br>අපනයන ආදායම වැඩිකර ගැනීම සඳහා ගත යුතු ඉලක්කයන්.<br><br>කාබනික පොහොර සහ රසායනික පොහොර භාවිතය සම්බන්ධව අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය සහ දැනට සනාථ වී ඇති විද්‍යාත්මක අදහස. | මෙම තොරතුරු ඇතුලත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි වෙත නියෝග කරන ලදි. |
| 9. | කෘෂිකර්ම අමාත්‍යාංශය දැනට පවත්වාගෙන යන ගොවිජන මන්දිරය ගොඩනැගිල්ල පාර්ලිමේන්තුවට පවරා ගැනීම හේතුවෙන්, එම අමාත්‍යාංශය පවත්වාගෙන යාම සඳහා කුලී පදනම මත නව ගොඩනැගිල්ලක් තෝරා ගැනීමේ දි එහි මිල, මිල කමිටුවකින් තීරණය කිරීම හෝ තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව, වර්ෂ 05 ක් සඳහා රු. මිලියන 958 ක පමණ කුලියක් ගෙවීමට ගනු ලැබූ තීරණය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය සතුව ඇති බත්තරමුල්ලේ හෙක්ටයාරයක පමණ ඉඩමෙහි මේ සඳහා සුදුසු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවධානය යොමු නොකිරීම. | ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් අනුව මෙම ගොඩනැගිල්ල කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කුලී පදනම මත ලබා ගැනීමට නියමිත බවත්, ඒ සඳහා නීතිපතිවරයාගේ අනුමැතිය ලැබී ඇති බවත් ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය.<br><br>මෙම ගිවිසුම අත්සන් කිරීම සිදු නොකරන ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නියෝග නොකරන නමුත්, ගිවිසුමට කාරක සභාවේ අනුමැතිය හිමි නොවන බව කාරක සභාව විසින් අවධාරණය කරන ලදි.<br><br>එසේම විගණකාධිපතිවරයා විසින් මේ සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන විගණන විමසුම් වලදී , කාරක සභාවේ බලතල ප්‍රකාරව කටයුතු කිරීමට සිදුවන බව, කාරක සභාව විසින් අවධාරණය කරන ලදි. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**<br>**2016 අප්‍රේල් 07** | | |
| 1. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු. | පසුගිය වසර එකහමාරක කාලයක් තිස්සේ අධිකරණයේ පවතින නඩුවක් හේතුවෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇති බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය.<br>නීතිපති සමඟ සාකච්ඡා කර මේ සම්බන්ධයෙන් අධිකරණ කටයුතු කඩිනම් කිරීමට සුදුසු පියවර ගන්නා ලෙස ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී. |
| 2. | 2014 වන විට ගොවිපලවල් 05 ක් පාඩු ලබන තත්ත්වයක පැවතීම. | නියඟය හේතුවෙන් වගා කටයුතු සිදු නොකිරීම, තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර භාවිතා නොකිරීම , බීජ සැකසුම් කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති විම සහ ගබඩා පහසුකම් නොමැති වීම වැනි හේතූන් මත ගොවිපොළවල් 03ක් පමණක් කාරක පාඩු ලබන තත්ත්වයේ පවතින බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |
| 3. | කුණඩසාලේ, මිද්දෙණිය, අළුත්තරම, බටඅත හා කරදියනාරු ගොවිපලවල්වල හෙක්ටයාර් 903 කින් 275 ක් උපයෝජනය කර නොතිබීම සහ හෙක්ටරයාර 64 ක් ඌන සංවර්ධිත මට්ටමක පැවතීම | මෙම ගොවිපලවල් වල සංවර්ධන කටයුතුවල ප්‍රගතියක් වර්තමානයේ පවතින බව ප්‍ර.ග.නි/ග.නි පැවසීය. |
| 4. | කරදියනාරු ගොවිපොළට අයත් ඉඩම් අනවසර වගාකරුවන් විසින් භාවිතා කිරීම සහ මීපිලිමාන ගොවිපල භූමියේ හෙක්ටයාර් 30ක් පෞද්ගලික සමාගම් දෙකක් විසින් භාවිතා කිරීම. | කරදියනාරු ගොවිපලේ යුද්ධ සමයේ ගොවීන් අනවසරයෙන් පදිංචි වී සිටි බැවින්, එය පාඩු ලබන බව ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී.<br>එම ඉඩම් නිරවුල් කිරීමට පියවර ගන්නා ලෙස ප්‍ර.ග.නි. වෙත උපදෙස් ලබා දෙන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග |
|---|---|---|
| **ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව** **2016 අප්‍රේල් 07** | | |
| 1 | කාර්ය මණ්ඩල පුරප්පාඩු. | දීප ව්‍යාප්ත සේවය, ගණකාධිකාරී සේවය සහ ඉංජිනේරු සේවයෙන් පත්වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමුවීමේ ප්‍රවණතාවක් නොමැති බවත්, තුන්වන ශ්‍රේණියේ තනතුරු දරණ ගොවිජන සංවර්ධන නිලධාරීන් පළමුවන ශ්‍රේණියට උසස් වීම් ලබා ගත් පසු වෙනත් දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරු ලබා ගන්නා බවත් ප්‍ර.ග.නි. පැහැදිලි කළේය. |
| 2 | අපහරණයට හඳුනාගෙන තිබූ ට්‍රැක්ටර් 209 පිළිබඳ වර්තමාන තත්ත්වය. | අපහරණය සඳහා හඳුනාගෙන තිබුණු ට්‍රැක්ටර් රථ සහ යන්ත්‍ර සූත්‍රවල ලියාපදිංචි සහතික මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සතුව නොතිබීම හේතුවෙන්, එම කාර්යය සම්පූර්ණ කිරීමට නොහැකි වූ බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. |
| 3 | 2010 සහ 2012 වර්ෂවල බෙදා හරින ලද වාරික අය නොවන රෝද දෙකේ ට්‍රැක්ටර් 1824 ක් අදාළ පුද්ගලයන්ට සාධාරණ මිලකට ලබා දීමේ කටයුතු වල ප්‍රගතිය. | අදාල කැබිනට් පත්‍රිකාව සකස් කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුවන බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| 4 | ගොවිජන සේවා මධ්‍යස්ථානවල ගිණුම් 2006 වර්ෂයේ සිට විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබීම. | විගණන කටයුතු, දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය හරහා සිදු වන බව ප්‍ර.ග.නි. /ග.නි පැවසීය.<br><br>සියළුම ගොවිජන සේවා මධ්‍යස්ථාන විගණනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී.<br><br>ඉදිරි මාස දෙක ඇතුළත දිස්ත්‍රික්ක මට්ටමේ විගණන නිරීක්ෂණ ඒකක පිහිටුවීම සඳහා කටයුතු සිදු කිරීමට |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරීම් සහ කාරක සභාවේ අදහස් /නිර්දේශ/ නියෝග** |
|---|---|---|
| | | ප්‍ර.ග.නි/ග.නි විසින් එකඟතාවය පළ කරන ලදී. |
| 5 | රුපියල් මිලියන 251.6 වියදමක් දරණ ලද කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩ සටහනෙහි ප්‍රගතිය. | වැඩසටහන සාර්ථක ලෙස අවසන් වී ඇති බවත්, ඒ සඳහා ඇගයීම් කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බවත් ප්‍ර.ග.නි/ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| 6 | සියළුම ගොවි බැංකු වල පවතින ඉතිරි කිරිම් එක් ගිණුමකට බැර වන සේ සකස් කිරිම. | ඒ සඳහා අවශ්‍ය කටයුතු කිරීමට ප්‍ර.ග.නි/ග.නි එකඟතාව පළ කරන ලදී. |

ඇමුණුම - 1

**ප්‍රශ්නාවලිය -1**

**මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳ ඇගැයීම**
**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව**

**අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශීර්ෂය - ...............**
**අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :- .......................................**
**අමාත්‍යාංශයේ ලේකම්ගේ නම ..........................................  දූරකථන අංකය:- .................**
**විද්‍යුත් තැපැල් ලිපිනය .................................................................**
**දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ නම :- ................................  දූරකථන අංකය :- ..............**
**විද්‍යුත් තැපැල් ලිපිනය .................................................................**

| | **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට යොමු කරන ලද කාරණය** | **ආයතනය විසින් දෙන ලද පිළිතුර** | | | |
|---|---|---|---|---|---|
| **1.** | **ගිණුම් ඉදිරිපත් කිරීම** | 2015 මාර්තු 31 දින හෝ ඊට පෙර ඉදිරිපත් කර ඇත. | 2015 අප්‍රේල් 01 දින හෝ ඊට පසු 2015 දෙසැම්බර් 31 දින වන විට ඉදිරිපත් කර ඇත. | 2016 ජනවාරි 01 වන විටත් ඉදිරිපත් කර නැත. | අදාළ නොවේ |
| **1.1** | විසර්ජන ගිණුම2014 - | | | | |
| **1.2** | අදායම් ගිණුම් ........ - 2014 | | | | |
| | ආදායම් ගිණුම්.......... - 2014 | | | | |
| | ආදායම් ගිණුම් ..............- 2014 | | | | |
| **1.3** | රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය - 2014 | | | | |
| **1.4** | වාණිජ අත්තිකාරම් ගිණුම - 2014 | | | | |
| **1.5** | ගබඩා අත්තිකාරම් ගිණුම - 2014 | | | | |
| **1.6** | වාණිජ නොවන අත්තිකාරම් ගිණුම් 2014 - | | | | |
| **1.7** | ගනුදෙනු බේරා අවසන් කිරිමේ අත්තිකාරම් ගිණුම 2014 | | | | |
| **1.8** | අරමුදල් ගිණුම් | | | | |

| **2** | **පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම** | | | | | |
|---|---|---|---|---|---|---|
| | **ලේඛනයේ නම** | **අදාළ රෙගුලාසිය** | **යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ** | **පවත්වා තිබුණත්, ඒවා යාවත්කාලීන කර නොතිබුණි** | **පවත්වා නොතිබුණි** | **අදාල නොවේ** |
| **2.1** | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | | | | |
| **2.2** | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක 2/අයි ඒ අයි 2/2002 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **2.3** | පුද්ගල පඩිනඩි ලේඛනය | මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව | | | | |
| **2.4** | විගණන විමසුම් ලේඛනය | මුදල් රෙගුලාසි (1)452ප්‍රකාර | | | | |
| **2.5** | මුදල් පොත / සුළු මුදල් පොත | මුදල් රෙගුලාසි 446 ප්‍රකාර | | | | |
| **2.6** | දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 ප්‍රකාර | | | | |
| **2.7** | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 ප්‍රකාර | | | | |
| **2.8** | බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි (1)454ප්‍රකාරව | | | | |
| **2.9** | තොග පොත | මුදල් රෙගුලාසි 751 හා 763 ප්‍රකාරව | | | | |
| **2.10** | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව | | | | |
| **2.11** | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව | | | | |
| **2.12** | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 ප්‍රකාරව | | | | |
| **2.13** | ණය සහ අත්තිකාරම් ලේඛනය | 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (1) 09 ඡේදය ප්‍රකාරව | | | | |
| **2.14** | නිවාඩු පිළිබඳ ලේඛනය | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය ප්‍රකාරව | | | | |
| **3.** | **මූල්‍ය බලතල පැවරීම** | | | | | |
| | | | | | **ඔව්** | **නැත** |
| **3.1** | මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව ආයතනය තුල මූල්‍ය බලතල පැවරීමක් සිදු කර තිබේද? | | | | | |
| **3.2** | ඉහත 3.1 ට පිළිතුර ඔව් නම්, එම බලතල පැවරීම ආයතනයේ සංවිධාන සටහන අනුව සිදු කරන ලද්දේද? | | | | | |
| **3.3** | එම මූල්‍ය බලතල පැවරීම සිදු වූයේ එක් එක් ගනුදෙනුව සඳහා නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකුගේ පරීක්ෂාවට භාජනය වන ආකාරයටද? | | | | | |
| **3.4** | එම බලතල පැවරීම ආයතනයේ සන්නිවේදනය කර තිබේද? | | | | | |
| **4.** | **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය** | | | | | |
| | | | | වර්ෂය ආරම්භවිමට ප්‍රථම පිළියෙල කර ඇත. | වර්ෂය ආරම්භ වීමෙන් පසු මුල් මාස 06ක තුළපිළියෙල කර ඇත. | වර්ෂය ආරම්භ වී මාස 06 ප්‍රමාදයකින් පසු පිළියෙල කර හෝ පිළියෙල කර නොතිබුණි |
| **4.1** | **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම** | | | | | |
| | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණේද? | | | | | |
| **4.2** | **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම** | | | | | |
| | 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම. | | | | | |

| | | | | |
|---|---|---|---|---|
| **4.3** | **වාර්ෂික කාර්යසාධන වාර්තාව** | | | |
| | 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පිළියෙල කර විගණකාධිපති වෙත පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම. | ගිණුම් වර්ෂය අවසාන වී දින 150 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. ☐ | ගිණුම් වර්ෂය අවසාන වී දින 150 කට පසුව 2015 දෙසැම්බර් 31 දින අතර කාලයේ පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. ☐ | පිළියෙල කර නොතිබුණි ☐ |
| **4.4** | **අභ්‍යන්තර විගණනය** | | | |
| | | | ඔව් | නැත |
| 4.4.1 | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණේද? | | ☐ | ☐ |
| 4.4.2 | ඉහත පිළිතුර "ඔව්" නම්, ප්‍රධාන අභ්‍යන්තර විගණක මාණ්ඩලික ශ්‍රේණියක නිලධාරියෙක්ද? | | ☐ | ☐ |
| 4.4.3 | අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කර විගණකාධිපති වෙත අනුමැතිය සඳහා යොමු කළේද? | | ☐ | ☐ |
| 4.4.4 | අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේද? | | ☐ | ☐ |
| 4.4.5 | අභ්‍යන්තර විගණනය විසින් අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අඩුපාඩු/ දුර්වලතා/ වංචාවන්/ අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවයන්/ වත්කම් අවභාවිතය හා වත්කම්වල පැවැත්ම සම්බන්ධයෙන් කළමනාකරණ ය වෙත එම දුර්වලතාවන් පිළිබඳව දැණුවත් කර තිබුණේද? | | ☐ | ☐ |
| 4.4.6 | එම අභ්‍යන්තර විගණකගේ නිරීක්ෂණ සම්බන්ධයෙන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ක්‍රියාමාර්ග ගත්තේද? | | ☐ | ☐ |
| 4.5 | **විගණන හා කළමනාකරණ කමිටුව** | | | |
| 4.5.1 | විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර තිබුණේද? | | **ඔව්** ☐ | **නැත** ☐ |
| 4.5.2 | 2015 වර්ෂයේදී පවත්වා තිබුණු රැස්වීම් වාර ගණන කොපමණද? | රැස්වීම් වාර 04 ක් හෝ ඊට වැඩියෙන් පවත්වා තිබුණි. ☐ | රැස්වීම් වාර 2 ත් 03 ත් අතර ප්‍රමාණයක් පවත්වා තිබුණි. ☐ | රැස්වීම් වාර 01 ක් හෝ පවත්වා නැත. ☐ |
| | | රැස්වීම් වාර 04 කට හෝ ඊට වැඩියෙන් කැඳවා තිබුණි ☐ | රැස්වීම් වාර 02/03කට කැඳවා තිබුණි. ☐ | රැස්වීම් වාර 01 ක් හෝ කැඳවා නොතිබුණි ☐ |
| 4.5.3 | පවත්වා තිබුණු රැස්වීම් සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ (මහා භාණ්ඩාගාරයේ) නිලධාරීන් කැඳවා තිබුණේද? | ☐ | ☐ | ☐ |
| 4.5.4 | එම රැස්වීම් සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු කැඳවා තිබුණේද? | ☐ | ☐ | ☐ |
| 5 | **පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදන** | | | |
| 5.1 | 2015 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා වන ප්‍රතිපාදනය කොපමණද? | **පුනරාවර්තන** | **රු . මිලියන** | |
| | | **මූලධන** | **රු . මිලියන** | |
| 5.2 | 2015 දෙසැම්බර් 31 දින වන විට පාර්ලිමේන්තුව විසින් ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන සළසා තිබුණේද? | **ඔව්** ☐ | **නැත** ☐ | |

| | | | | |
|---|---|---|---|---|
| 5.3 | එසේ ප්‍රමාණවත් ප්‍රතිපාදන සළසා නොතිබුණු වැය විෂයයන් හා අතිරේක ප්‍රතිපාදන ලබා ගැනිම සඳහා මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කර ගැනිම සිදු කලේද? | ඔව් ☐ | නැත ☐ | |
| 5.4 | ඉහත 5.3 ට පිළිතුර ඔව් නම් එසේ ලබා ගන්නා ලද වැය විෂයයන් ගණන හා මාරු කරගත් ප්‍රතිපාදන ප්‍රමාණයේ එකතුව සඳහන් කරන්න | ප්‍රතිපාදන ලබා ගන්නා ලද වැය විෂයයන් ගණන | | |
| | | ලබා ගන්නා ලද මුළු ප්‍රතිපාදන | රු. | |
| 5.5 | වීරමන් පරිපාටියෙන් ලබාගත් ප්‍රතිපාදනවලින් උපයෝජනයන් කළ ප්‍රමාණය හා එහි ප්‍රතිශතය කුමක්ද? | උපයෝජනය කළ මුළු ප්‍රතිපාදනය | රු . | |
| | | ලබා ගන්නා ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ ප්‍රතිශතය | | |
| 5.6 | 2015 වර්ෂය සඳහා ශීර්ෂ 240 වැඩසටහන 2 යටතේ පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතියෙන් ප්‍රතිපාදන ලබා ගත්තේද? | ඔව් ☐ | නැත ☐ | |
| 5.7 | ඉහත දැක්වෙන පරිදි 5.1 සිට 5.5 දක්වා ලබාගෙන තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයද ඉක්මවා අතිරික්තයන් සිදු කර තිබුණේද? | ඔව් ☐ | නැත ☐ | |
| 5.8 | 2015 වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබුණු නමුත්, කිසිදු උපයෝජනයක් නොකර තිබුණු වැය විෂයයන් ගණන හා ඉතිරි වී තිබුණු මුළු ප්‍රතිපාදනය | වැය විෂයයන් ගණන | | |
| | | මුළු ප්‍රතිපාදනය | රු.මිලියන | |
| | | සමස්ථ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස | | |
| 5.9 | 2015 වර්ෂය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 25 කට වැඩියෙන් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු වැය විෂයයන් ගණන හා මුළු ප්‍රතිපාදනය | වැය විෂයයන් ගණන | | |
| | | ඉතිරි වූ මුළු ප්‍රතිපාදනය | රු. මිලියන | |
| | | සමස්ථ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස | | |
| 6 | **ආදායම් ගිණුම්** | | | |
| 6.1 | 2015 වර්ෂය සඳහා රැස්කිරිම සඳහා දෙපාර්තමේන්තුවට පැවරි තිබුණු ආදායම් සංකේත ගණන සඳහන් කරන්න . | **රු. මිලියන ................** | | |
| 6.2 | එක් එක් ආදායම් සංකේතය යටතේ 2015 වර්ෂයට රැස්කිරිමට ඇස්තමේන්තු කළ මුළු ආදායම කොපමණද? | **රු. මිලියන ................** | | |
| 6.3 | 2015 දෙසැම්බර් 31 දින වන විට රැස්කර තිබුණු මුළු තථ්‍ය ආදායම කොපමණද? | **රු. මිලියන ................** | | |
| 6.4 | 2015 වර්ෂයේදී රැස් කිරිමට නොහැකි වූ ඇස්තමේන්තු ගත ආදායම කොපමණද? | **රු. මිලියන ................** | | |
| 6.5 | 2015 වර්ෂයේදී ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා රැස්කළ ආදායම ඇස්තමේන්තුගත ආදායමෙන් කුමණ ප්‍රතිශතයක් ගෙන තිබුණේද? | සියයට 100 ක් හෝ ඊට වැඩි ☐ | සියයට 75කට වැඩි සියයට 99 කට අඩු ☐ | සියයට 74 කට අඩු ☐ |
| 6.6 | 2015 වර්ෂය අවසාන වන විට හිඟහිටි ආදායම කොපමණද? | **රු. මිලියන ................** | | |
| 6.7 | ආදායම් ආපසු ගෙවීම් සිදු කර තිබුණේද? | **ඔව්** ☐ | **නැත** ☐ | **අදාළ නොවේ** ☐ |
| 6.8 | ඉහත 6.7 ඡේදය අනුව ආදායම් ආපසු ගෙවා ඇත්නම් එහි වටිනාකම කුමක්ද? | **රු. මිලියන ................** | | |

| | | ඔව් | නැත | අදාළ නොවේ |
|---|---|---|---|---|
| 6.9 | එසේ ආදායම් ආපසු ගෙවීම සිදු කර තිබුණේ පනතේ විධිවිධානවලට අනුකූලවද? | | | |
| 6.10 | එම ආදායම් තැන්පත් ගිණුමේ රඳවා නොගෙන ආදායම් ගිණුමට බැර කරන ලද්දේද? | | | |
| 6.11 | මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව ආදායම් සංකේතවලට අදාල අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර තිබුණේද? | | | |
| 6.12 | අයවැය වර්ගීකරණයට ඇතුළත් වී නැති වෙනත් ආදායම් එකතු කරනු ලබන්නේද? | | | |
| 6.13 | 6.12 හි සඳහන් ආදායම්වලින් විවිධ ගෙවීම් සිදු කර නොතිබුණේද? | | | |
| 6.14 | භාණ්ඩාගාරයෙන් හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව 6.12 හි සඳහන් රැස්කරනු ලබන ආදායම්වලින් කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම් කර නොතිබුණේද? | | | |
| 6.15 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149ව්‍යවස්ථාවට පටහැනි නොවන පරිදි ආදායම් රැස්කර තිබේද? | | | |
| 6.16 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාව 149 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර නොකර එම ආදායම් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙ නොතිබුණේද? | | | |
| 6.17 | එසේ ලැබී තිබුණු ආදායම් භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව දෙසැම්බර් දින වන 31 දින විට භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම වැලැක්වීමට ආයතනය විසින් ඍජුවම ආයෝජනවල යොදවා නොතිබුණේද? | | | |
| 6.18 | ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතියක් ලබා ගෙන තිබේද? | | | |
| 7 | **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්** | | | |
| | | ඔව් | නැත | අදාළ නොවේ |
| 7.1 | අදාල අත්තිකාරම් කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් පිළිපැද තිබුණේද? | | | |
| 7.2 | 2015 වර්ෂය අවසාන වන විට එම සීමාවන් පිළිපැද නොමැති නම් 2015 අංක 1 දරන විසර්ජන පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව අත්තිකාරම් සීමා සංශෝධනය කර ගනු ලැබුවේද? | | | |
| 7.3 | හිඟහිටි ණය ශේෂවල කාල විශ්ලේෂණයක් සකස් කර තිබේද? | | | |
| 7.4 | වර්ෂ 3 කට වැඩි කාලයක සිට හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු සිදු කර තිබේද? | | | |
| 8 | **වාණිජ අත්තිකාරම් ගිණුම්** | | | |
| 8.1 | පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් ඇතුළත අත්තිකාරම් කාර්ය පවත්වා තිබුණේද? | ඔව් | නැත | අදාළ නොවේ |

| | | | | |
|---|---|---|---|---|
| 8.2 | පසුගිය වර්ෂය සඳහා වාණිජ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් ලබා දී තිබුණු විගණන මතය කුමක්ද? | පැහැදිලි මතය ☐ | කොන්දේසි සහිත මතය ☐ | මතය ව්‍යාවනය කිරීම/ අහිතකර මතය ☐ |
| | | **ඔව්** | **නැත** | **අදාළ නොවේ.** |
| 8.3 | අත්තිකාරම් කාර්ය තුළින් දිගින් දිගටම බලය නොලත් කාරක පාඩු සිදු වී තිබුණේද? | ☐ | ☐ | ☐ |
| 8.4 | එම කාරක පාඩු කපා හැරීමට කටයුතු කලේද? | ☐ | ☐ | ☐ |
| 8.5 | අත්තිකාරම් කාර්ය තුළ දිගින් දිගට පවත්නා හිඟහිටි ණය ශේෂ පැවැතියේද? | ☐ | ☐ | ☐ |
| 8.6 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර තිබුණේද? | ☐ | ☐ | ☐ |
| 8.7 | නිරවුල් නොවී දිගින් දිගටම පවත්නා බැරකම් ශේෂ පැවැතියේද? | ☐ | ☐ | ☐ |
| 8.8 | බැරකම්වල කාල විශ්ලේෂණයක් පිළියෙල කර තිබේද? | ☐ | ☐ | ☐ |
| 9 | **ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම** | | | |
| | | | | අදාළ නොවේ. |
| 9.1 | මෙම කාර්ය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේ කවදාද? | දිනය - | | ☐ |
| 9.2 | අමාත්‍ය මණ්ඩලය විසින් එම කාර්ය පවරා කොපමණ කාලයක් ගතවී තිබුණේද? | වර්ෂ - | | ☐ |
| 9.3 | අමාත්‍ය මණ්ඩලය විසින් පවරා ඇති කාර්ය අවසන් කිරීම සඳහා බලපා ඇති කරුණු මොනවාද? | බලය නොළත් කාරක පාඩු කපා හැරීමට කටයුතු නොකිරීම | | ☐ |
| | | වත්කම් සම්බන්ධයෙන් නෛතික කටයුතු නිම නොවීම | | ☐ |
| | | අවශ්‍ය තොරතුරු නොතිබීම | | ☐ |
| 9.4 | ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුමට අදාල අනුමත නොකළ සමුච්චිත කාරක පාඩු එකතුව කොපමණද? | රු.මිලියන ............................ | | |
| 10 | **අරමුදල් ගිණුම්** | | | |
| 10.1 | අරමුදල ස්ථාපිත කරන ලද්දේ? | 1971 අංක 38 දරන මුදල් පනතේ 25 හා 26 වගන්ති අනුව | | |
| | | 1977 අගෝස්තු 16 දිනැති අංක 836 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව | | |
| | | පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන පනතක් අනුව | | |
| 10.2 | එම අරමුදල් ඇති කිරීමේදී අපේක්ෂා කළ ප්‍රධාන අරමුණු කුමක්ද? | ............................................<br>............................................ | | |
| | | **ඔව්** | **නැත** | **අදාළ නොවේ.** |
| 10.3 | එම අරමුදල් උපයෝජනය කර කාර්ය මණ්ඩලවලට පාරිශ්‍රමික ගෙවීම් සිදු කරමින් පවතිද? | ☐ | ☐ | ☐ |
| 10.4 | අරමුදලේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය කුමක්ද? | | | |
| 10.5 | අරමුදල ස්ථාපිත කිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර තිබේද? | ☐ | ☐ | ☐ |

| | | | | |
|---|---|---|---|---|
| 10.6 | වර්තමානයේදි එසේ ස්ථාපිත කර තිබුණු අරමුදල් අක්‍රිය වී තිබේද? | ☐ | ☐ | ☐ |
| 10.7 | එම අක්‍රියවි තිබුණු අරමුදල්වල, මුදල් ඇතුළු විවිධ වත්කම්වල වර්තමාන තත්ත්වය කුමක්ද? | රාජ්‍ය ආයතන විසින් පරිහරණය කරනු ලබයි. | | ☐ |
| | | රාජ්‍ය නොවන වෙනත් පාර්ශවයන් විසින් පරිහරණය කරනු ලබයි | | ☐ |
| | | නිෂ්ක්‍රීයව පවතී | | ☐ |
| 11 | **අග්‍රිම ගිණුම්** | | | |
| 11.1 | වසර ගණනාවක් මුළුල්ලේ නිරවුල් නොවී පවතින අග්‍රිම ගිණුම්වල නිරවුල් නොකළ ශේෂවල එකතුව කුමක්ද? | රු.මිලියන ...................................... | | |
| 11.2 | අග්‍රිම ගිණුම්වල 2014 දෙසැම්බර් 31 දිනට පැවැති ශේෂය නිරවුල් කළ ආකාරය | 2014.12.31 දින නිරවුල් කිරිම ☐ | 2015 ජනවාරි 01 දින සිට 2015 අප්‍රේල් 30 දින වන විට නිරවුල් කිරිම ☐ | 2015 මැයි 01 දින හෝ ඊට පසු නිරවුල් කිරිම/ නිරවුල් නොකිරීම ☐ |
| 11.3 | මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණත්, එම අත්තිකාරම් නිරවුල් කිරිම | කාර්ය නිම කළ වහාම නිරවුල් කිරිම ☐ | 2015 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර නිරවුල් කිරිම ☐ | නිරවුල් නොකිරිම ☐ |
| | | **ඔව්** | **නැත** | **අදාළ නොවේ.** |
| 11.4 | මුදල් රෙගුලාසි ප්‍රකාරව අනුමත 371 සීමාව ඉක්මවාතත්කාර්ය අතුරු අග්‍රිමයන් නිකුත් කරන ලද්දේ භාණ්ඩාගාරයේ අනුමැතිය මතද? | ☐ | ☐ | ☐ |
| 11.5 | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් සසදා තිබුණේද? | ☐ | ☐ | ☐ |
| 11.6 | ආයතනයේ මාසික මුදල් ප්‍රවාහය සැලැසුම් කර පිළියෙල කර භාණ්ඩාගාරයේ මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණේද? | ☐ | ☐ | ☐ |
| 11.7 | ආයතනය විසින් භාණ්ඩාගාරයෙන් ඉල්ලා තිබුණු අග්‍රිමයන් අඩුවෙන් ලබා දුන් විට එම වියදම් සිදු කළ ආකාරය සඳහන් කරන්න. | වියදම් සිදු නොකිරීම | | ☐ |
| | | සැපයීම් හා සේවා කල්දැමීමෙන් | | ☐ |
| | | **සැපයුම් හා සේවා ඉටු කර ගෙන බැරකම්වලට එළඹීමෙන්** | | ☐ |
| | | වෙනත් | | ☐ |
| 12 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 12.1 | ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන පොදු තැන්පත් ගිණුම් ගණන කොපමණද, | **ගිණුම් සංඛ්‍යාව .....................** | | |
| 12.2 | ඒවායේ ශේෂ එකතුව කොපමණද, | **රු.මිලියන .....................................** | | |
| | | **ඔව්** | **නැත** | **අදාළ නොවේ** |
| 12.3 | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කල් ඉකුත් වු තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර තිබේද? | ☐ | ☐ | ☐ |

| | | | | |
|---|---|---|---|---|
| 12.4 | විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් ඉටු කිරීම සඳහා එවා ඇති මුදල් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබේද? | | | |
| 12.5 | විවිධ කාර්යයන් ඉටු කර ගැනීමට වෙනත් රාජ්‍ය ආයතන විසින් ආයතනය වෙත්පත් එවා තිබුණේද? | | | |
| 12.6 | මුදල් රෙගුලාසි 215 ප්‍රකාරව වැය ගිණුම හර කර තැන්පත් ගිණුමට බැරකරන ලද වටිනාකම කොපමණද? | **රු.මිලියන ................................** | | |
| 13 | වත්කම් කළමනාකරණය | | | |
| 13.1 | නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම් | **ඔව්** | **නැත** | **අදාළ නොවේ** |
| 13.1.1 | ආයතනය සතු වත්කම් නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිතව පවතින්නේද? | | | |
| 13.2 | **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම** | | | |
| 13.2.1 | 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එසේ කටයුතු කර තිබුණේද? | 2015 මාර්තු 17 දිනට පෙර අවසන් කර ඇත. | 2015 මාර්තු 18 දින සිට 2015ජුනි 30 දින වන විට අවසන් කර තිබීම | සමීක්ෂණය 2015 ජුලි 01 දින වන විටත් සිදු කර නොතිබීම |
| | | ඔව් | නැත | අදාළ නොවේ. |
| 13.3 | වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කර තිබුණේද? | | | |
| 13.4 | පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කර තිබේද? | | | |
| 13.5 | වාහන පාලනය | | | |
| 13.5.1 | ආයතනය සතු වාහන කොපමණ සංඛ්‍යාවක් තිබේද? | | ................................................... | |
| 13.5.2 | ධාවන තත්ත්වයේ නොමැති වාහන ගණන :- | | ................................................... | |
| 13.5.3 | වාහන සඳහා වියදම - 2015 වර්ෂය | අළුත්වැඩියා වියදම | රු.මිලියන | ........... |
| | | සේවා කිරීම් | රු.මිලියන | ........... |
| | | ඉන්ධන | රු.මිලියන | ........... |
| | | ටයර් හා ටියුබ් | රු.මිලියන | ........... |
| | | මුළු වියදම | රු.මිලියන | ........... |
| 13.5.4 | 2015 වර්ෂයේ ආයතනයේ වාහන සියල්ල ධාවනය කළ කිලෝ මීටර ගණන | | කිලෝ මීටර් .......................... | |
| 13.5.5 | අනුයුක්ත කර ඇති රියදුරන් ගණන | | රියදුරන් .......................... | |
| 13.5.6 | ආයතන භූමියේ ඇති ගර්භිත වාහන සංඛ්‍යාව | | වාහන .......................... | |
| 13.5.7 | වාහන දීමනාව මුදලින් ලබන නිලධාරීන් ගණන? | | ........................................ | |

| | | ඔව් | නැත | අදාළ නොවේ |
|---|---|---|---|---|
| 13.5.8 | වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 සිට 110 දක්වා රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර තිබේද? | ☐ | ☐ | ☐ |
| 14 | බැරකම් | | | |
| | | ඔව් | නැත | අදාළ නොවේ |
| 14.1 | මුදල් රෙගුලාසි 94(2) හා 94(3) යටතට නොගැනෙන බැරකම්වලට එළඹුනේ ඉදිරි වර්ෂයේදී ඒ සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට සැලැසුම් කරගෙනද? | ☐ | ☐ | ☐ |
| 14.2 | ව්‍යවස්ථාපිත බැදීම් තිබේද? | ☐ | ☐ | ☐ |
| 15 | විදේශාධාර ව්‍යාපෘති | | | |
| | | | | අදාළ නොවේ |
| 15.1 | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව විසින් විදේශ මූල්‍යණය යටතේ ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති ගණන කොපමණද? | | .............................. | ☐ |
| 15.2 | විදේශාධාර ව්‍යාපෘතියේ / ව්‍යාපෘතිවල කාර්ය සාධනය විදේශාධාර ව්‍යාපෘතිවල මූල්‍ය කාර්යසාධනය හා භෞතික කාර්යසාධනය ඉදිරිපත් කරන්න. | | මූල්‍ය ප්‍රගතිය සියයට | ☐ |
| | | | භෞතික ප්‍රගතිය සියයට | ☐ |
| 15.3 | විදේශාධාර ව්‍යාපෘතිවල ඇතුළත් සමහර ක්‍රියාකාරකම් අතහැර දැමීම | ව්‍යාපෘති ගණන | | ................ |
| | | අතහැර දැමූ ක්‍රියාකාරකම් ගණන | | ................ |
| 15.4 | ව්‍යාපෘති ගිණුම්වල වූ මුදල් ශේෂ<br>ව්‍යාපෘති නිම කිරීමෙන් පසු එම ව්‍යාපෘති බැංකු ගිණුම්වල ඉතිරි වූ මුදල් නිෂ්ක්‍රියව රඳවා තිබුණේනම් එම මුදල | | රු.මිලියන ...................... | |
| 15.5 | ව්‍යාපෘති මුදල් උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණේද? | ඔව් ☐ | නැත ☐ | අදාළ නොවේ ☐ |
| 15.6 | එසේ රඳවාගත් තැන්පතුවල වටිනාකම කොපමණද? | | රු.මිලියන ...................... | |
| 15.7 | ව්‍යාපෘතිය නියමිත දින ආරම්භ නොකිරීම | | | |
| 15.7.1 | ණය ගිවිසුමේ හෝ ව්‍යාපෘති ගිවිසුමේ ඇතැම් අවස්ථාවලදී ගිවිසුමේ සඳහන් කාල වකවානු ඇතුළත ව්‍යාපෘතිය ආරම්භ කළ යුතු වුවත්, එසේ නොකිරීම නිසා රජය විසින් එම ණය ප්‍රදානය කරනු ලබන රට හෝ ආයතනය වෙත ලබා ගත් ණය ප්‍රමාණයට අනුපාතයක් ලෙස දණ්ඩන ගෙවා තිබුණේද? | ඔව් ☐ | නැත ☐ | අදාළ නොවේ ☐ |
| 15.7.2 | එහි වටිනාකම? | රු.මිලියන ...................... | | |
| | | ඔව් | නැත | අදාළ නොවේ |
| 15.8 | ව්‍යාපෘතියේ වත්කම් ඌන උපයෝජනය/ නිෂ්ක්‍රියව පැවැතිම<br>ව්‍යාපෘති වියදමෙන් අත්පත් කර ගෙන තිබුණු ගබඩා භාණ්ඩ, වත්කම්, ඉඩම්, වාහන හා යන්ත්‍රෝපකරණ නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව හෝ ගබඩාවල පැවැතීමට ඉඩ සළසා දී තිබුණේද? | ☐ | ☐ | ☐ |

| | | | | |
|---|---|---|---|---|
| 15.9 | **රදවාගත් ව්‍යාපෘති මුදල්**<br>ණය ගිවිසුම් අනුව පොලී ගෙවීමේ පදනම මත ලබාගත් ණය මුදල් ඒවා උපයෝජනය නොකර බැංකු ජංගම ගිණුම්වල නිෂ්කාර්යව රඳවා ගෙන තිබීම නිසා එම කාලයට විදේශ ණයලාභීන්ට ගෙවීමට සිදු වී තිබුණු පොලිය කොපමණද? | ☐ | ☐ | ☐ |
| 15.10 | එම රඳවා ගත් මුදල් කුමණ කාලයක සිට පැවැත එන්නේදැයි සඳහන් කරන්න. | වර්ෂ ......................... | | |
| | | ඔව් | නැත | අදාළ නොවේ |
| 15.11 | **ව්‍යාපෘති නිම කිරීමෙන් පසු ප්‍රතිලාභ**<br>ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු එහි ප්‍රතිලාභ ජනතාවට ලැබී තිබේද, වැය කළ මුදල හා ලබා ගන්නා ප්‍රතිලාභ පිළිබඳ ව්‍යාපෘතිය පිළිබඳ පසුවිපරම් කර තිබේද? | ☐ | ☐ | ☐ |
